ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



පසළොස් වසරකට පෙර සලාපුර රදගුරු හිමිපාණන් පළ කළ අදහස්

**නොරොච්චෝලෙන් විදුලියවත් නෑ**

3 පිටුව



**සුවදානයට අද තේවත්තට එන්න**

සාමුහික සුවදානයේ දේව වරප්‍රසාදයෙන් පරිපූර්ණ වන්නට සැදැහැ ජනතාවට ඇරියුමක්

8 පිටුව



දේශීය හා විදේශීය ආර්ථික අංශ වෙත කිතුනු ඇස යොමුකරන නවතම මාසික විශේෂාංගය

**ප්‍රදීපය ආර්ථික සංග්‍රහය**

13 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07





තේවත්ත වාර්ෂික සුවදානයේ මෙහෙය අදයි


ක්‍රි.ව. 2012 ක් වූ අගෝස්තු 26 ඉරිදා 147 වෙළුම 13 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## සමිඳු සසුන් කෙතේ ස්වර්ණ ජයන්තිය සමරන පූජක පුතුන් පස් නමක්

**කොළඹ අගරදගුරු වසමෙන් පූජක පුතුන් තෙනමක්**



ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා



ගරු ජෝශප් බෙනඩික් ප්‍රනාන්දු පියතුමා




ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමා

**හලාවත රදගුරු වසමෙන් පූජක පුතුන් දෙනමක්**



ගරු ජෝ. පෝල් ප්‍රනාන්දු පියතුමා



ගරු මයිකල් ලුසේනා පියතුමා

### අගරදගුරු වසමේ දිව්‍ය සත්ප්‍රසාද රැළිය හා ප්‍රදර්ශනය ගැන

# කතෝලික සැදැහැවතුන් තුළ විශාල පිබිදීමක්!

**දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වෙනුවෙන් කැපකළ දස වසර අරුත් ගන්වමින් කොළඹ අගරදගුරු වසමේ දිව්‍ය සත්ප්‍රසාද රැළිය හා ප්‍රදර්ශනය අගෝස්තු 31 වැනිදා සිට සැප්තැම්බර් 02 දක්වා කොළඹ සාන්ත ජෝශප් විදුහලේ දී පැවැත්වීමට භාග්‍යවන්ත ජුසේවාස් භාරය කටයුතු පිළියෙළ කරමින් සිටී. මේ පිළිබඳව සැදැහැවතුන් තුළ විශාල පිබිදීමක් මතුව තිබේ.**



"දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මිහිපිට ඇති ස්වර්ගීය රසය වේ" යන තේමාව ඔස්සේ දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව, දිව්‍ය පූජාව, දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය, භක්ති ගී, සංගීත ප්‍රසංග ආදියෙන් ද "දෙවිඳුන්ගේ ඇරියුම ඔබට ද" තේමා කරගත් පැවදි නිකායයන් 45 කගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන ප්‍රදර්ශනය, දිව්‍ය සත්ප්‍රසාදයීය ප්‍රාතිහාර්යයන් හා ගිහි දූත සේවා විදහා දක්වන ප්‍රදර්ශන කුටි වලින් ද සමන්විත වේ. ඒවා ස්ටැන්ලි අබේසේකර ශ්‍රවණාගාරයේ පැවැත්වේ.

අගෝස්තු 31 සිකුරාදා පෙ.ව. 8.00 ට අගරදගුරු පදවි සහයක රදගුරු හිමිපාණන් අතින් පිදෙන දිව්‍ය යාගයෙන් වැඩසටහන ආරම්භ වන අතර සැප්තැම්බර් 02 ඉරිදා කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැළිය අවසානයේ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පැවැත්වේ. (සම්පූර්ණ වැඩසටහන් විස්තරය 15 පිටුවේ පළවේ)

## නවෝදයක් ඇතිකිරීම අරමුණු කරගත් සලාපුර පදවි දහම් කතිකාවත

ලිඩ්වින් කිරිඇල්දෙණිය

ආධ්‍යාත්මික පිබිදීමකින් හලාවත පදවියේ නවෝදයක් ඇතිකිරීම අරමුණු කොටගත් හලාවත පදවි දහම් කතිකාවත ඉකුත් සඳුදා තලවිල සා. ආනා ජාතික සිද්ධස්ථානයේ දී මහෝත්සවයෙන් ආරම්භ විය.



(සේයා - ගරු නිරෝෂන් ශ්‍රීකාන්ත පියතුමා)

හලාවත රදගුරු අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති සමාරම්භක උත්සවයට මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු හා බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් දි.ස.නි. හිමිපාණෝ ද සහභාගි වූහ. විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස්, අගරදගුරු පදවි සහයක අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ ද මෙහෙයුම් මඬුලු සාමාජිකත්වයෙන් කතිකාවතට දායකත්වය සැපයූහ.

15 පිටුවට ▶

## ලත්පඳුර ස්වර්ගාරෝපිත මංගල්ලෙට පිට පළාත් වලින් සැදැහැ ගඟ ගලයි

ඇන්ටන් ජයසූරිය

වන්දනා ගමන් ගියාට මදි. කිතුනු ගුණාංග ලෝකයට බෙදා දෙමින් දෙවියන් වහන්සේ කෙරෙහි සැබෑ ලෙස විශ්වාස කරමින් යහපත් දිවි පෙවෙතක් ගත කිරීමට අදිටන් කරගත යුතු යැයි බදුල්ල පදවි විවාහ අධිකරණයේ ගරු ජූඩ් නිශාන්ත සිල්වා පියතුමා මහවැලි සී කලාපයට අයත් දෙහිඅත්තකණ්ඩිය ලත්පඳුර සාන්ත මරියා සිද්ධස්ථානයේ වාර්ෂික මංගල සන්ධ්‍යා මෙහෙයේ දී පැවසීය.

මංගල්‍ය දිව්‍ය යාගය බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මංගල දිව්‍ය යාගය සඳහා මාවතගම ලත්පඳුර විහාරස්ථානවල ස්වාමින් වහන්සේ පැමිණ සිටියහ. එහි දී කෙටි අනුශාසනාවක් කළ වාවනාගම හිමි රටේ සාමයට අවශ්‍ය ආගමික සුහදතාවයේ ඇති වැදගත්කම පෙන්වා දුන්නේ ය.

මෙවරත් මංගල්‍යය සඳහා උස්වැටකෙයියාව, බෝපිටිය ඇතුළු විවිධ ප්‍රදේශ වලින් බැතිමතුන් සහභාගි වූ අතර මංගල්‍ය කටයුතු මීසම් සේවක ගරු ඉග්නේෂස් සේනානායක පියතුමාගේ අනුශාසකත්වයෙන් මීසම් ධර්ම සේවා සභාව මනාව සංවිධානය කර තිබිණි.

## ඇති හැකි මීසම්වලට නැතිබැරි දෙව්මැඳුරු වලින් ආරාධනා!

කොළඹ අගරදගුරු වසමේ විමධ්‍යගත වැඩසටහන යටතේ ආර්ථිකමය අතින් පූර්ණත්වයට පත් නොවූ මීසම්වල ඇති අනුබද්ධ දේවස්ථාන සෙසු සවිමත් සංඝයන් හා මීසම් සමඟ සබඳතා ගොඩනගා ගැනීමේ වැඩසටහනක් දියත් කිරීමට කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ඇරියුම් කර සිටිති.

මේ වැඩසටහන යටතේ ග්‍රාමීය පෙදෙස්වල තනිවූ කතෝලික සභාවන්, දෙව්මැඳුරු හා සංඝයන් වෙත හුදු ආර්ථික උපකාර පමණක් නොව, ආධ්‍යාත්මික හා ශීලධාර්මික සහයෝගිතාවයෙන් බැඳෙන්නට වඩාත් ශක්තිමත් මීසම්වලට ඇරියුම් කැරේ.

විශේෂයෙන් නැගෙනහිර කලාපයේ -

15 පිටුවට ▶

## රජත ජයන්ති වසර ප්‍රකාශයට පත් කැරේ

දොමිනිකන් පැවදි සොයුරියන්ගේ ධර්මදූතික සේවාවන් කුරුණෑගල පදවිය තුළ අරඹා ලබන වසරට (2013 අප්‍රියෙල් 03 දිනට) වසර විසි පහක් පිරීම නිමිත්තෙන් ජුබිලි වසර ප්‍රකාශයට පත් කිරීම මැල්සිරිපුර සිරිහඳ දේවස්ථානයේ පැවැති ශු. දොමිනික් මුනිතුමන්ගේ ජන්ම දිනය සැමරීම දේව මෙහෙයේදී ඇතුගල්පුර විශ්‍රාමික රදගුරු අති උතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් විසින් සිදුකරන ලදි.

**(නිමල් ඒ. අල්මේදා)**

## තේවත්තේ සුවදාන මෙහෙය ගුවන් විදුලියේ

තේවත්ත ජාතික බැසිලිකා පුදබිමේ අද පැවැත්වෙන වාර්ෂික සුවදාන මෙහෙය සජීවිව ස්වදේශීය සේවයෙන් අද ප.ව. 2.30 ට විකාශනය වේ.

## තරුණ කතෝලික නව සභාපති සබරගමුවෙන්



ශ්‍රී ලංකා කතෝලික තරුණ සංගමයේ නව ජාතික සභාපති ලෙස රත්නපුර පදවියේ ලක්ෂාන් ගුරුසිංහ මහතා ඉකුත් දා පැවති නිලවරණයේ දී වැඩි ඡන්දෙන් තෝරා පත් කර ගැනිණි. **(තියබෝල්ඩ් සමරතුංග)**

## ඇතුගල්පුර තරුණ දිනය

කුරුණෑගල පදවි තරුණ රැළිය 2012 සැප්තැම්බර් 01 වන දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කුලියාපිටිය "සත්පහන" ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. කුරුණෑගල රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් රත්නපුර රදගුරු, ජාතික තරුණ කටයුතු භාර අති උතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි. හිමිපාණන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ. කුරුණෑගල පදවි තරුණ කටයුතු අධ්‍යක්ෂ ගරු ආනන්ද වීරකෝන් පියතුමාගේ අනුශාසකත්වයෙන් පදවි තරුණ සංගමය මෙය සංවිධානය කරයි.

**(ලක්රුවන් ජයසංබ)**

**"අපගේ දෙවියන් වන සමිඳාණන් වහන්සේට වැඳුම් පිදුම් කරන්න" (ජොෂුවා 24:21)**

පදවියෙන් පදවියට

# අසාධාරණයට එරෙහිව නැගී සිටීමට කිතුනුවාට කැඳවීමක් ලැබී තිබෙනවා

## ගාල්ල රදගුරු හිමිපාණෝ මඩු සිද්ධස්ථානයේදී පවසති

කතෝලික අපේ පරම යුතුකම හා වගකීම වන්නේ සමාජයේ සිදුවන අකටයුතුකම් අසාධාරණකම් ඉදිරියේ ඒවාට එරෙහිව හඬ නැගීම හා පෙනී සිටීමයි. ඒ වෙනුවෙන් සමහර විට අපගේ ජීවිතයෙන් පවා වන්දි ගෙවීමට සිදුවිය හැකි අතර ක්‍රිස්තුන් වහන්සේ සිය ජීවිතය පූජා කළේද අන් අය වෙනුවෙන් බැව් අප අමතක නොකළ යුතු අතර කිතුනු ජනතාවක් ලෙස අප කැඳවා ඇත්තේද අසාධාරණයට එරෙහිව නැගීසිටීමට අවශ්‍ය වුවහොත් අන් අය වෙනුවෙන් තම ප්‍රාණය වුවද පරිත්‍යාග කිරීමටයැයි මඩු සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යයේදී ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ ප්‍රකාශ කළහ.

සිරිලක දසදෙසින් එක්වූ ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසක් මංගල උලෙළට සහභාගි වූහ. ජනතාව සඳහා පහසුකම් සපයා තිබිණි.

තිළිණ අලහකෝන්



කුරුණෑගල විශ්‍රාමික රදගුරු අතිඋතුම් රේමන්ඩ් පීරිස් හිමිපාණන් පූජක වරය ලබා වසර 54 පිරීම, රදගුරු වරයේ රජත ජයන්තිය හා 80 වැනි ජන්ම දිනය සමරා එතුමන්ගේ උපන්ගම වන කලඑළිය ග්‍රාමයේ ජනතාව විසින් උපහාර උලෙළක් පවත්වන ලදී. කලඑළිය සා. ජුවකීනු මුනිඳුන්ගේ දෙව්මැඳුරේ පැවැති තුති පිදීමේ දිව්‍ය පූජාවට රදගුරු හිමිපාණන් කැඳවාගෙන පැමිණි අයුරු.

ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා

## මීගහතැන්න මංගල උලෙළ

මතුගම මීසමට අයත් මීගහතැන්න ශුඩවූ කාර්මල් දේව මාතාවන්ගේ වාර්ෂික මංගල්‍යය පසුගියදා පැවැත්වුනි.

වර්ෂාව මධ්‍යයේ බහුතර අන්‍යාගමික ප්‍රදේශයක විශාල පිරිසක් මංගල මෙහෙයට පැමිණ සිටියහ.

මතුගම මීසම් සේවක ගරු අසංක දෙව්ෂාන් පියතුමාගේ මඟපෙන්වීමෙන් පැවදි සොයුරියන්ගෙ සහයද මතුගම මීසමට අයත් සැදැහැවතුන්ගේ සහයෝගයද නොමඳව ලැබිණි.

අර්වින් කැෂ්මියර්

## දේව මාතා ස්වර්ගාරෝපණය නූතන සමාජයට ආදර්ශයක්

දේවමාතාවන් ස්වර්ගරෝපණය දක්වා ගිය ගමන බලාපොරොත්තු විරහිත ජීවිතයකට මුහුණදී ගැටළු ඔස්සේ දේව රාජ්‍ය සොයා යාමේ මාර්ගය අපට පෙන්වා දෙන්නේ යැයි රත්මලාන සා. මරියා දෙව්මැඳුරේ වාර්ෂික මංගල දිව්‍ය පූජාවේදී කොළඹ සා. ජෝශප් විදුහල් ආචාර්ය මණ්ඩලයේ ගරු ගැමුණු ඩයස් පියතුමා පැවසීය.

ඉහළට නගින්න අහස් කුස අල්ලන්න අන් අය පාගා හෝ විනාශකර පොරකන සමාජයට දේව මාතාවගේ බැහැපත්කම කදිම ආදර්ශයක් බවද එතුමා වැඩිදුරටත් පැවසීය. මීසම් සේවක ගරු රොනි වික්‍රමසිංහ පියතුමා කටයුතු සංවිධානය කළේය.

ප්‍රේමා හීනටියගල

# සාන්ත සභාවේ ජීවනාලිය දිව්‍ය සත්ප්‍රසාදයයි

කිතුනු සභාවේ ජීවනාලිය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේයි. ස්වාමින් වහන්සේව අප ලබා ගන්නා සෑම විට අපගේ ජීවිතය ශුද්ධවත් වෙනවා. අපගේ ජීවිත ජීවත් කරවන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට අපගේ උතුම් ගෞරවය හා වන්දනාව පුදකළ යුතු අතර සදාකල් අප සමඟ ජීවත්වන කිතු සමිඳුන් සමඟින් අපගේ ජීවිත හරවත් කර ගැනීමට අදිටන් කර ගනිමු යැයි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

කාදිනල් හිමි එසේ පැවසුවේ. කළුතර දිසාවේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද රැළියේදීය. පයාගල ශු. ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරෙන් ආරම්භ වූ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගත් පෙරහර, පයාගල සිරි කුරුස විදුහල් (ප්‍රාථමික) ක්‍රීඩා පිටිය දක්වා ගමන් ගත් අතර, එහිදී දේව මෙහෙය පැවැත්වුනි. කළුතර දිසාවේ මීසම් නියෝජනය කරමින් විශාල බැතිමතුන් සංඛ්‍යාවක් මෙයට එක්වූහ. කළුතර දිසානායක ගරු මොරිස් නාමල් පියතුමා සමඟින්, දිසාවේ මීසම් සේවක පියවරුන් විසින් මේ උලෙළ සංවිධානය කරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# උල්හිටියේ මංගල්‍යය ද නව මණ්ඩපය, පූජාසනය ආසිරි ගැන්වේ

උල්හිටිය ධීවර ගම්මානයේ වාර්ෂික මහ මංගල්‍යය බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. වත්තල සා. අන්තෝනි ඝුඩ් ආයතන අධිපතිතුමාගේ මූල්‍යදායකත්වයෙන් දේවස්ථාන ඉදිරිපස අභිනවයෙන් ඉදිකරන ලද ශුද්ධ අන්තෝනි මුනි ප්‍රතිමා මංඩපය රදගුරු හිමි ආශිර්වාද කර විවෘත කළේය.

දිව්‍ය පූජාවෙන් අනතුරුව ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර වීදි සංචාරය කළ අතර වැව් ඉවුර ආසිරි ගැන්වීම විශේෂ සිදුවීමකි. සියලු සැදැහැවතුන් සඳහා සූදානම් කරන ලද දිවා ආහාරය ආශිර්වාද කර මංගල්‍ය වැඩ කටයුතු සාර්ථකව අවසන් කරන ලදි. මහියංගනය මීසම් සේවක ගරු ඩිලෙක්ස් ශාන්ත පියතුමා කටයුතු මැනවින් සංවිධාන කැර තිබිණ.

ශිරෝමි ඔපාත





සලාපුර පදවියට අයත් බෝලවත්ත, වෙන්නප්පුව, හලාවත හා පුත්තලම යන දිසා හතරට අයත් මීසම් 44 ක දහම් පාසල් 213 කි. එහි අකුරු කරන දුවා දරුවන් 40300 කි. ඔවුන් පෝෂණය කරන දහම් ගුරුවරු 2590 ක් පමණ වෙති. මෙම දහම් ගුරුවරුන්ගේ දැනුම හා මනෝවිද්‍යාත්මක වර්ධනයත්. ඉගැන්වීමේ ක්‍රමවේදයත් ආත්මික පෝෂණය උදෙසාත් ආකල්පමය වෙනසක් ඇතිකිරීම සඳහා පදවි අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත පියතුමාගේ මෙහෙය වීමෙන් දිසා අධ්‍යක්ෂ පියතුමන්ගේ සහයෝගයෙන් දහම්ගුරු පෝෂණ වැඩසටහන් මාලාවක් පදවියේ මධ්‍යස්ථාන හතරකදී පැවැත්විය. මේ එහි අවස්ථාවකි.

රොහාන් සූරාජ් ප්‍රනාන්දු

## සබරගමුව දේවාශිර්වාද ලත් රදගුරු වසමක්

සබරගමුව රදගුරු වසම ආර්ථික අපහසුතා සහිත දුප්පත් ගුරුවසමක්. එහෙත් සෑම කටයුත්තකදීම දේවාශිර්වාද ලබා එය සපුරාගැන්මට හැකියාව ලැබෙනවා යැයි රත්නපුර මීසමේ ගරු මැල් පිංඤෝ පිය සමරු ගොඩනැගිල්ල නවීකරණය කොට ආසිරිගැන්වීමේ උලෙළේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා සා.බෙ.නි හිමිපාණෝ ප්‍රකාශ කළහ.

ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය, රජය හා පරිත්‍යාගශීලින්ගේ ආධාර මත මෙම ගොඩනැගිල්ල නවීකරණය කර ඇත. එහිදී කථා කළ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර සම්බන්ධීකාරක ඇන්තනි මංචනායක මහතා ව්‍යාපාරයේ ජාතික උපාධ්‍ය ලෙස ගරු රන්ජන් මාල් මොරායස් පියතුමා ද, ජාතික සභාපති ලෙස තියබෝල්ඩ් සමරතුංග මහතාද, රත්නපුර මීසම නියෝජනය කරන මොහොතක ජර්මනියේ ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරයේ මැදහත්වීමෙන් රුපියල් ලක්ෂ 15 ක මුදලක් මේ වෙනුවෙන් ලබාදීමට මැදහත්වීමට ලැබීම සතුටට කරුණක් යැයි පැවසීය.

රත්නපුර මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් පියතුමා ද, පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු පෝල් ප්‍රනාන්දු පියතුමාද කථාකළහ.

තියබෝල්ඩ් සමරතුංග

## සුබාසිංසන





කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ හා ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණන්ගේ රදගුරු සංවත්සර අගෝස්තු 31 වැනිදාට යෙදී තිබේ. එතුමනට ප්‍රදීපයෙන් සුබාසිංසන!

## අගරදගුරු පදවි වාර්ෂික පූජක ධර්ම විවේකය 2012

තෙවන ධර්ම විවේකය

සැප්තැම්බර් 3 සඳුදා ප.ව. 5.00 සිට සැප්තැම්බර් 08 සෙනසුරාදා ප.ව. 12.30 දක්වා.

ස්ථානය - තේවත්ත ධර්ම විවේකාගාරය

දේශක - ගරු ලෝරන්ස් පී. පින්ටො පියතුමා (ඉන්දියාව)

සහභාගි වන පියතුමන්

ගරු ස්ටැන්ලි අබේසේකර, සරත් නිමල් අබේසිරිවර්ධන, ජූඩ් අල්ගම, ආනන්ද ක්‍රිෂාන්ත ජයශාන්ත, ඇන්ටනි ලක්ෂමන්, ඇන්ටන් රංජිත් (කනිෂ්ඨ), අරුණ ශ්‍රිකමල්, ටෙරන්ස් බෝදියාබඳුගේ, ඇන්ටන් ග්‍රොමික් කුරේ, අර්නස්ට් ද මෙල්, දොන් චමින්ද රොෂාන් ප්‍රනාන්දු, දොන් ජූලියස් ක්‍රිස්ටෝපර්, ඇන්ටන් ජයනන්ද ප්‍රනාන්දු, ඩී. චන්ද්‍රනලාල් ජෝශප් ප්‍රනාන්දු, ජේ. බර්ට්‍රම් ප්‍රනාන්දු, ජූඩ් ක්‍රිසන්ත ප්‍රනාන්දු, රීඩ් ෂෙල්ටන් ප්‍රනාන්දු, වසන්ත ප්‍රසන්න ප්‍රනාන්දු, ජූඩ් සූරාජ් පොන්සේකා, සුදත් එම්. ගුණතිලක, මහේන්ද්‍ර ගුණතිලක, දර්ශන ජයමාන්න, ජූඩ් සුරේෂ් රංගන, ජූඩ් ටෙනිසන්, ටෝනි මාටින්, හියුගෝ පලිහවඩන, බී. ප්‍රගීත් චාමර පෙරේරා, දේශාන් ලසන්ත පෙරේරා, ගයාන් ප්‍රසන්න පෙරේරා, ඉන්ද්‍රජිත් පෙරේරා, ඉඳුනිල් සම්පත් පෙරේරා, ජෝශප් ඇන්තනි පෙරේරා, ජූඩ් ලක්ශාන්ත පෙරේරා, ලියෝ පෙරේරා, මේරියස් නිහාල් පෙරේරා, එස්. ජේ. ප්‍රසාද් පෙරේරා, ටිරෝන් පෙරේරා, ඩබ්. එස්. මොරිස් නාමල් පෙරේරා, ජූඩ් බර්නාඩ් රොඩ්රිගු, නුවන් එස්. රොඩ්රිගු, මැක්ෂිමස් රොඩ්රිගුපුල්ලේ, රොනි පොන්සියස්, රුවන්ත කුමාර, නන්දන සපරමාදු, කේ. ලක්මින් ප්‍රසංග සිල්වා, රාජ් සිල්වා, ප්‍රගීත් දිශාන් සිමියොන්, ජයශාන්ත සෝවිස්, ශ්‍රිනාත් මනෝජ්, ශාන්තිකුමාර් වැලිවිට, සුනිල් වේරගොඩ, රොනි වික්‍රමසිංහ, ප්‍රසාද් නිරංජන් යන ගරු පියවරුන්.

කාරුණික දැනුම් දීමයි

පැමිණීම - සැප්. 3 සඳුදා ප.ව. 5.00

ප.ව. 6.00 ප්‍රථම දේශනය

ප.ව. 7.30 යාම යැදුම රාත්‍රි ආහාරය හා රාත්‍රි යැදුම්

ධර්ම විවේකය අවසන් වන්නේ සැප්. 8 සෙනසුරාදා ප.ව. 12.30

ධර්ම විවේකය සමයේදී නිශ්ශබ්දතාවය හා පැවරෙන වගකීම් හා බැඳෙමින් ස්වාමින් වහන්සේ තුළ ගැඹුරින් විසීමට කාරුණික වන්න.

ගරු ලලිත් එක්ස්පෙඩිටස් පියතුමා
පූජක ධර්ම විවේක සම්බන්ධිකාරක

## මරි මව් ඥානකාන්තියක්

දේවමාතාවන්ගේ ස්වර්ගාරෝපණ මංගල්‍ය නිමිත්තෙන් එතුමියගේ මහ ගුණ කදම්භය සිහිගැන්වෙන මරි මව් ඥානකාන්තියක් පුරා දින හතරක් තිස්සේ වල්පොල ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවත්විණි.

උත්පත්තියේ සිට ස්වර්ගාරෝපණය දක්වා සිය දේවමාතාවන්ගේ කැඳවීමේ සියලු පැතිකඩ එළිදරව් කරමින් ශ්‍රී ලංකා කිතු දන පුපුදුව මෙමෙ ඥානකාන්තිය සංවිධානය කර තිබිණි.

කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි



සඳලංකාව තඹකන්ද ශු. බෲනෝ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ අභිනවයෙන් ස්ථාපිත කරන ලද මුනිවර ප්‍රතිමා ආසිරි ගැන්වීම කුරුණෑගල පදවි පරිපාලක නාහිමි අතිගරු පියල් ජානක පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. එහිදී ගරු පියතුමා ආගමික කටයුතු මෙහෙය වූ අයුරු. මීසම් සේවක ගරු ස්ටැන්ලි පීරිස් පියතුමා ද මෙහි සිටී.

සිසිල් ඩැනීසියස්

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk
ක්‍රිස්තු වර්ෂ 2012 අගෝස්තු 26 ඉරිදා

# නොරොච්චෝලේ

'නොරොච්චෝලෙ' නැවතත් කථා කහට ලක් වන මාතෘකාවක් බවට පත්වී තිබේ. මීට වසර 15 කට පමණ ඉහතදී වඩාත් ආන්දෝලනයකට තුඩු දුන් මේ ගම්මානයේ නාමය එදා කථා බහට ලක් වූයේ තලවිල සා. ආනා මුනිවරියගේ සිද්ධස්ථානයත් මුල් කරගෙනයි. නමුත් ඇත්ත කථාව ඊට එපිට යන තවත් සිද්ධි සමුදායක් හා සම්බන්ධයි. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය පිළිබඳ කථා පුවත එළිදැක්වූ මුල්ම අවස්ථාවේ ඊට එරෙහිව කඩු මුගුරු අමෝරා ඉදිරියට පැමිණියේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් කිහිප දෙනෙක්, පරිසරවේදීන් අතලොස්සක් හා එක්සත් ජාතික පක්ෂ දේශපාලනයට අකමැති වෙනත් දේශපාලන අරමුණු ඇත්තවුන් සමූහයක්ය. ඔවුන්ගේ අරමුණ කුමක් වුවත් මුල් කාලීනව ඔවුන් නැගූ ශබ්දය විවිධ මාතෘකා අනුව සිදු වූ බව දන්නෝ දනිති. එකල මානව හිතවාදි කඩතුරාව තුළ ආගමික ලේබලය අලවා ගෙන සිටි කතෝලිකයින් කිහිපදෙනෙක්ද එයට විරුද්ධව මහ හඬක් නගමින් ප්‍රසිද්ධියේ එවකට හලාවත රදගුරුව සිටි ස්වර්ගස්ථ අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් හිමිපාණන්ට තර්ජන මුඛයෙන් කථා කරන්නට පෙරට ආයේ පොදුවේ කතෝලික සභාවටත් දොස් නගමින්ය. මේවා තවම අමතක කථා පුවත් නොවේ.

කෙසේ හෝ බුද්ධිමත් විචාරශීලි අධ්‍යයනයකින් යුතුව මේ පිළිබඳව සිත් යොමු කළ අප රදගුරු හිමිපාණෝ මේ බලා ගාරය නිසා පසුව ඇතිවන ව්‍යසනය මෙන්ම ආර්ථික ප්‍රතිලාභයක් නොදෙන මේ ආර්ථික ව්‍යායාමයේ අරුත් සුන් බව එළිදක්වන්නට මහත් සේ වෙහෙස මහන්සි වූ බව රහසක් නොවේ. කලින් කල එළි බට විවිධ හැඩතල වලින් යුක්තවූ පුද්ගලයෝ සඟවාගෙන කල අර්ධ විප්ලවය ආණ්ඩු මාරුවූ පසු වෙනස් කරගෙන පසු බා ගියත් අප රදගුරු තුමෝ ගෙන ගිය අවංක අරගලය අවසන් වන තෙක්ම තනිව ගෙන ගිය බව දන්නෝ දනිති. සියලු කුණු බේරුවල බොක්කට මෙන් අවසානයේ එය හුදෙකලා සටනක් බවට පත්වෙමින් අප රදගුරුතුමන්ව නිර්දය ලෙස විවේචනය කරන්නට බොහෝ තැන්වල උදවිය පසුබට නොවූහ. වෙනකක් තබා ලතින් අමෙරිකාන මානව හිතවාදි මොඩලයේ කඩතුරාව තුළ විවිධ වෙස් බැන්ද ඒ අතලොස්සද ආණ්ඩු මාරුවෙන් පසු දත කට පියාගෙන පසු බා ගිය ආකාරය අනුකම්පාවෙන් වුවද සිහිපත් කළ යුතුයි. අවසානයේ එය රදගුරු තුමන්ගේ හුදෙකලා සටනක් බවට පත් කරන්නට මුලින් පෙරට ආ ඒ සියල්ලන්ම කටයුතු කළ බව නැවත මතක් කළ යුතු නොවේ.

රදගුරු හිමිපාණන් එදා ආගමික සංකල්පයෙන් පමණක් නොව විද්‍යාත්මක උපකල්පනයන්ගෙන් ගෙන හැර පෑ සියලු කරුණු අද එකින් එක සත්‍ය වන බව පෙනේ. වෙනකක් තබා, නොරොච්චෝලේ තිබෙන්නේ හොඳින් සිතා මතා සැලසුම් කොට ප්‍රමිතියකට අනුව ගොඩනඟා ගත් බලාගාරයක් නොවේය යන්න අද පවසන්නේ එහි මූලික වගකීම දරන අයම වීම 'කාලයේ සරදමක්' වැනියි. නොරොච්චෝලේ අක්‍රියතාවයනට අද සුසුම්හෙලන්නෝ මූලික වශයෙන් සීමාන්තික පරිසරවාදයට දොස් නඟති. සඟවා ගත් වචන ඔස්සේ රදගුරු හිමිපාණන්ට බැණ අඬ ගසති.

තුලනාත්මකව සිතාබලා තීරණ ගැනීමේ ඇති වැදගත්කම ගැන කථා කරන්නන්ගේ අද මේ සම්බන්ධයෙන් නඟන මැසිවිලි අතර ඇති සිත්තම වටහා ගත යුතුයි. මේ සම්බන්ධයෙන් එදා අනාගතයේදී සිදුවන කරුණු අරබයා ගෙන ආ කරුණු අවඥාවට ලක් කළේ මේවා ඉදිරිපත් කළ පුද්ගලයා රදගුරු තුමකු වීම නිසයි. ඊටත් වඩා කතෝලික වීම නිසයි. අප රටේ තත්ත්වය එයයි. යම් අහිතකර කරුණක් සම්බන්ධයෙන් එළිදක්වන යහපත් විවේචන පිළිගැනීමට අප රට සූදානම් නැත්තේ මේ බේදභින්නතාවයෙන් අන්ධ වී සිටීම නිසාමයි. මේ නිසාම එදා රදගුරුතුමන් වින්ද අපහාස එමටයි. ඇසූ බැණුම් අපමණයි. නමුත් සිය සෘජු ප්‍රතිපත්තියේ පිහිටා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් අවසානයේ එතුමන් පැවසූ අවසන් වදන තවමත් වියැකී නොමැත. එනම් මොන ඇස් බැන්දුමෙන් මෙය ගොඩ නගතත් උපරිම අවුරුදු තුනක සීමාවට පමණක් මෙය යටත් වන බවයි. එය පළිගැනීමට කළ මතවාදයක් නොවේ. කරුණු හොඳින් හදාරා, විදේශ විද්වතුන්ගේ උපදෙස් උපයෝගි කොටගෙන හොඳින් අධ්‍යයනයක් කර ඉදිරිපත් කළ අදහස්ය. නමුත් පිළිගැනීමට කිසිවකු සිටියේ නැත.

නොරෝච්චෝලේ බලාගාරයට චීනයෙන් ආධාර ලැබුණි. බලා ගාරය ඉදිකිරීමද චීනයෙනි. සැලසුම් ද චීනයෙනි. පිළිගත් උපදේශක සමාගමකින් සැලසුම් සකස් කිරීමක් හෝ අධීක්ෂණයක් සිදුවූයේ නැත. ආණ්ඩුව ඒ සඳහා කිසිදු උත්සාහයක් ගත් බවක් පෙනෙන්නට නොතිබුණි. මෙම බලාගාරය පසුගිය වසරේදී විදුලි නිෂ්පාදනය ආරම්භ කිරීමෙන් පසුව මේ වන විට අවස්ථා අටකදී ක්‍රියා විරහිත වී තිබේ. ඒ විවිධ හේතු නිසාය. ඒ විවිධ හේතු කලින්ම රදගුරු තුමන් ඉදිරිපත් කළ වාර්තාවේ සවිස්තරව සටහන් කොට තිබිණි. අක්‍රිය වීමෙන් පසුව දැන් සිදුවන්නේ ඒවාට ඒ මොහොතේ පිළියම් යොදා නැවත ක්‍රියාත්මක කිරීමයි. බලාගාරයට සිදුවන හානිය වළකා ගැනීම සඳහා කිසිදු විකල්ප ක්‍රමවේදයක් දැනට එය සතුව නැත. වෙනකක් තබා විදුලි බල ඇමැතිවරයාද කියන්නේ මේ බලාගාරය දෝෂ සහිත බවයි.

අදටත් වලංගු අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් රදගුරු හිමිපාණන්ගේ අනාගත වක්තෘ වාර්තා සටහන කිසිදු ආකාරයේ ඒක පාර්ශවික හා සීමාන්තික අදහස් වලින් හෙබි වාර්තාවක් නොවේ. වගකිව යුත්තන් දැන්වත් එය පිළිගන්නට සමත් වන්නේ නම් ආගමික රාමුවේ පුද්ගලයන් වුවත් රටේ වැදගත් කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අදහස් උදහස් අවඥාවෙන් බැහැර නොකරන්නට කටයුතු සිදු කළ යුතුයි. සිදු විය යුතුයි. ඒ නිසාම රදගුරු හිමිපාණන් එදා ඉදිරිපත් කළ යෝජනා, අදහස් හා විවේචන පමණක් නොව එතුමන්ගේ 'බැල්මද' තවමත් මේ හා සම්බන්ධව අදටත් වලංගු බව අප දන්වා සිටින්නේ එබැවිනි.



# අන්තිමට නොරොච්චෝලෙන් විදුලියවත් ලැබෙන්නේ නෑ

## ස්වර්ගස්ථ අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි

මේ කතා කරන්නේ හඬක් නැති අය වෙනුවෙන්. එතකොට කව්ද මේ හඬක් නැති ඇත්තෝ. ඒ තමයි හුළඟ, ජලය. පොළොව, මම කතා කරන්නේ ඒ අය වෙනුවෙන්. මේ ගන්නා තීන්දුව වැරදිනම් ලැබෙන්නේ නරක ප්‍රතිඵල ඒකෙන් මේ හුළඟ විසවේවි. ජලය දූෂණය වේවි. පොළොව නිසරු වේවි. එතකොට කවුද මේ හුළඟ, ජලය, පොළොව පාවිච්චි කරන්නේ. ජනතාව. සමස්ත ජනතාව.

මේ ඉදිකරන්න යන තාප බලාගාරයේ විරෝධය ත්‍රිකුණාමලයෙන් පටන් අරන් දකුණට ගිහින් ආපහු පුත්තලමට ඇවිත්. එතකොට මෙතැනදී ආපු ප්‍රශ්නෙ තමයි ඇයි අනික් තැන්වලින් ප්‍රතික්ෂේප කළේ. ඒකට දුන්නා අපූරු උත්තරයක්. ඒ මේක.

මෙම ප්‍රදේශය ජනශූන්‍ය ප්‍රදේශයක් වීම. මෙතන ජනගහනයක් නැත.

නමුත් ඒක බොරුවක්. මෙතන ජනගහනයක් ඉන්නවා. එතකොට ඒ ඉන්න තැනක මේ වගේ කටයුත්තක් ජනතාව ගැන නොසලකා කරනවා නම් ඒක අපිට මෙහෙම හඳුන්වන්න පුළුවන්.

"ජනතාව ගැන නොසලකන සංවර්ධනයක්."

මෙන්න මේ හින්දයි අපි මේක ප්‍රතික්ෂේප කරන්නේ. මේගොල්ලන් කරපු තව වැරැද්දක් තියෙනවා. ඒ මේක.

"ශක්‍යතා වාර්තා තොරතුරු සැඟවීම."

මෙන්න මේ හංගපු ශක්‍යතා වාර්තාව මම කියවලා බැලුවා. ඒ ඒ විෂයන්වලට අදාළ විශේෂඥයන් එක්ක කතා කෙරුවා. එතනදී මගෙන් මෙහෙම ඇහුවා.

"ඇයි මේ වගේ දේවල් කරන්නේ?" එතකොට මම මෙහෙම කිව්වා.

මේ දේ මම කළේ මේ රටේ රට වැසියෙක් විදියට. මේ ප්‍රදේශයේ පුරවැසියෙක් විදියට. ඒක අපි හැමෝටම තියෙන අයිතියක්. ඉතින් මම ඒ අයිතිය පාවිච්චි කළා. රටවැසියෙක්. පුරවැසියෙක් කියන්නෙ හැමතිස්සෙම තමන් ගැනම කතා කරන කෙනෙක් නෙවෙයි.

මේ ශක්‍යතා වාර්තාව කොටස් දෙකක්. ඒ මේ විදිහට.

**සඟ සැපත් අතිඋතුම් ප්‍රෑන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්ගේ තෙවන සැමරුම අගෝස්තු මස 24 වැනිදාට යෙදී තිබූ අතර උන් වහන්සේ මීට පසළොස් වසරකට පෙර පළ කළ මේ අදහස් අද එකින් එක සැබෑ වෙමින් පවතින බව තවදුරටත් රහසක් නොවේ.**

1. පරිසරය - පරිසර ප්‍රශ්න
2. සමාජය - සමාජ ප්‍රශ්න

මේ කොටස් දෙක හොඳින් කියවලා බලනකොට තේරුම් ගියා ජන සමාජයේ අවශ්‍යතා ගැන නොසලකා කරපු දෙයක් කියලා. නමුත් තවත් හොඳින් බලනකොට ඊටත් එහාට ගිය ගැඹුරක් තියෙනවා කියලා. මම දැක්කා ඒ ශක්‍යතා වාර්තාවේ තිබ්බ්ච තොරතුරු වැරදියි කියන එක. ඒ මේ විදියට.

පරිසරයට කිසි හානියක් නෑ. එතන සඳහන් කරලා තිබුණා පරිසරයට යම්කිසි හානියක් වෙනවා නම් ඒ යම්කිසි සංවර්ධනයකදී ඇතිවන පොඩි පොඩි ප්‍රශ්න ටිකක් විතරයි. ඒක බොහොම අඩු දෙයක්.

නමුත් ඒක බොරුවක්. ඇයි එහෙම කියන්නේ?

ගල්අඟුරු බලාගාරයක විදුලිය නිපදවන්න යම්කිසි ගල්අඟුරු තොගයක් පුච්චන්න ඕන. ඒක එන්නේ ග්‍රෑම් ගණනින්ද? නෑ. රාත්තල් ගණනින්ද? නෑ. කිලෝ ගණනින්ද? නෑ.

මේ අගය මනින්නෙ ටොන් ගණනින්. එතකොට ඒක මූලික වශයෙන් දන්වලා තිබුණේ ටොන් තුන්සිය, හයසීය, නමසීය විදියට. නමුත් ඒ ආරම්භක අවස්ථාව විතරයි.

මෙතැනදී ප්‍රශ්නයක් මතුවුණා. මේ පුච්චන ගල්අඟුරු ඉතුරු වන කොටස් කොහාටද යන්නේ? කොහාටද දාන්නේ?

ඒකට උත්තර දුන්නෙ නෑ. ඒ උත්තර නුදුන්නු ඇත්ත මේකයි. ඒ ඉතුරු වෙන දේවල් යන්නෙ ස්වභාවධර්මයේ කොටස් දෙකකට. ඒ මේ විදියට.

1. අහසට
2. පොළවට

මේ අහසට යන එක අන්තර්ධාන වෙනවාද? නෑ. මේ පොළොවට යන එක අන්තර්ධාන වෙනවාද? නෑ. මේ අහසේ තියෙනවා වායූන්, සත්ත්වයන්ට, ගහකොළට ජීවත් වෙන්න ඕන වායු වර්ග. මේ අහසට යන විස දුමාරය මේ වායු අතරට යනවා. ඒ ගිහින් මිශ්‍ර වෙනවා. ඒ කියන්නේ වායු දූෂණය. එතකොට දැන් මේක ප්‍රශ්නයක් නෙමෙයිද?

ඒ ප්‍රශ්නයටත් දුන්නා මේ විදියෙ උත්තරයක්. ඒ. දූෂණය සියයට දෙකක් කියලා ඒක හරි. ඒ ගණන් හදලා බලපුවාම සියයට දෙකක් කියන්නේ හිතන්නවත් ඕන දෙයක් නෙවෙයි. අනික් පැත්තෙන් තියෙනවා හොඳ ඒවා සියයට අනූ අටක්.

නමුත් ඒ සියයට දෙක කොච්චරක් ප්‍රමාණයකින්ද? ටොන් තුන්සියකින් නම් ඒකෙ සීයට දෙක කීයක්ද? ටොන් හයසීයකින් නම් ඒකෙ සියට දෙක කීයක්ද? ටොන් නමසීයකින් නම් ඒකෙ සීයට දෙක කීයක්ද?

ඒක ඇහුවම උත්තර දුන්නෙ නැහැ. කිව්වෙම සීයට දෙකයි කියලා. බයවෙන්න එපා. ඒ සියට දෙක ඉවසිය යුතුයි. සංවර්ධනයේ නාමයෙන් ඒ එක්කම දුන්නා තවත් ලස්සන උත්තරයක්.

ඒ සීයට දෙක තමයි සංවර්ධනයෙ අසීරුතාව.

මම අහන්නෙ මේකයි. මේ සංවර්ධනයේ අසීරුතාව මූලික ගණනයේදී සියයට දෙක වුණාට, ඒ සංවර්ධනය අසීරුතාවයේ අවසාන ගණනයේදී ටොන්වලින් කොච්චරක්ද?

මෙන්න මේවා තමයි සංවර්ධනයේ කතාබහ.

මේවා අහස් වාතයට එකතු වෙන්නෙ නිකං දුම් හැටියට නෙමෙයි. මේවයේ තියෙනවා අධික ප්‍රමාණයක් ගෙන්දගම්. එතකොට මේ අහසෙ වහිනවා. එහෙම වුණාම ඒවා මේ වැස්සට එකතු වෙනවා. දිය වෙනවා. ඊට පස්සෙ පොළොවට වැටෙනවා. ඒකට කියන්නේ අම්ල වැස්ස. නැත්නම් ඇසිට් වැස්ස කියලා.

සංවර්ධනයේ අසීරුතාවෙන් ගොඩනැගෙන මේ ඇසිඩ් වැස්සට අපි කැමැති වෙන්න ඕනද?

15 පිටුවට »

කැමිලස්ගේ — තිත්ත ඇත්ත



## මීසමෙන් මීසමට



එඬේරමුල්ල මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය ජාඇල කලාපීය නාහිමි අතිගරු ශාන්තිකුමාර් වැලිවිට පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. මීසම් සේවක ගරු රොහාන් ප්‍රසන්න පියතුමාගේ මඟපෙන්වීම යටතේ පැවැති මංගල උළෙලට නේවාසික ගරු කමල් කුමාර සහ ගරු සුදත් පෙරේරා පියතුමන් ද සහභාගි විය.

පැට්රික් පෙරේරා

# කතෝලික දෙව්මව් බැතිය මූලධර්මවාදීන්ට අභියෝගයක්!

**කතෝලික බැතිමතුන් දේව මාතාවන්ට ගෞරවය දක්වන්නේ ඇය දේව අම්මානිසයි. දේව අම්මාට ගෞරවාදරය දක්වන්නේ නැතිනම් කාට ආදරය කරන්නද? මූලධර්මවාදීන් දෙව්මව් බැතියට පහර ගසන්නේ කතෝලික බැතිමතුන් දේව මෑණියන්ට උතුම් ගෞරවාදරය දක්වන නිසායැයි රත්නපුර රදගුරු වසමේ තන්ජන්තැන්න ස්වර්ගාරෝපිත දේවමාතා වාර්ෂික මංගල්‍යයේදී රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටස් චන්ද්‍රසිරි පෙරේරා (සා.බෙ.නි) හිමිපාණෝ පැවසූහ.**

දෙව්මැඳුරේ නිර්මාතෘ ගරු ක්‍රිසෝ පීරිස් ජේ.නි. පියතුමන් හා රත්නපුර දිසානායක අතිගරු සර්ජියස් ප්‍රනාන්දු පියතුමාගේ සහභාගිත්වයෙන් පැවති මංගල දේව මෙහෙයේදී මෙම දෙව්මැඳුර ප්‍රදේශයේ සේවය කර අවසන් ගමන් යන ගරු කේ. ඩී. ජෝශප් පියතුමන්ව සිහිපත් කිරීමක් ද සිදුවිය.

ජපමාල නිකායේ ගරු ඇලන් නිර්මලදාස, ප්‍රියන්ත ප්‍රනාන්දු, එස්. සවරිමුත්තු යන පියවරුන් ප්‍රමුඛ තන්ජන්තැන්න ජනතාව මංගල කටයුතු සංවිධානය කර තිබුණි මීසම් අවටින් මෙන්ම නායකකන්ද මීසමේ බැතිමතුන් රැසක් මෙයට සහභාගි වී සිටියහ.

තියබෝල්ඩ් සමරතුංග

## වකුගඩුවක් ඕනෑ!



නයිනමඩම සා. අන්තෝනි දෙව්මැඳුරට අයත් නො. 145/බී, බ/නයිනමඩම නයිනමඩම ලිපිනයේ පදිංචි, එක්දරු පියකු වන 50 හැවිරිදි කළුමරක්කලගේ ඇලෙක්ස් ටියුරින් ප්‍රනාන්දු මහතාගේ වකුගඩු දෙකම අක්‍රිය වීම නිසා ඉතා ඉක්මනින් ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බැව් කොළඹ මහ රෝහලේ විශේෂඥ ශල්‍ය වෛද්‍ය රුෂික ලැනරෝල් මහතා නිර්දේශ කර තිබේ. මොහුගේ වටිනා දිවි රැක ගැන්මට ඕ නෙගටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කිරීමට සතුටු කෙනකු වන්නේ නම් 077-4636371, 077-4414689 අංකවලට අමතන්න.

## තේවත්තේ මංගල්ලෙට විශේෂ දුම්රිය ධාවනය වේ

රාගම තේවත්ත ලංකා අප ස්වාමිදුවගේ ජාතික බැසිලිකාවේ රෝගීන්ගේ දින මංගල්‍යය නිමිත්තෙන් බැතිමතුන්ගේ ගමන් පහසුව සඳහා අගෝස්තු 26 වන දින මරදාන - රාගම/ මරදාන -මොරටුව/ රාගම - මොරටුව, හලාවත - රාගම/ හලාවත - මීගමුව/ රාගම - මීගමුව දක්වා විශේෂ දුම්රියන් ධාවනය කිරීමට කටයුතු යොදා ඇත.

මරදාන පෙ.ව. 07.51 රාගම පෙ.ව. 08.15,
රාගම පෙ.ව. 08.45 මරදාන පෙ.ව. 09.08
රාගම පෙ.ව. 06.00 අළුත්ගම ප.ව. 08.45
මොරටුව පෙ.ව. 11.00 රාගම ප.ව. 12.08
රාගම ප.ව. 12.50 මොරටුව ප.ව. 01.57
මොරටුව ප.ව. 2.30 රාගම ප.ව. 03.42
රාගම ප.ව. 4.30 මරදාන ප.ව. 04.53
හලාවත පෙ.ව. 07.55 රාගම පෙ.ව. 10.12
රාගම පෙ.ව. 11.40 මීගමුව ප.ව. 12.28
මීගමුව ප.ව. 01.40 මරදාන ප.ව. 02.55
මරදාන ප.ව. 07.05 හලාවත ප.ව. 09.35



වත්තල සා. ආනා සමිතිය මඟින් අඩු ආදායම්ලාභී පවුල් වලට සහන සැලසීමේ අරමුණින් ආරම්භ කරන ලද ලොතරැයියේ දිනුම් ඇදීම වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණ. සමිතියේ සභාපති මාලිංග ජයවර්ධන මහතාද ඡායාරූපයේ සිටී.

සේයා - නිමල් පෙරේරා

# තලාහේන පේරුවේ අපචාරයන්ට එරෙහිව කතෝලික ගිහි, පැවදි, පූජක පිරිස් රොද බඳිති

තලාහේන පේරුවේ සහ පමුණුගම ප්‍රදේශයේ පාසල් සිසු සිසුවියන් සහ ප්‍රදේශයේ තරුණ තරුණියන් නොයෙකුත් විෂ මත්පැන්, මත්කුඩු, මත්ද්‍රව්‍ය සහ නිල් චිත්‍රපට හා අපචාර වලට හුරුවීමේ ප්‍රවණතාවයක් ඇති බවත්, එය ඉතා ශීඝ්‍රයෙන් ප්‍රදේශයේ පාසල් දූ දරුවන් අතර සහ තරුණ තරුණියන් ග්‍රහණය කර ගනිමින් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වන බවත් වාර්තා වී ඇත.

මේ පිළිබඳ සොයා බලා කඩිනම් පියවරක් නොගත හොත් විශාල ක්තුනු ජනතාවක් ජීවත්වන තලාහේන පේරුව සහ පමුණුගම ප්‍රදේශය විනාශයට පත්වන බව තේරුම් ගත් දොන් බොස්කෝ ආයතනයේ ප්‍රදේශාධිපති අතිගරු නිහාල් ලියනගේ පියතුමා සහ එහි පරිපාලක ගරු නිරෝෂන් ප්‍රනාන්දු පියතුමා ඇතුළු තලාහේන සහ පමුණුගම පේරුවේ මීසම් සේවක පියතුමන් මේ පිළිබඳව ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට දුන්ගල්පිටිය දොන් බොස්කෝ ශ්‍රවණාගාරයේදී රැස්වූහ.

රැස්වීමට පමුණුගම මීසම් සේවක සහ ගොන්සාල්වේස් විදුහල්පති ගරු ආනන්ද විතාන, කැපුන්ගොඩ මීසම් සේවක ගරු ක්ලෝඩ් වනසිංහ, පිටිපන මීසම් සේවක ගරු සරත් අබේසිරිවර්ධන මංකුලිය දෙව්මැඳුරේ ගරු අසිත පියතුමන්ද, කැපුන්ගොඩ, තලාහේන සහ පිටිපන කන්‍යාරාමවල ප්‍රධාන මව්තුමියන් ඇතුළු පැවදි සොහොයුරියන්ද, ප්‍රදේශයේ විදුහල්පතිවරුන් ඇතුළු ගුරු මහත්ම මහත්මීන්ද, ප්‍රදේශයේ ග්‍රාම නිළධාරි මහත්ම මහත්මීන්ද, මීසම්වල විශේෂ නියෝජිත පිරිසක්ද සහභාගි වූහ.

මොරිස් නානායක්කාර

# සලාපුර දිමුතු පදනම දස වසර සපුරයි

හලාවත රදගුරු වසමේ ආචාර්ය ගරු ජූඩ් නික්ලස් ප්‍රනාන්දු පියතුමාගේ සංකල්පයක් මත 2002 වසරේ බිහිවුණු දිමුතු පදනම 2012 වසරට දස වසරක් සපුරයි. දිළිඳු පාසල් දරුවන්ගේ අධ්‍යාපනික අවැසිතා සපුරාලීම දිමුතු සේවාවේ මුල් පියවර විය. දිවයිනේ දුෂ්කර ප්‍රදේශ වලින් තෝරා ගත් දිළිඳු දරුවන් 15 දෙනෙකුගෙන් ඇරඹි එය අද සිසුන් 350 දක්වා වර්ධනය වී ඇත.

ළමා, වැඩිහිටි, පවුල් උපදේශන සේවා, ළමා, දෙමාපිය කව හා වැඩමුළු, ස්වෙච්ඡා ගුරු සේවා වැඩිහිටි හා මහළු ආධාර, සෞඛ්‍ය සායන. ඇස්කණ්නාඩි ලබාදීම, දිළිඳු දුෂ්කර පාසල් වලට පුස්තකාල පොත්පත් ලබා දීම, අධ්‍යාපන පහසුකම් හා ඉගෙනුම් උපකරණ ලබාදීම, සැත්කම් සහන, මහන මැෂින් ලබාදීම, නිවාස ලබාදීම. කුඩා ප්‍රමාණයේ සත්ව ගොවිපළවල් සඳහා සතුන් ලබාදීම, ප්‍රවාහන පහසුකම් නොමැති දුෂ්කර පාසල් දරුවනට බයිසිකල් ලබාදීම, දරිද්‍රතාවයෙන් යුත් ගම්මාන නගා සිටුවීම. ඩෙස් බංකු ලබා දීම. සූර්ය තාප විදුලිය ලබාදීම, ක්‍රීඩා භාණ්ඩ ලබා දීම, දුෂ්කර ප්‍රදේශ වල පෙර පාසල් හා ජාත්‍යන්තර පාසලක් ආරම්භ කිරීම, සැත්කම් සඳහා වෛද්‍ය ආධාර ලබාදීම, හරිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදිය දිමුතු පදනම කර ඇති අනගි සේවාවන්ගෙන් සමහරකි.

දිමුතු පදනම විසින් කරනු ලබන උතුම් සේවාවේ අගය වටහා ගත් පම්බල ග්‍රාමයේ වෙසෙන නිර්මලී පෙරේරා මෙනෙවිය කොළඹ හලාවත ප්‍රධාන මාර්ගයට යාබද ඇයට හිමි එකම වටිනා බිම්කඩ දිමුතු සේවා කේන්ද්‍රය ගොඩ නැගීම සඳහා පරිත්‍යාග කරනු ලැබීම, දස වසරක් පුරා එම පදනම කළ සේවයට දෙවිඳුන් ගෙන් ලැබුණු මහෝත්තම වූ තිළිණයකි. දැනට එහි ඉදිවෙමින් පවතින දිමුතු සේවා කේන්ද්‍රය අනාගතයේදී වීදි දරුවන්, අසරණ වැඩිහිටියන්, දුගී මගී යාචකයින් ආදී සැමට සහනය සපයන ස්ථානයක් වීම සුවිශේෂී කරුණකි. ගරු ජූඩ් නික්ලස් පියතුමා ගඩොල් ආශිර්වාද කළ අයුරු. එම අවස්ථාවට බංඩරවත්ත මීසම් සේවක මැන්ටර් ප්‍රනාන්දු පියතුමාද එක්විය.

පර්සි ප්‍රනාන්දු

# ස්වර්ණ ජයන්තියට නවීකරණයවූ රාවතාවත්ත සුරතාවයින්ගේ රාජේශ්වරී දෙව්මැඳුර

පුදබිමක අසිරිය



1959 දී මොරටුවේ කටුබැද්ද සහ රාවතාවත්ත යන ග්‍රාම දෙකට මැදිව ගාලුපාරට මායිම්ව පිහිටා තිබූ සොයිසා පරම්පරාවට අයත් විශාල පොල්වත්ත. කොළඹ අගරදගුරු පදවිය විසින් මිලදී ගන්නා ලදී. ඉන්පසු එහි පිහිටා තිබූ පැරණි වලව්ව සහ භූමිය ප්‍රදේශයේ කතෝලික තරුණ පිරිස් එකතු වී ශුද්ධ පවිත්‍ර කර එම වලව්වේ ආලින්දයේ ප්‍රථම ඉරුදින දිව්‍ය පූජාව පැවැත්වීමට කටයුතු සැලසුම් කෙරින. එවකට මොරටුව මීසම් සේවක ගරු එඩ්මන් ප්‍රනාන්දු සහ සහායක ගරු අර්නස්ට් පෝරුතොට පියතුමන්ගේ මග පෙන්වීම හා ආශිර්වාදය නොඅඩුව ලැබිණි.

රාවතාවත්ත, ලක්ෂපතිය, කටුබැද්ද, කුඩුවාමුල්ල, තෙලවල යන ගම්වල පදිංචි කතෝලික ජනතාව 'වලව්ව පල්ලිය' නමින් හැඳින්වූ මේ ස්ථානයට ඉරිදා උදේ දිව්‍ය පූජාව සඳහා ඇදී ආහ. අලුත් දෙව්මැඳුරක අවශ්‍යතාවය තදින් දැනුනු මේ මොහොතේ එවකට කොළඹ අගරදගුරු අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් විසින් 1960 මැයි 26 සෙනසුරාදා නව දෙව්මැඳුරක් ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී. නව දෙව්මැඳුර 1962 ආසිරිගන්වන ලදී.

1979 මොරටුව මීසමෙන් වෙන්කොට අඟුලාන, ලුනාව එක්කොට මොරටුව උතුර මීසම වශයෙන් නම් කොට නව මීසමක් බවට පත් කෙරින. මෙම නව මීසමේ ප්‍රථම මීසම් සේවක ගරු ජෝන් ගෝමස් පියතුමා විය.

1998 අගෝස්තු 16 පැවැත්වූ මීසමේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය දිනදී රාජේශ්වරී දෙව්මැඳුරේ අල්තාරයට ඉහළින් දේවමාතා දර්ශනයක් ඇතිවූ අතර එය සියැසින් දුටුවෝ කීපදෙනෙක් වූහ. අදටත් එම දර්ශනයේ ඡායාවන් එම බිත්තිය මත දක්නට ලැබේ. වත්මන් මීසම් සේවක ගරු ටිරෝන් පෙරේරා පියතුමාගේ අප්‍රතිහත ධෛර්යයෙන් සහ එතුමාගේ මූලිකත්වයෙන් 50 වන ජයන්ති වසර සැමරීම සඳහා සියලු කටයුතු සූදානම් කර ඇත. දෙව්මැඳුරේ ඉදිරිපත් වෙනස් කොට ගොතික් හැඩයට අලංකාර ලෙස සකස් කිරීම, දෙව්මැඳුර දෙපස සහ ඇතුලත ප්‍රතිසංස්කරණය කිරීම, දෙව්මැඳුරු භූමිය අලංකාර කිරීම, නව දෙමහල් මීසම් ගෘහයේ වැඩ නිම කිරීම ආදී වැඩ කටයුතු නිමකර ඇත.

මර්වින් කුරේ

# දළුපත මීසමේ දිව බොදුන් උළෙළ

දළුපත මීසමේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්ලය පසුගියදා පවත්වනු ලැබීය. පෙරහර දළුපත ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන්ගේ සිද්ධස්ථානයෙන් අරඹා, මඟ දෙපස අලංකාර මණ්ඩප වලට වැඩම කරමින්, පල්ලන්චේනවත්ත ආරෝග්‍ය මාතා දෙව් විමනට පැමිණි පසු, දළුපත මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් ජුලියස් පියතුමා පැමිණි පිරිස දිව්‍ය සත්ප්‍රසාදයෙන් ආසිරි ගන්වන ලදී.

සියළු සංවිධාන කටයුතු දළුපත, පල්ලන්චේනවත්ත, නෙළුම්පිටිය මීසම් ජනතාව සමිති සමාගම් මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් ජුලියස් සහයක ගරු සජිත් අරුණ පියතුමන් සහෝදර තුමා සහ පැවදි සොයුරියන් සමඟ සිදුකළහ. පල්ලන්චේනවත්ත දෙව් විමනේ පැවති දිව්‍ය පූජාවේදී ශාන්ත ජෝශප් (මීගමුව) ශාඛා විදුහලේ ආචාර්ය ගරු ශ්‍රියන්ත රත්නසේකර පියතුමා අරුත්බර දෙසුමක් පැවත්විය.

ඡ්. කොල්වින් ප්‍රනාන්දු


## රන්පොකුණුගම මංගල උළෙළ 15 වන වරටත්

රන්පොකුණුගම කන්‍යමරිය රාජේශ්වරියගේ වාර්ෂික මංගල්ලය 15 වන වරටත් නිට්ටඹුව මීසම් සේවක ගරු ප්‍රැන්සිස් ජයකොඩි හා සහයක ගරු අසිත පියතුමන්ගේ මෙහෙයවීමෙන් පැවැත්විණ. වැලිවේරිය සහයක ගරු දිනේෂ් ප්‍රශාන්, දළුගම සහයක ගරු දිනේෂ් ගයාන් පියතුමන් නොවාන සමයේ දෙසුම් පැවැත්විය.

මංගල මෙහෙය ධර්මදූත සේවා කලාපීය නාහිමි අතිගරු සිරිල් ගාමිණී පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර ඊට රන්පොකුණුගම විහාරාධිපති පූජ්‍ය බෝලියද්දේ විමලධර්ම ස්වාමින්වහන්සේද සහභාගි වූහ.

මයිකල් සෙබස්තියන් සෝමරත්න

# ග්වාඩලූපේ සළු රැළි අතර සැඟවුණු
# කන්‍යමාතාවන්ගේ පණිවුඩය



**දිනය 1531 දෙසැම්බර් 09 වන සෙනසුරාදා විය. මැක්ෂිකෝවේ සිටි ජුවාන් දියාගෝ නමැති සාමාන්‍ය ගොවියකු එදින දිව්‍ය පූජාවට සහභාගි වීම සඳහා ටැපැයැක් නැමති කන්ද අසළින් යන විට ඔහුට කඳු මුදුනට කැඳවන ඉමිහිරි සංගීතයක් සමඟ ගැහැනු කටහඬක් ඇසිනි. කඳු මුදුනට ගිය ඔහුට දක්නට ලැබුනේ තමා කන්‍ය මරියාවන් බව ප්‍රකාශ කරන අතිශයින්ම රූමත් කාන්තාවකි. "මේ ස්ථානයේ දෙව්මැඳුරක් ඉදිකරනු ලැබීම මාගේ ආශාවයි...., මම සත්‍ය වශයෙන් ම ඔබේ දයාභරිත මාතාවන් වෙමි, මට ආයාචනය කරන සියල්ලන්ගේත් මා කෙරෙහි විශ්වාසය තබන සියල්ලන්ගේත් හඬා වැලපීම් වලට මම සවන් දෙමි. මම ඔවුන් මාගේ හදවතට ගෙන ඔවුන්ගේ දුක් පීඩා හා ශෝක සුව කරන්නෙමි" එතුමිය ජුවාන් දියාගෝ වෙත දුන් පණිවුඩයේ එසේ විය.**

රදගුරුතුමා හට මේ බව කියන ලෙස එතුමිය ජුවාන්ට උපදෙස් දෙයි. ඔහු මේ පණිවුඩය රදගුරුතුමාට පැවසූ නමුත් ජුවාන්ගේ කතාව එතුමා විශ්වාස කළේ නැත. ඔහු නැවතත් කන්ද අසළට ගොස් මෑණියන් හමු වූ විට එතුමිය පවසන්නේ නැවතත් උත්සාහ කර බලන ලෙසයි. දෙවන වර ජුවාන් රදගුරුතුමා හමුවට ගිය විට රදගුරු තුමා කියන්නේ ඒ ස්වර්ගයේ අප මෑණියන් වහන්සේ ම දැයි දැන ගැනීමට සලකුණක් වුවමනා බවයි. රදගුරුතුමාගේ මේ ඉල්ලීම ඔහු කන්‍ය මාතාවන්ට දන්වයි. පසුදින ටැපැයැක් කන්ද ළඟට ආ විට ඒ ඉල්ලීම ඉටුකිරීමට එතුමිය පොරොන්දු වෙයි. පසුදින ජුවාන්ට කන්ද මතට යාමට නොහැකි වූ නිසා දින කිහිපයකට පසුව දේවමාතාවන් කන්දෙන් බැසවිත් ජුවාන්ට පවසන්නේ කන්ද මුදුනට ගොස් එහි ඇති මල් රැගෙන එන ලෙසටයි. එහි ගිය විට ඔහුට දක්නට ලැබුණේ පුදුම දර්ශනයකි. කටු පඳුරු, වල් පැලැටි වලින් පිරී තිබුණු කඳු මුදුනේ ඉතා අලංකාර රෝස උයනක් විය.

ඔහු මෑණියන් වෙත ගෙනා මල් එතුමිය ජුවාන්ගේ සළුවේ (ටිල්මාවේ) පිළියෙල කර තබා එම සළුව රදගුරුතුමා වෙත රැගෙන යන්නට කියයි. ජුවාන් රදගුරුතුමා වෙත ගොස් ටිල්මාව දිගහැර රෝස මල් බිමට හලයි. එවිට මහා පුදුම සලකුණක් සළුවේ දක්නට ලැබේ. දේවමාතාවන්ගේ අතිශය අලංකාර පින්තූරයක් එහි දිස්වෙයි. රදගුරුතුමා හා එහි සිටි සියල්ලෝ විශ්මයෙන් විශ්මයට පත් වේ. වැඩිකල් නොගොස් එතුමියගේ ගෞරවය පිණිස ටැපැයැක් කන්ද මත දේවස්ථානයක් ඉදි වේ. වර්තමානයේ මිලියන හතකට වැඩි සංඛ්‍යාවක් ජනයා මැක්ෂිකෝවේ ගුවාඩලූපේ එම සිද්ධස්ථානය වෙත අවුරුදු පතා පැමිණෙති.

මේ සිද්ධිය සත්‍ය බව ශුද්ධෝත්තම පියතුමන්ලා ආරම්භයේ සිට පිළිගෙන ඇත. 1999 ජනවාරි 23 දා දෙවැනි ජුවාන් පාවුළු පාප් වහන්සේ කන්‍ය මෑණියන් මුළු ඇමරිකාවේම මෑණියන් ලෙස ප්‍රකාශ කළ සේක. 2002 ජුලි 31 දා ජුවාන් දියාගෝ ශුද්ධවරයට ඔසවන ලද්දේ ද එතුමා විසිනි.

මිහිපිට ඇති ස්වර්ග යෙන් දෙන ලද දේව මෑණියන්ගේ එකම ස්වරූපය මෙය බව පිළිගැනේ. මෙම ටිල්මා සළුවක සාමාන්‍ය පැවැත්ම අවුරුදු 30 ක් පමණ වූවත් මේ ආශ්චර්යමත් සළුව හා එහි සලකුණ තෙතමනයට, ස්පර්ශයට හා ඉටිපහන්වල උෂ්ණත්වයට ඔරොත්තු දෙමින් වසර 475 ක් පුරා අද දක්වා නොවෙනස්ව පවතී. එතුමිය ගේ පිංතූරය හා සලකුණු අනුව නව ධර්මයක් එනම් ක්‍රිස්තු ධර්මය ලොව පුරා ව්‍යාප්ත කරමින් තම පුත්‍රයාණන් ලොවට ගෙනෙන බව පෙන්වා දෙයි. මේ දර්ශනය ශු. බයිබලයේ එළිදරව්ව පොතේ ඇති ස්ත්‍රියගේ සංකේතය බවට සැකයක් නැත. "අහසේ පුදුම දර්ශනයක් විය. එනම් සූර්යයා පැළඳගෙන පාද යට සඳ මඬල ද, හිස මත තාරකා දොළොසකින් යුත් කිරුළක් ද ඇති ස්ත්‍රියකි" (එළිදරව්ව 12:1). දේව මාතාවන් ආත්ම ශරීර පිටින් ස්වර්ගයට වැඩීම හා එතුමියගේ උපන් මංගල්‍යයේ අසිරිය සමරන මේ කාල පරිච්ඡේදය තුළ අප එතුමියගේ පණිවුඩයට විවෘත විය යුතුමය.

"මා ඔබේ රැකවරණයත්, ආරක්ෂාවත් නොවේ ද? ඔබේ ජීවිතයේ ගලා යන දිය උල්පත මා නොවේ ද? සළුරැළි සෙවනේ සැඟවුණු දැතින් මා ඔබ වැළඳ නොගන්නෙම් ද? ඉතින් මගෙන් ඔබට තවත් අවශ්‍ය කුමක් ද?" මේ එතුමිය එදා ටැපැයක් කන්ද මත දී පැවසූ වදන් ය. අපත් මේ හඬට සවන් යොමු කළ යුත්තෙමු. එතුමියගේ එකම ඉල්ලීම වූයේ ලෝකයේ විවිධ දුක් වේදනා, අවශ්‍යතා, අභාග්‍යයන්ට ප්‍රතිකාර කිරීමට නම් මා සොයා එන්න, මා හට ප්‍රේම කරන්න, මා හට යාච්ඤා කරන්න යනුයි. මේ විශ්වයේ ගැලවීමේ ප්‍රධාන රහස දන්නේ කන්‍ය මරියතුමිය බව සිතින් අදහමින් එතුමියගේ පණිවුඩයට අප හිස නැමිය යුත්තෙමු.

**පර්මිලා මධුෂානි පතිරණ**
අතුරුගිරිය

# ජීවනදායක භෝජනය මමය
## (ජොහාන් 6:35)

**උපතින්ම කතෝලිකයකු නොවන මම වෙනත් ආගමක සිට කතෝලික ධර්මය වැළඳ ගත් අයෙකු වෙමි. සෑහෙන කාලයක් මෙම ධර්මය අධ්‍යයනය කොට මාගේ මනසින් මා එය විමසා බලා ප්‍රශ්න කර ගනිමින් මා එය සත්‍ය වූ පිළිගත හැකි සැබෑම සත්‍ය ධර්මයක් බව මාගේ හදවත පිළිගැනීමෙන් පසු මුළු හදින් පිළිගෙන අදහා ගත් අයෙකු වෙමි.**

සාමාන්‍ය දැනුම් තත්ත්වයක් මට හිමි ව උපතින් තිබූ නමුත් ඉන් එහාට විහිදුන විසල් ප්‍රඥාවක් මා මෙහෙයවන බව හොඳාකාරවම මට දැනේ. ප්‍රඥාවේ උල්පත වන පරිශුද්ධාත්මයාණන්ට සදා තුති පුදමින් ප්‍රශංසා කරමින් මෙම කතෝලික පුවත්පතට පළමු වරට ලිපියක් ඉදිරිපත් කරමි. එදා අගෝස්තු 05 වන දා ඉරිදාවක් විය. එදින දිව්‍ය පූජා යාගයේ තේමාව වූයේ, "දෙවියන් වහන්සේ ජීවනදායක භෝජනය ස්වර්ගයෙන් අපට දුන් සේක" යන්නයි. එදින පියතුමාගේ දෙසුම ඇසූ මා ඇතුලු සැම දෙනෙක්ම ජේසු සමිඳාණන්ටත් දිව්‍ය යාගයට හා දිව්‍ය සත්ප්‍රසාදයටත් ඇති ලැදිකම බොහෝ ගුණයකින් වැඩිකර ගන්නට ඇතැයි මට සිතුනි. ඉතාමත් බැතියෙන් සිදුකළ දිව්‍ය යාගය තුළ දී එතුමා කළ තේමාවට සම්බන්ධ කෙටි දෙසුම අතරතුර දිව්‍ය යාගයේ බලය තමන්ට තම මීසමේම දෙදෙනෙකු විසින් කළ සාක්ෂි දෙකක් සමඟ සඳහන් කළහ. කෙටියෙන් එය මෙසේ ය.

තම ශරීරය ඉතාමත් දුර්වල වූ මානසික පීඩනයකට පත් වූ ස්ත්‍රියක් පියතුමාගෙන් එයට සහනයක් පැතීය. එතුමා ඇයට කියා ඇත්තේ තමා සිටින තත්ත්වයෙන්ම දිනපතා දිව්‍ය යාගයට බැතියෙන් සහභාගි වී විශ්වාසයෙන් දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගන්නා ලෙසයි. දෙවෙනි පුද්ගලයා ද ස්ත්‍රියකි. ඇය පියතුමාට අනාවරණය කළේ, ඇයට ආහාර ගැනීමට පවා අපහසු වීමට හේතුවත්, ශරීරයේ ඇති වේදනාවට හේතුවත් යමෙකු විසින් කළ යක්ෂ ක්‍රියාවක් බවය. පියතුමා ඇයට සවන්දී දුන් පිළිතුර පළමු කාන්තාවට දුන් එකම විය. කෙසේ වුවද තමා රැකියාවක නිරත වී ඇති නිසා උදෑසන දිව්‍ය යාගයට පැමිණීමට නොහැකි බව ඇය පවසා ඇත. මසකට පමණ පසු පළමු කාන්තාව පියතුමා හමු වී දිව්‍ය යාගයේ / දිව්‍ය සත්ප්‍රසාදයේ බලය තමා අත්දුටු බවත් තමා සම්පූර්ණයෙන්ම සුව වී ඇති බවත් කීවාය. දෙවන කාන්තාව ද මාස තුනකට පමණ පසු පියතුමා හමු වී තමා රැකියාවෙන් අස් වූ බවත් දිනපතා දිව්‍ය යාගයට පැමිණ ජීවමාන සමිඳුන්ගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය දිනපතා විශ්වාසයෙන් ලබා ගත් බවත් පැවසුවාය. ඇය ද සම්පූර්ණ සුවය ලබා බියක් නොමැතිව සතුටින් ජීවත් වන බව



කීවාය. ජේසු සමිඳාණන්ට සදා ප්‍රශංසා වේවා. මෙම සත්‍ය සිදුවීම තුළින් දිව්‍ය යාගයේ සුවදායක බලය අපට දෙසුම තුළ දී අණාවරණය කළ පියනමට අප සැමගේ ස්තූතිය අනිවාර්යයෙන්ම හිමිවිය යුතුයි. තම දෙසුම අවසානයේ දී තවත් සත්‍ය සිදුවීමක් අප හට උගන්වන්නට එතුමාව සුදතුමාණෝ මෙහෙය වූ බව මා හට සිතුණි. එය සීතල රටක සිදුවූ සිද්ධියකි. එය කෙටියෙන් මෙසේ පවසමි.

එක් දුගී මහළු කාන්තාවක් දිනපතා දිව්‍ය යාගයට සහභාගි වීමට පුරුදු වී සිටියාය. දිනක් ඇයට ආහාරයට කිසිවක් නොවූ නිසා, මස් වෙළෙඳ සැලක් වෙත ගොස් එහි අයිතිකරුගෙන් තම ආහාරය පිළියෙල කිරීම සඳහා මස් ස්වල්පයක් ඉල්ලා සිටියාය. අයිතිකරු අපහාසාත්මක ස්වරයෙන් මස් දෙන්න ඔබ මට කුමක් දෙනවාදැයි ඇසුවාය. එයට ඇය දුන්නේ අසාමාන්‍ය පිළිතුරකි. "මම ඔබ වෙනුවෙන් දිව්‍ය යාගයට සහභාගි වන්නම්" ඇය කීවාය. එයට වෙළෙඳසැල්කරු ද අසාමාන්‍ය පිළිතුරක් දුන්නේය.

"ඔබ දිව්‍ය යාගයට සහභාගි වී, ඒ බව කඩදාසියක ලියා පැමිණෙන්න" යනුවෙනි. තරමක වේලාවකට පසු ඇය පැමිණ කඩදාසිය එක පැත්තකට දමා කුඩා මස් ප්‍රමාණයක් අනික් පැත්තේ තරාදියට දැමීය. පුදුමයකට කොළ කැබැල්ලේ බර වැඩි විය. ඊළඟට තරාදියට දැමූ මස් ප්‍රමාණය කොපමණ වැඩි කළ ද, කොළ කැබැල්ල බර වැඩි බව තරාදිය තහවුරු කරන ලදි. වෙළෙඳ සැලේ හිමිකරු ද එහි සිටි අන් අය ද දිව්‍ය යාගයේ විශ්මිත බලය අවබෝධ කරගත්හ. අහිංසක දුගී කාන්තාවකට සමිඳාණෝ විශ්වාසවන්ත වූ ආකාරය ගැන මම බොහෝ වේලාවක් මෙනෙහි කළෙමි. මේ සිදුවීම අන් අය සමඟ බෙදා ගන්නට ද තීරණය කළෙමි. දිව්‍ය යාගයන් සැම උදෑසනකම සිදුකරන බොහෝ දෙව්මැඳුරු මේ කුඩා දූපතේ ඇති බව මම අසා ඇත්තෙමි. තවද සමෘද්ධිමත් බොහෝ රටවල කතෝලික දෙව්මැඳුරු වැසී යන බවත් මම අසා ඇත්තෙමි. අප රටේ දෙව්සත්හල් වලට ඇතුළු වන දරුවන් අන් රටවල් හා සසඳන විට ඉහළ බව ද දැනුවත් වී ඇත්තෙමි. එයට හේතුව මා සිතන ආකාරයට බැතිමත් පවුල්වල දෙමාපියන්ගේ යහපත් ආදර්ශයත් ඔවුන්ගේ කතෝලික වටිනාකම් නිසාත් ය. අපගේ උපතේ සිට මරණය දක්වාම ආධ්‍යාත්මික ජීවිතය, පෝෂණය කරන්නට තම උතුම් දේව කැඳවීම අනුව තරුණ ජීවිත මුලුමනින්ම කැප කරන සමිඳුන් තිළිණ කරන විවිධ ආධ්‍යාත්මික හැකියාවන් තුළින් අප සැම දෙවිඳුන් වෙතටම යොමු කරන පියතුමන් දෙස ස්තූති පූර්වක දැසින් බලමු.

මේ ලිපිය අවසාන කිරීමට පෙර මා මිතුරියක් මා හට සඳහන් කළ සත්‍යයක් ඔබ හමුවේ තබමි. ඇය කීවේ තම එකම පුතු ඕස්ට්‍රේලියාවේ සිටියත්, ඔහු එහි ඉතාමත් සාර්ථක දිවියක් ගත කළත්, තමාට එහි එන ලෙස නිතරම අයැදුවත්, දිනපතා දිව්‍ය යාගයට සහභාගිවීමේ භාග්‍යය අහිමි වන නිසා තමා එම රටේ පදිංචියට නොයාමට තීරණය කළ බවයි.

**භාග්‍යා**
ගල්කිස්ස

# අපට රජෙක් ඇත

සැබෑ කිතුනුවන්ගේ රජතුමා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේගේ රාජ්‍යයේ අපි පුරවැසියෝ වෙමු. දෙවියන් වහන්සේ සිය ජනතාව දිවැසිවරුන් හා විනිශ්චයකරුවන් මඟින් දස රාජධර්මයෙන් පාලනය කළ ද ජනතාව රජ කෙනෙක් ඉල්ලා සිටියහ. "මනුෂ්‍යයෙක් රජකමට පත් වූ විට ඔහුගේ ක්‍රියා කලාපය මෙසේ අපට උන්වහන්සේ කියා දුන් සේක. ඔහු ඔබගේ පුත්‍රයන්ගෙන් තමාගේ රියදුරා හා අසරුවන් වශයෙන් තමාගේ රථ වලට පෙරටුව දුවන පිණිස පත් කර ගන්නේ ය. ඔහු ඔබේ දූවරුන් සුවඳ ද්‍රව්‍ය සාදන පිණිසද රොටි පුලුස්සනු පිණිස ද ගන්නේ ය. ඔහු ඔබේ කෙතෙන් ද මිදි වතු ද ඔලිව් වතු අතරින් ඉතා හොඳ ඒවා රැගෙන තමාගේ නිලධාරීන්ට දෙන්නේ ය. ඔබේ ධාන්‍ය වලින් දසයෙන් කොටස් ගෙන තමාගේ රජ වාසලේ නිළධාරීන්ටත් සෙසු නිළධාරීන්ටත් දෙන්නේ ය. ඔබේ දැසි දාසින් ද ඔබේ හොඳම ගවයන් ද කොටලුවන් ද තමාගේ වැඩට පත් කර ගන්නේ ය. (1 සාමුවෙල් 8:11-17)

උන්වහන්සේ එදා පහදා දුන් මෙම ක්‍රියාවලිය අද ලෝකයේ රටවල්වල සිදුවන්නේ නැතැයි කාට නම් කිව හැකි ද?

මෙතෙක් අප පත් කරගත් රජතුමන්ලා මම යහපාලනයක් ඇති කරමි. බඩුමිල අඩු කර පඩි වැඩි කර රැකියා සපයමි. මාධ්‍ය නිදහස රකිමි දූෂණය භීෂණය හොරකම නැති කරමි. යනුවෙන් පොරොන්දු දුන්නද වසර හැටක් මේ රටේ රජ පුරවැසියන් වූ අප තවමත් රජයෙන් දෙන ආධාර මත යැපෙමින් සිටී. අපේ රට ලෝකයේ පොහොසත් රටවල් වලින් ලැබෙන ආධාර මත යැපෙමින් තිබේ. රාජාති රජුගේ පාලනයට යටත් වන තුරු මේ තත්ත්වයෙන් මිදීමට නොහැකි වනු ඇත. හුස්ම තිබෙන මනුෂ්‍යයා තවත් විශ්වාස නොකරන ලෙස දෙවියන් වහන්සේ අපට කියන සේක.

පොළොවේ දේශපාලන රාජ්‍යයත් සදාකාලික දේව රාජ්‍යයත් අතර වෙනස වටහා ගැනීමේ කාලය එළැඹී ඇත. මෝසෙස් ඊශ්‍රායෙල් ජනතාවට ගලේ කොටා දුන් / ක්‍රිස්තුන් වහන්සේ අපගේ හදවතේ කොටා ඇති දේව ව්‍යවස්ථාවත් මිහිපිට රාජ්‍යවල ක්‍රියාකාරිත්වයත් අතර වෙනස ඉතා පැහැදිලිය. දෙවිඳුන්ගේ පනත් සර්ව සාධාරණය යුක්ති ගරුකය. දේව ව්‍යවස්ථාව හෙවත් ශුද්ධවූ බයිබලය මිනී නොමරව යනුවෙන් සඳහන් කර සැම මනුෂ්‍යයකුටම නිවහල්ව නිදහස්ව ජීවත් වීමේ අයිතිය තහවුරු කර ඇත. (නික්මයාම 20:13). එහෙත් පොළොවේ බලධාරීන් තම විරුද්ධවාදියා අතුරුදන් කිරීම හෝ ඝාතනය කිරීමේ රහස් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරති. දේව ව්‍යවස්ථාව වරද ඔප්පු කරන තුරු චූදිතයා නිදහස් බව පිළිගනී. (නික්මයාම 20:16). එහෙත් පොළොවේ බලධාරීන් විරුද්ධවාදියා අත්අඩංගුවට ගෙන දඬුවම් කිරීමට වරද සොයති. දේව ව්‍යවස්ථාව භූමියේ ඵලය සාධාරණව බෙදා ගත යුතු බව පවසයි. එහෙත් පොළොවේ බලධාරීන් භූමිය කුණු කොල්ලයට ගෙන තම මඩිය තර කර ගහ කොළ වනසා පරිසරය ද දූෂණය කරති. දේව ව්‍යවස්ථාව සාධාරණ නඩු විභාගයක් සැමට ලබා දිය යුතු බව අවධාරණය කරයි. ජනතාව අවුරුදු ගණන් රිමාන්ඩ් භාරයේ තබා ඇත. දෙවිඳුන්ගේ අණ පනත් පිළිනොපැදීමෙන් ශරීරයට දඬුවමක් මිහිපිට නොලැබුණ ද ස්ථිරවම ආත්මයට සදාකාලිකව දඬුවම් ලැබෙන්නේ ය.

☛ 15 පිටුවට

**සුනිල් ජැක්සන් ප්‍රනාන්දු**
කඩලාන - මොරටුව

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## පළමු සතිය සිකුරාදා උදා යාම යැදුම

### 51 වැනි ගීය

(ආ) වගන්ති 3 - 5

සැබෑ පසුතැවීමක පදනම වන්නේ අවංක ලෙස තම පාපී තත්ත්වය වටහාගෙන ඉන් හැරීමට පියවර ගැනීමයි. එමගින් දේව සාධාරණත්වය වෙත යොමු වී උන්වහන්සේ වෙතින් සමාව, නිවහල් බව සහ සැබෑ ආනන්දය හිමි කර ගැනීමට සැදැහැවතාට හැකිවේ.

මැනවින් දනිමි :

හෙබ්‍රෙව් බසින් යෙදෙන "යදා" යන ක්‍රියා පදයෙන් හුදෙක් ඥාණික දැනුම පමණක් නොව අත්දැකීමෙන් ලබන අවබෝධය ද ධ්වනිත කෙරේ (ගීතා 38:4-5).

ඔබට එරෙහිව :

ගිවිසුම් ජීවිතය සිහිපත් කරමින් දෙවියන් වහන්සේ වෙත පසුතැවිල්ලෙන් හා අවංකව විවෘත වීම විදහා දැක්වේ. (2 සාමුවෙල් 12:13). දෙවියන් වහන්සේට එරෙහිවීම සහෝදර ජනතාවට ද එරෙහි වීමක් වේ (උත්පත්ති 39:9).

කෙලෙස් මලින් යුතුවයි මා මව් කුසේ පිළිසිඳුණේ :

ගීයේ මේ පදවැල් තුළින් පිළිබිඹු වන්නේ ගීතාවලි කතුවරයා තමන් ජීවත්වන පරිසරය තුළ අත්දකින පාපී ස්වභාවයයි. මෙවැනි යෙදුම් ශුද්ධ ලියවිල්ලේ විවිධ ලේඛන සම්ප්‍රදායන්හි දැක්වේ (උත්. 8:21, ජෝබ් 14:4, ගීතා 143:2).

ආසිරිපැන් ඉසිනු මැනවි:

හෙබ්‍රෙව් පිටපතෙහි දැක්වෙන්නේ "හිසොප් මඟින් ආසිරි ජලය ඉසිනු" යනුවෙනි. හිසොප් නැමති කුඩා ශාකයේ අතු කොටස් මෝසෙස්ගේ නීතිය අනුව ආසිරි ජලය හෝ යාගික රුධිරය ඉසීමට භාවිත කෙරුණු අතර ඉන් දෙව් ආසිරි ලැබීමට සුදුසු වීම නොහොත් පවිත්‍රවීම අවධාරණය කෙරිණි. (නික්ම 12:22, හෙබ්‍රෙව් 9:19).

ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(24)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

සතුට හා සොම්නසඃ දෙව් සමිඳුන්ගේ සමාවේ තිළිණය තුළින් උදාවන ඇතුළාන්ත නිදහස හා පරිණාමය කෙරෙහි සැදැහැවතාගේ මූලික ප්‍රතිචාරය වන්නේ සතුට හා සොම්නස බවයි මින් දැක්වෙන්නේ.

මවා වදාළ මැනව :

පුරාණ ගිවිසුමෙහි ග්‍රන්ථ අවධාරණය කරන පරිදි මැවීමේ ක්‍රියාවලියේ ("බාරා" හෙබ්‍රෙව් වදන) කතුවරයා දෙවියන් වහන්සේ වන සේක. (උත්. 1:1,27). පසුතැවිලි වන සැදැහැවතා නව ජීවයක් අත්දකියි. නිර්මල සිත සහ නව ආධ්‍යාත්මය යන යෙදුම් මෙම යථාර්ථය විදහා දක්වයි. (එසකියෙල් 36:25-27, ජෙරමි 32:31).

(ඇ) වගන්ති 6 - 15:

ගීතාවලිය කතුවරයා මෙම අවසන් කොටසින් පැහැදිලි කරන්නේ සිත් හැරීමේ හා පව් සමාවේ ගැඹුරු අත්දැකීම නිසා උදාවන ධනාත්මක ප්‍රතිඵලය.

ලබන සතියට

සතියේ මෙනෙහි කිරීම

# "ස්වාමිනී අප කවරකු වෙතට යන්නද?"

## අගෝස්තු 26 - සාමාන්‍ය සමයේ විසිඑක්වන ඉරුදින

*ගිවිසුම් ජීවිතයකට කැඳවීම: මිනිස් සිතුම් පැතුම් ආකල්ප අත්දැකීම් ඉක්මනින් වෙනස්වන සුළුය. එපමණක් ද නොව මිනිසා තම වාසියට හැම දේම වෙනස් කරන්නට සිතයි. සමූහයක් ලෙස ජීවත් වන විට දිවි ගමනට හෙවත් දිගු ගමනට මෙම ස්වභාවය බාධා පමුණුවයි. එ නිසා ගිවිසුමකින් බැඳී කටයුතු කිරීම සැමට සුබදායකය. එවැනි ගිවිසුම් දිවියක් සඳහා දෙනු ලබන සාංඝික භෝජන දිව්‍ය සත්ප්‍රසාදයයි. එය ප්‍රේමයේ ගිවිසුමක් ද වේ. සිය කැමැත්තෙන් ඊට ඇතුළුවන කිතුනුවාට තම ගිවිසුම් දිවිය ආරක්ෂා කරගන්නට දිව්‍ය සත්ප්‍රසාදය මහා ඖෂධයක් වේ. මෙය පරිත්‍යාගය නිතර මතක් කරන්නකි. කිතුනු අපි ප්‍රේමයේ රස නිතර භුක්ති විඳින පිරිසකි. දෙව් පියාගේ ආදරය රස බලමින් සිටිනා සංඝයකි. අපගේ ජීවිත තුළින් ද මෙම පරිත්‍යාගශීලිබවේ ප්‍රේමය හා ආදරයේ රසය අන් අය වෙත ගලා යනවා ද?*

පවුලක බිරිඳ, ස්වාමි පුරුෂයා ලෙස කරන්නට සිදුවන කැප කිරීම් බොහෝ ය. හදිසි කෝපයට ආවේගයනට ඉඩ නොදීමට අපි වගබලා ගත යුතුවේ. දවස ආරම්භයේ දී මම කොතරම් කැප කිරීම් ප්‍රමාණයක් අද කරනවා ද කියා සිතා බලන්නේ නම් ප්‍රශ්න ඉදිරියේ වැටෙන්නේ නැත. යහපත් හා නිවැරදි ආකල්ප තුළින් සියල්ල බලන්නට ඉගෙන ගත හොත් ජීවත් වීම පහසුය. ජේසුස් වහන්සේගේ ගැළවීමදායක භෝජනය ලබන අපි අන් අයගේ ගැළවීම සඳහා භෝජනයක් වන්නට තරයේ අදිටන් කර ගනිමු. තමන් කරන කැප කිරීම හා පරිත්‍යාගයට ප්‍රති උපකාරයක් ක්ෂණිකවම නොලැබුව ද ඉන් ලැබෙන ආනිසංස කිසි දිනෙක මැකී යන්නේ නැත. "රහසින් කරන දේ දකින ඔබේ පියාණන් වහන්සේ ඔබට පල විපාක දෙන සේක" (මතෙව් 6:18). අප කරන සියල්ල බැලිය යුත්තේ හා මිණිය යුත්තේ ජේසුස් වහන්සේගේ ප්‍රේමය පදනම් කරගෙනය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන සැම දෙනාම සැම තැනම සැම විටම අලුත්වන පිරිසකි. කිසිදු ප්‍රශ්නයකින් පරාජය නොවන සැම දේකටම මුහුණ දෙන්නට ශක්තිමත් පිරිසකි.

**අත්දැකීම් මත තීරණයක් :**

ඊශ්‍රායෙල්වරුන්ගේ නායකයින් ද ප්‍රධානීන් ද කැඳවා එකමුතුව තීරණයක් ගන්නට තිබුණු අවස්ථාවකි. ඔවුන් ඉතිහාසයේ ලැබූ අත්දැකීම් හා සාක්ෂි දැරීම් මත පිහිටා "අපි සමිඳාණන් වහන්සේ අත්නොහරිමු" කියා එක් හඬින් ප්‍රකාශ කළෝය. මෙය ඔවුන්ට තිබූ ලොකුම පරීක්ෂාව වන රූප වන්දනාව නැති කරගැනීමටත් සමිඳාණන් වහන්සේ මත යැපෙන්නටත් ගත් සාමූහික පියවරකි. බුද්ධිමත් තීරණයකි. සියලු දෙනාම පැමිණි මෙම එකඟත්වය ඉතා අගය කොට සැලකිය යුත්තකි. එකිනෙකා එකිනෙකාට මතක් කරන්නකි. ජේසුස් වහන්සේ සිය සෙනඟට එකම ආහාරයකින් බැඳී සිටින්නටත් සංඝයක් ලෙස රැඳී සිටින්නටත් ආරාධනා කළ අවස්ථාවේ දී "බොහෝ ජුදයින්" එම ස්ථාවරත්වයකට එන්නට අදි මදි කළෝය. ඔවුන් තුළ වූ සැලෙන විශ්වාසවන්තකම හා අහංකාරය ඊට හේතු විය. ජේසුස් වහන්සේගේ ආරාධනයට ඔවුන් සෘජුවම පිළිතුරු නුදුන්නා පමණක් නොව රහසින් උන්වහන්සේට විරුද්ධව මැසිවිලි ද කීහ. ජෝෂුවා ඉදිරියේ එක් හඬින් "එසේය" කියා දේව කැමැත්ත පිළිගත් ජනතාවත්, ජේසුස් වහන්සේ ඉදිරියේ කුහක හා කපටි ලෙස සිතන ජනතාවත් සසඳා බලන්නට, මා ඉන් කුමන කණ්ඩායමකට අයත් වන්නේ ද කියා සිතා බලන්නටත් මෙය කදිම අවස්ථාවකි. මේ දක්වා මා සමඟ පැමිණි ස්වාමින් වහන්සේ මට උතුම් දේවල් ගැන කෘතඥතාවයක් හා සිහිකිරීමක් මා තුළ ඇත්දැයි සිතා බලන්නට යොමු වීම විශ්වාසයේ ගමන සවිමත් කරන්නෙකි.

ස්වාමින් වහන්සේ අපගේ නිදහසට ගරු කරන සේක. ඒ නිදහස තුළ බුද්ධිමත්ව අපගේ අතීතය හා අනාගතය ගැන සිතා පැහැදිලි හා නිවැරදි තීරණ වලට එළඹිය යුතුවේ. අපගේ තීරණය හුදෙක් වර්තමානයටම සීමා නොවේ. ඉතිහාසය මත වර්තමානය පදනම් වන අතර අනාගතයට හොඳ ආරම්භයක් ගන්නට උපකාරී වේ. එපමණක් ද නොව මා අතීතයේ ගත් තීරණවල පලවිපාක වර්තමානයේ දී භුක්ති විඳින අතර වර්තමානයේ දී ගන්නා තීරණවල පල විපාක භුක්ති විඳින්නට යන්නේ අනාගතයේ දී බවත් අමතක කළ යුතු නොවේ.

දෙවියන් වහන්සේගේ යහපත්කම නිතර භාවනා කළ යුතු වේ. බිඳුනු සිත් ඇත්තන්ට ළං වන තැළුනු හදවත් ඇත්තන්ට පිහිට වන දම්වුන් ආපදා වලින් මුදාලන ඔවුන්ගේ පිහිටට සිටින උන්වහන්සේ සමඟ විශ්වාසයේ හා සමීපත්වයේ ගමනක් ගොස් ලබන අත්දැකීම් අනාගත තීරණ වලට පාදක විය යුතුවේ. "හැම වෙලේම හිමිතුමන්ට ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැනුම් මා මුවින් තොර නොවේ" යන පද වැල බොහෝ දේ අපට අද ඉඟි කරන්නේ ය.

**සමාජයට :** වර්තමානයේ විශ්වාසයට අභියෝග රාශියක් ඇත. දෙවියන් වහන්සේගෙන් මිනිසා ඈත් කරන බලවේග බොහෝ ය. නමුත් අවසාන තීරණය ගන්නේ තමා ය. එය හුදෙක් හැඟීම් මත නොව විශ්වාසයේ අත්දැකීම් මත පදනම් විය යුතු වේ. විශ්වාසයේ අත්දැකීම් මගේ පෞද්ගලික ජීවිතයට සීමා නොවේ. රටක් ජාතියක් ආගමක් සභාවක් පවුලක් ලෙස අප ලබනා සියලු භාග්‍යයන් ගැන ද මා සිතිය යුතුවේ. ඒවා සංඝය වෙත ළඟා වීමෙන් මම ද ඒවායේ ඵල භුක්ති විඳින්නේ ය. මෙසේ බැලුවහොත් කිසි දිනෙක සමිඳාණන් වහන්සේගෙන් පිට ගමන් කිරීමට නොහැකි බව පැහැදිලිය. උන්වහන්සේ අපට ජාතියක් ආගමක් ලෙස නැගී සිටින්නට දී ඇති බොහෝ තිළිණයන් අසීමිතය. පේදුරු තුමා "ඔබ හැර අප කවරකු වෙත යන්නද?" යන නිර්භීත ප්‍රකාශනය මෙසේ මුළු ගැළවීමේ ඉතිහාසයම අවධානයට ගත් අවස්ථාවක් බව පැහැදිලිව පෙනෙන්නට ඇත.

ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ බැම්මෙන් ගිලිහී තාවකාලික තෘප්තිය පතාගෙන වෙනත් දේවලට අපව ඇද ගන්නා පුද්ගලයෝ අප අතර සිටිති. ජේසුස් වහන්සේගේ අභියෝග බාර ගන්නට බැරි බොහෝ දෙනා උන්වහන්සේ අත්හැර ගිය ද පේදුරුතුමාගේ ස්ථාවරත්වය කදිමය. නායකයෙක් ලෙස විශ්වාසයෙන් බැඳී අධිෂ්ඨානයෙන් යුතුව කටයුතු කළ යුතු වේ. අද තාවකාලික තෘප්තිය හා ආශ්වාදය පතා ගන්නා පටු තීරණ නිසා සමාජයේ දිගු ගමනට බාධා එල්ල වෙමින් පවතී. තමාගේ මුදල් බලය පෙන්වා තවත් කෙනෙකුගේ ආත්ම ගරුත්වය කෙලෙසා බිල්ලට ගැනීමත් දරුවන් හා කාන්තාවන්ගේ ජීවිත අසීමිත ලෙස අපයෝජනය කිරීමටත් පෙළඹෙන්නෝ බොහෝ සිටිති. පවුල් වගකීම් (ගිවිසුම්) ඔවුන්ට නැත. කිසිදා තීරණයකට එන්නට බැරි ප්‍රතිපත්තියක් නැති හිස් පුද්ගලයෝ මේ ගණයට වැටෙති. කුසේ සිටින දරුවන් මරා දැමීමේ වරදට මොවුන් සෘජුවම වගකිව යුතුවේ. මෙසේ බලන විට "තීරණ ගැනීම" යන්න ඉතා වැදගත් කුඩා කාලයේ සිටම හුරුපුරුදු විය යුතු දෙයකි.

**නිතර සිහිපත් කරමු:**

දෙවියන් වහන්සේ සමඟ අප කර ඇති ගිවිසුම නිතර නිතර සිහිපත් කිරීම වැදගත් වේ. එය එක් අතකින් ආරම්භය වෙත යාමකි. මුල අමතක නොවන්නට ඉතිහාසය සිහිපත් කළ යුතුවේ. ප්‍රසාද ස්නාපනය ලබන විට දී අපි එකම දෙවියන්ට පමණක් වන්දනා කරන්නට තෝරා ගනිමු. එම ගිවිසුම සත්ප්‍රසාද වහන්සේ ලබන සැම මොහොතක් පාසා සිහිපත් කරමු. මෙය සමූහය සමඟ ද පෞද්ගලිකව ද කළ යුත්තකි. ස්වාමින් වහන්සේ ලබන්නට මම සමූහයා සමඟ සිටිය ද ඒ සඳහා අවංකවම මා තුළ සැබවින්ම සූදානමක් හා පැහැදීමක් ඇත්දැයි කල්පනා කළ යුතුවේ.

**සිතන්න :** (1) වැදගත් තීරණ ගැනීමේ දී කොතරම් දුරට අපි දේව විශ්වාසයට හා අත්දැකීම්වලට මුල් තැන දෙනවාද? (2) මා ගත් තීරණ සම්බන්ධව කොතරම් වගකීමකින් කටයුතු කරනවාද? (3) සත්ප්‍රසාද වහන්සේ ලබන මා තුළින් කොතරම් දුරට අන් අය ප්‍රේමය හඳුනා ගන්නවාද? (4) කිතුනු සංඝයේ විශ්වාසයේ ගමන සඳහා මාගේ දායකත්වය ගැන මට සංතෝෂ විය හැකි ද?

**ගරු උපුල් සිල්වා පියතුමා**

**ගරු හෙන්රි සිල්වා පියතුමා** 49

# පුරාණ ගිවිසුම තුළ දිවැසිවරු



**පසුගිය සතිය හා සබැඳේ..**

**ගිවිසුම**

දිවැසිවරු හැමවිටම ඉශ්රායෙල් ජනතාව හඳුනා ගත්තේ ගිවිසුමේ ජනතාව ලෙසය. එනම් සීනායි ගිවිසුමේ ජනතාව ලෙසය. එබැවින් ඉශ්රායෙල් ජනතාව වෙනත් දෙවි දේවතාවන්ට වන්දනා කිරීම මඟින් ගිවිසුම කඩ කළ විට, දිවැසිවරු ඔවුන් අපවාදයට ලක් කළහ. දෙවියන් වහන්සේගේ දැඩි විනිශ්චය ඔවුන් මත පැමිණෙන බව ප්‍රකාශ කළහ. එලෙස ඔවුහු ගිවිසුමේ ණය යුක්තීන් පිළිපැදීම සහතික කළහ. ගිවිසුම ඉදිරියට ගෙන ගියහ.

පුරාතන මැද පෙරදිග පැවැති ගිවිසුමක පහත සඳහන් ලක්ෂණ අන්තර්ගත විනි.

1. ගිවිසුම් පාර්ශ්වකරුවන් හඳුන්වා දීම.( විශේෂයෙන් ප්‍රධාන පාර්ශ්වය ) "මම යාහ්වේ දෙවියන් වහන්සේ වෙමි" නික්ම. 20/2

2. ඓතිහාසික ප්‍රස්තාවනාව (ප්‍රධාන පාර්ශ්වය අනෙක් පාර්ශ්වය වෙනුවෙන් කර ඇති දේ ) "වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය" නික්මයා 20/2

3. කොන්දේසි නැතහොත් නීති දස පණත - නික්ම. 20/3-17

4. ගිවිසුම රක්ෂා කිරීමට (පිළිපැදීමට) දිවුරුම් දීම : වාචිකව හෝ සංකේතාත්මක ක්‍රියාවක් මගිනි. (උත්. 15, 7-18)

5. ශාප හා ආශිර්වාද - ද්වි.නී. 28 සහ 29 පරිච්ජේද

6 සාක්ෂිකරුවන් : අනෙක් ජාතීන් අතර විවිධ දෙවිවරු සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටි බව කියැවුනද, බයිබලීය ගිවිසුම්හි සාක්ෂිකරුවන් ලෙස ඉදිරිපත් කෙරෙන්නේ ස්වභාව ධර්මයේ වස්තූන්ය. යෙසායා 1,2. ජෝෂුවා 24, 26-27

7. ගිවිසුම් භෝජනය : මෙමඟින් ප්‍රකාශ වුයේ ගිවිසුම නිසා ගොඩ නැඟෙන සමීප සබඳතාවයයි. නික්ම. 24/11

8. ගිවිසුම අන්තර්ගත ලියැවිල්ල පූජනීය ස්ථානයක තැන්පත් කිරීම සහ වාර්ෂිකව එය කියවීම.

ඉශ්රායෙල් ජනතාව ගිවිසුම කඩ කිරීම පිළිබඳව දිවැසිවරු සඳහන් කරති. (ජෙර. 11 පරි.) ගිවිසුම කඩකිරීමට හේතු වන්නේ එය ද්වි පාර්ශ්වික ගිවිසුමක ස්වභාවයක් ගැනීම නිසාය. ගිවිසුමක් ද්වි පාර්ශ්වික වූ විට අනෙක් පාර්ශ්වයට එය කඩකළ හැකිය. එබැවින් ඉශ්රායෙල් ජනතාව කලින් කලට එය අලුත් කළහ.

**අලුත් ගිවිසුම**

ජෙරමියා, 31/31-34 දක්වා වගන්ති වල සීනායි ගිවිසුමට වඩා වෙනස් වූ නව ගිවිසුමක් ඉදිරිපත් කර ඇත.

**31 වන වගන්තිය** - "... කාලය පැමිණෙන්නේය."

මෙය මානව ඉතිහාසය තුළ දෙවියන් වහන්සේගේ අනාගත මැදහත්වීම පිළිබඳව දිවැසිවර සාහිත්‍යය තුළ දක්නට ලැබෙන පොදු ව්‍යවහාරයකි. "... මම අලුත් ගිවිසුමක් කරන..." මෙහි 'අලුත්' යන වචනය අර්ථ කීපයක් සහිත විය හැකිය. එනම් සම්පූර්ණයෙන්ම අලුත් ගිවිසුමක් හෝ පැරණි ගිවිසුමෙහි අලුත් සංස්කරණයක් හෝ යනුවෙනි. එබැවින් මෙය විසඳා ගැනීම සඳහා අප පැරණි ගිවිසුමේ ග්‍රීක පිටපත (සෙප්ටුවාජින්ත ) වෙත යා යුතුය.

එහි භාවිත වන්නේ, සම්පූර්ණයෙන්ම අලුත් යන අර්ථය දෙන "කයිනේ" යන "Kaine" වචනයයි. මෙයින් අදහස් වන්නේ නව ගිවිසුම හා සීනායි හි ගිවිසුම අතර පැහැදිලි වෙනසක් ඇති බවය. 32 වන වගන්තියේ සඳහන් වන ".... ගිවිසුම මෙන් නොවේ" යන වාක්‍යංශයෙන් මෙය තවදුරටත් සහතික කෙරේ."ඉශ්රායෙල් සෙනඟ හා ජුදා සෙනඟ සමඟ" "ජුදා සෙනඟ" යන යෙදුම: ඉශ්රායෙල් සෙනඟ යන්න පැහැදිලි කිරීම සඳහා පසුකාලීනව එකතු කළ යෙදුමක් බවට විශාරදයන් අතර එකඟතාවය පළ වී ඇත. මෙය "ඉශ්රායෙල් සෙනඟ" යන්න පමණක් දක්නට ලැබෙන 33 වන වගන්තියෙන් වඩාත් පැහැදිලි වේ."ඉශ්රායෙල් සෙනඟ" යන යෙදුමද අර්ථ ව්‍යාකූලය. මන්ද යත් සමස්ත ඉශ්රායෙලයම හෝ උතුරු රාජධානිය පමණක් ඉන් අදහස් විය හැකි බැවිනි. "ගිවිසුම මෙන් නොවේ" මෙහි දි දිවැසිවරයා අදහස් කරන්නේ සීනායි හි ගිවිසුමය. එහි අර්ථය වනුයේ පුරාණ ගිවිසුම වෙනුවට නව ගිවිසුම ආදේශ කෙරෙන බවය. "ඔවුන්ගේ පියවරුන් මා අතින් අල්ලාගෙන මිසර දේශයෙන් පිටතට ගෙන එන්න මා පියවර ගත් කාලයේදී" ලෙස සඳහන්ය.

මෙය ගිවිසුම් රූපකයකි. එනම් පියපුත් සබඳතාවය දක්වන්නකි. පියකු තම දරුවා අතින් අල්ලාගෙන රැගෙන ඒම අප සිතින් මවා ගතයුතුය. පුරාණ ගිවිසුමේ දිවැසිවරු, දෙවියන් වහන්සේ හා ඉශ්රායෙල් ජනතාව අතර ගිවිසුම් සබඳතාව විස්තර කළේ පහත දැක්වෙන රූපක ආශ්‍රයෙනි.

ලබන සතියට....

# කිතුනු වටිනාකම් රැක ගනිමු

**කතුතුමනි,**

යහපත් ජීවන රටාවකට අඩිතාලම දමමින් ගුණ ගරුක සමාජයක් බිහිකිරීමෙ ලා වඩාත් වෙහෙසෙන්නේ අප අදහන ආගමයි. දෙවනුව අප අකුරු කරනා පාසලයි. ආගම මුල් කොට ගෙන ක්‍රියා කිරීමේදී දෙව් මැඳුර මූලිකත්වය ගෙන ක්‍රියා කරනා බව අපි සැවොම දනිමු. මීට දශක දෙක තුනකට ප්‍රථම කෙසේ හෝ කතෝලික පාසලක ඉගනීමට දරුවන් යවන්නට දෙමාපියන් කටයුතු කරන්නේ එහි ඇති වටිනාකම දන්නා බැවිනි. මනා හික්මීම, කලට වේලාවට වැඩ කිරීම, සමගිය, සමාදානය, බෙදා හදා ගැනීම පමණක් නොව තම හෘද සාක්ෂිය අනුව ජීවත් වීම ද ඉගනීම සිදුවන්නේ විෂයන්ට අමතරවය. කතෝලික පාසලකින් අප ලබන්නේ මනා අධ්‍යාත්මික ගුණ දමය. අන්‍ය ආගමිකයන් ද එය එකහෙළා පිළිග නිති.

කතෝලික පාසල තුළින් දේවස්ථානයේ හැසිරීම, යාච්ඤා කිරීම, භක්ති අභ්‍යාස වල යෙදීම ආදි කරුනු ගැන මනා අවබෝධයක් ළමුන්ට ලබා දෙති. අදද පැරණි වැඩිහිටියන් තුළින් දිස්වන්නේ එයයි. එකල අප දෙව්මැඳුරට පිවිසුනේ සංවර ඇඳුමෙනි. පූජා පොත, ජපමාලය අපගේ අත විය. ස්ත්‍රීහු වේලය පැළඳගෙන හිස වසාගෙනය. අනුන්ට බාධා නොකර ඉතාමත් භක්තිවන්තව තම යැදුම් පවත්වාගෙන යන ලදි. එදා පූජාප්‍රසාදි තුමා දේව වචනය බෙදා දුන්නේ එමගින් අප ජීවිත ආලෝකමත් කරගැනීමට හා යහපත් ධර්මිෂ්ඨ සමාජයක් බිහිකර ගැනීමට කටයුතු කර අවසානයේ දේව රාජ්‍යයේ පංගුකාරයන් වී සදාතනික ජීවිතයට පා තැබීමටයි. නමුත් අද එතුමන්ලාට සිදුවී ඇත්තේ දෙව් මැඳුරේ හැසිරීම ගැන මතක් කිරීමටයි. ජංගම දුරකථනය ක්‍රියා විරහිත කරන්න, සංවර ඇඳුමින් දිව්‍ය පූජාවට සහභාගි වෙන්න ආදි කරුණු කියමින් උන්වහන්සේගේ වටිනා කාලය අපතේ හැරීමයි.

මේ කාරණා ගැන එතුමන්ලා අපව දැනුම්වත් කළ යුතු නොවන්නේ කතෝලික අප සතු සාරධර්ම තුළ අපගේ පැවැත්ම සම්බන්ධ කරුණු කාරණා සභාව විසින් දැනුම්වත් කර ඇති හෙයිනි. මව්පියන් හා අප පාසල මෙහිදි අපට උපකාරි වේ. එනමුත් මෑත යුගයේ සියල්ලම නවීකරණය වී ඇති බව පවසමින් සියල්ලම නූතන ක්‍රමයට සිදු කිරීමට වෙර දරනා සමාජයක් බිහිවී ඇති අතර දේව භක්තිය සැහැල්ලුවට ලක්කරමින් දිව්‍ය පූජා මෙහෙය අවස්ථාවේදිත් ජංගම දුරකතනය නාදවීම එතැන සිටම එයට පිළිතුරු දීම සිදුකරයි. අන් අයට කෙතරම් කරදරයක් වුවත් පූජාප්‍රසාදිතුමන්ලා කෙතරම් දැනුම්වත් කළත් ඉන් වැඩක් නැත. දැන් මෙය කුඩා දරුවන් අතරටද පැමිණ ඇත. පසුගියදා එක්තරා ප්‍රසිද්ධ දේවස්ථානයක 'අභිවෘද්ධි ආලේපය' ලබන දරුවන් සඳහා පංති පවත්වන අතර ළමුන් අත වූ ජංගම දුරකථන නද දෙන්නට විය. එම දරුවන් ඒවාට ඒ සමගම පිළිතුරු දෙන බැවින් දුරකථන සියල්ලම පසුව දෙන්නට එකතු කරන ලදි. මේ දුරකථන අතර ඉතාමත් මිල අධික 'ඇපල් ෆෝන්' නම් ජංගම දුරකථන ද විය. මේ ළමුන් සියල්ලන්ම පාහේ වැඩිහිටියන් විසින් දේවස්ථානයට රැගෙන එන හා රැගෙන යන අය වූහ. කුමන වර්ගයේ දුරකථනයක් පාවිච්චි කළද අපට කම් නැත.

එනමුත් එය පරිහරණය කරන අන්දම නිසා සෙස්සන්ට වන කරදරය අතිමහත්ය. තමාගේ පමණක් නොව අන් අයගේ අධ්‍යාත්මයට බාධා පමුණුවමින් ක්‍රියා කිරීම සුදුසු නැති බව මාපියන් දරුවන්ට දැනුම්වත් කළ යුතු වන්නේමය. විශේෂයෙන්ම දෙව් මැඳුර තුළදී තවත් කිවයුතු කරුණක් වනුයේ දහම් පාසල ඇරෙන තුරු දෙව් මැඳුර තුළ හිඳගෙන රංචු ගැසි කථා බහ කරමින් නිහඬව යාච්ඤා කරන අයව අපහසුවට පත් කිරීමයි. තවත් සමහරු දේවස්ථානයේ මුල්ලක හිඳගෙන ජංගම දුරකථනයෙන් සංවාද පවත්වයි. 'දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ' ගෞරවණීය ලෙස ඉදිරිපස තැන්පත් කර ඇත.

මෙවැනි කාරණා ලිවීම කණගාටුවට කරුණක් වුවද අද අප ජීවත්වනුයේ අන්‍ය ආගමිකයන් බහුලව සිටින ප්‍රදේශයක බැවින් මෙමගින් ඇතිවන කැළල අතිමහත් වන හෙයිනි. සාරධර්ම ගිලිහී ගිය ධනය බලය මතම පදනම් වූ ජාත්‍යන්තර පාසල් යයි කිය ාගන්නා පාසලින් ළමයින් ලබාග න්නේ කුමක්දැයි අප සිතා බැලිය යුතුයි. වැසීයාමට ලක්වන කතෝලික පාසල් ටික දියුණු කර දරුවන් එම පාසල්වලට යොමු කර යහපත් අනාගතයක් සකසා ගැනීම අප සතු කාර්යයක් බව පෙනේ. දෙවියන්වහන්සේගේ ගෘහය සැහැල්ලුවට ලක්කරමින් අප සතු සාර ධර්ම දින දින ගිලිහී යාමට අප ඉඩ නොහළ යුතු අතර අපගේ අනාගත දරු පරපුර කතෝලික ආගමික පසුබිමක හදා වඩා ගත යුතුය. අපගේ කිතුනු වටිනාකම් රැක ගැනීමට කටයුතු කරමු.

**නිලන්ති ගුණසේකර**
බත්තරමුල්ල

# විවාහ දිව්‍ය පූජා සඳහා ගීතිකා

**කතුතුමනි,**

පසුගියදා පැවැති විවාහ මෙහෙයකදී පව්කමාව සඳහා 'ගියදෝ දුරස් වෙන්න' ගීතිකාව ගයන ලදී. මෙය පව්කමාව සඳහා ගායනා කළහැකි ගීතිකාවක්ද? නානාප්‍රකාර ගීතිකා විවාහ පූජාවලදී ගායනා කරනවා. ඒවා ගීතිකා නොවේ සින්දුය.

විවාහ සඳහා ගීතිකා කොළ මුද්‍රණය කරන්නට පෙර එම මෙහෙය පවත්වන දේවස්ථානයේ පියතුමාට පෙන්වා අනුමැතිය ලබාගත යුතු බවට නියෝගයක් කොළඹ අගරදගුරු පදවිය දේවස්ථානවලට නිකුත් කිරීමට සභා බලධාරිනට නොකළ හැකිද?

විශ්වාසිකයන්ගේ යාච්ඤා ගායනය විවාහ පූජාවලදී නවතා දැමීමට හැකිවිය. මේ සඳහා නියෝග නිකුත් කළ හැකිය. මුද්‍රණය කළ ගීතිකා ගැයුවේ නැතිනම් ගායනා කණ්ඩායම් වලට ප්‍රශ්න මතුවී ඇත.

දිව්‍ය පූජාවට ඉතාමත් සුළු අවධානයක් යොදන දේව වන්දනාව නොදන්නා පිරිස සභාවේ වන්දනා ක්‍රමය විකෘති කරනවා නොවේද?

**පී. ඒ. පෙරේරා**
කෙරවලපිටිය

# වෘත්තීය අධ්‍යාපනය දියුණු කළ යුතුයි

**කතුතුමනි,**

කිසියම් වෘත්තියක් සඳහා දෙනු ලබන අධ්‍යාපනය වෘත්තීය අධ්‍යාපනය නම් වේ. සිසුවා හෝ සිසුවිය පාසලින් බැහැර වීමට ප්‍රථම ඔහුට හෝ ඇයට වෘත්තීයක් සම්බන්ධව හුරු පුරුදු කිරීම මෙහි මුඛ්‍ය කාර්යය වනු ඇත.

උදාහරණයක් වශයෙන් ගතහොත් වඩු වැඩ, මේසන් පෙදරේරු වැඩ ගණන් ගත හැක. මෙහිදී වඩුවැඩ පිළිබඳව හුරු පුරුදුවක් කිසියම් ශිෂ්‍යයෙක් හෝ ශිෂ්‍යාවක් ලබාගෙන ඇත්නම් ඔහුට හෝ ඇයට අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනීසිට විභාගයේ ප්‍රතිඵල එනතුරු තම තමන් ලත් පුහුණුවෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට අවස්ථාව සැලසෙන අතර ඒ මගින් ජීවිකාව ගෙනයාම සඳහා මුදල් උපයාගැනීමට මං සැලසේ. එවිට නිකරුනේ කාලය කා දැමීමක් සිදු නොවේ.

කරුණු මෙසේ හෙයින් ඉදිරි අනාගතයේදී වෘත්තීය අධ්‍යාපනය දිනෙන් දිනම දියුණුවෙන් දියුණුවට පත් වෙත්වායි ලක්බිමේ වෙසෙන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සැම දෙන වෙනුවෙන්ම කරනු ලබන මගේ අවසන් හෘදයාංගම පැතුමයි.

**වෝල්ටර් නික්ලස් පෙරේරා**
නැගෙනහිර - නයිනමඩම

# තාරුණ්‍යයට හෙටක් තියේද ?

**කතුතුමනි,**

'තාරුණ්‍යයට හෙටක්' යනු එක්තරා රාජ්‍ය සංකල්පයකි. එය ශ්‍රී ලාංකික තාරුණ්‍යයට යහපත් හෙට දවසක් උදා කරනු ඇත යන්න කාගෙත් විශ්වාසය වූවාට සැකයක් නැත. එහෙත් දැන් දැන් රටේ සිදුවන විවිධ කරුණු අරභයා සලකන විට 'තාරුණ්‍යයට හෙටක්' යනු හුදු තරුණයා මංමුලා කරවන දේශපාලනික උපක්‍රමයක් මිස කිසිදා සරණක් නොවන්නක් බැව් පැහැදිලිය.

රටක සංවර්ධනය සඳහා 'තරුණයා' එහි ජීවය යැයි කියනු ලැබේ. ළදරු විය, සිසුවිය පසු කරන 'තාරුණ්‍යය' කෙමෙන් සමාජය වෙත අවතීර්ණ වන්නේ දහසක් පැතුම් පොදි බැඳ ගෙනය. පාසල් දිවිය තුළින් ලබන සිය අධ්‍යාපනයේ හා සමාජයේ මුවදොර වන් කඩ ඉම් විභාග අද එකම අවුල් ජාලයක්ව පවතී. සිය අධ්‍යාපන විෂය පථයට අදාළව නිසි ප්‍රශ්න පත්‍රයක් වන් හරියාකාර සකස්කර ගත නොහැකි දේශපාලනික වට පිටාවක ජීවත්වන තරුණ තරුණියන් අද අන්ද මන්දව සිටිති. සිය විභාග ප්‍රතිඵල පවා අවුල්කර දමමින් ගොඩනගා ඇති විෂම සමාජ පසුතලය මත 'තරුණ්‍යයට හෙටක්' කිසිදා බිහි නොවනු ඇත. සරසවි තුළින් නැගෙන තරුණ අඳෝනාව ඊට නො දෙවෙනිය. තරුණ හදවත් ඉකි බිඳින හඬ පවා නො ඇසෙනකන්ව පසුවන බලධරයෝ තරුණ අසහනයට පීඩනයට තරුණ්‍යය ගොදුරු කරති. ඔවුන්ගේ බුද්ධියට නිගරු කරති.

රැකියා විරහිත සමාජයක තෙරපෙන තාරුණ්‍යය සහනය පතා වීදි බසිති. විරෝධතා පළ කරති. පවතින දේශපාලනික හා රජයට විරුද්ධව නැගී සිටිති. එහෙත් 'තරුණ්‍යයට හෙටක්' මැයෙන් සංවිධාන ගොඩ නැගුවෝ නිහඬය.

එය හුදු දේශපාලනික පක්ෂ ජයපතන උපක්‍රමික සංකල්පයක් පමණක් වන්නේ ඒ හෙයිනි. තම අධ්‍යාපනික කටයුතු හා ජීවිතය වෙනුවෙන් දිවි කැපකළ සිය දෙමාපියනට යුතුකම් හා වගකීම් ඉටුකළ නොහැකිව ලත වෙන තරුණ්‍යය කවදා කොතැනක යා යුතු ද යන්න පවා තේරුම් ගත නොහැකිව තැවෙති. කොටින්ම වත්මන් ජන සමාජය තුළ 'තාරුණ්‍යය' අතරමංව, වල්මත්ව සිටිති.

මිනිස් උපතේ පටන් මරණය දක්වාම ගෙවෙන ජීවිත කාල පරාසය තුළ යොවුන් විය තරම් සුවදායක සුන්දර අවධියක් මිනිස් දිවිය තුළ තවත් නැත. ආදරය, ප්‍රේමය මෙන්ම විවාහය හා අනාගතය ගැන කිසිදු පැතුමක් ඉටු නොවන හා ඉටුකරගත නොහැකි බැව් අද තාරුණ්‍යය හොඳින් වටහගෙන ඇති බව නම් නිසැකය.

ඒ බැව් අද රූපවාහිනිය හා දස දෙසින් ඇසෙන කියවෙන හා පෙනෙන දෙයින් පැහැදිලිය. 'තරුණ්‍යයට හෙටක්' යහපත් කල දවසක් උදා වන්නේ කවදාද යන්න ශ්‍රී ලංකා බලධාරින්ගෙන් හා රජයෙන්ද අප විමසා සිටිය යුත්තේ එබැවිනි.

**ලියෝ එෆ්. දිසානායක**
දළුගම

# දෙහියාගාත දහම් පාසල් දරුවන්ට සෙවණක් ඕනෑ!

**කතුතුමනි,**

දේව මෙහෙයයන් සඳහා දක්වන උනන්දුව සේ ම රටේ අනාගතය භාර ගැනීමට සූදානම් වන දෙහියාගාත දහම් පාසල් දරුවන්ගේ දහම් පාසල් අධ්‍යාපනය ගැන වගකිව යුත්තන්ගේ සුවිශේෂ සැළකිල්ල යොමු විය යුතුය. ගමේ රටේ අනාගතය තීන්දු කරන මෙම බාලයන් නිසි මගට යොමු කිරීමේ අත් වැලක් දහම් පාසල් අධ්‍යාපනයෙන් ලැබිය යුතුය.

ගමෙන් බිහිවූ ගුරුවරුන් කොතෙක් සිටියත් දහම් පාසලේ ඉගැන්වීමේ උතුම් කාර්යයට සම්මාදම් වන්නේ ඉතා ම සුළු පිරිසකි. තමන්ගේ ම ගමේ දරුවන් වෙනුවෙන් සතියකට පැයක් දෙකක් කැප කරන්නට අකමැතිය. ඇරත් සතියේ උතුම් ම දවස සබත් දවසේ පැය ගණන් නිකරුණේ වැය නොකරන්නේ ද?

ගමේ පාසලේ දරු දැරියන්ට අමතරව වෙනත් පාසල් වලට යන දරුවන් ද මෙම දහම් පාසලට එන හෙයින් විශාල පිරිසක් සහභාගි වෙති. ඒ නිසා අදාළ වසර සඳහා පංති කීපයක් පැවැත්වීමට සිදුවීමේ හේතුව නිසා ම දහම් පාසලට ප්‍රමාණවත් ගුරුවර ගුරුවරියන් සංඛ්‍යාවක් නැත.

මේ සඳහා දෙහියාගාත විදුහල තිබූ පැරණි ගොඩනැගිල්ල යොදාගෙන ඇතත් එහි ඉඩකඩ ඇත්තේ සීමිත පිරිසකටය. විශාල පිරිසක් දහම් සෙවණ ලබා ගන්නේ දේවස්ථාන මිදුලේ තැනින් තැන පැදුරු එලාගෙන ය. දරුවන් පමණක් නොව ගුරුවරුන් ද පත් වන්නේ මහත් අසීරුතාවයට ය. මෙම පසුබිම තුළ තමන් උගන්නා කරුණු සටහන් කර ගැනීමට දරුවන්ට හැකියාවක් නැත. සුනිල් සාන්ත, මාහිම් මොසැසි පෙරේරා පියනම වැනි විද්වතුන්ට සෙවණ දුන් දෙහියාගාත විදුහල් ගොඩනැගිල්ල නඩත්තුවක් අලුත්වැඩියාවක් නොකිරීම නිසා පවතින්නේ අබලන් තත්ත්වයේය. වහලයේ බාල්ක දිරා කඩා වැටෙන්න ඔන්න මෙන්නය. මෙම ගොඩනැගිල්ල තුළ ඉගෙන ගන්නා දරුවන් අවදානමක සිටින බව තේරුම් ගත යුතුය.

දැනට තිබෙන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම මෙන් ම එම දරු පිරිසට සෙවණ ලබා දිය හැකි තරමේ ගොඩනැගිලි පහසුකම් සැළසීම හදිසි අත්‍යවශ්‍ය කටයුත්තකි. මෙම කාර්යයට ප්‍රමුඛත්වය දීමට වගකිව යුත්තන්ගේ අවධානය යොමු වේවා!

**ඇල්ප්‍රඩ් නෙල්සන්**
දඬුගම



# දස දිගින් සැදැහැ ජන ගඟ ගලන
# රෝගීන් ආසිරි ගැන්වීමේ මංගල්‍යය අදයි



"ශ්‍රී ලංකාවේ අප ස්වාමිදූ" යන නමත් සමඟ ඇලී බැඳී ඇති තවත් ස්ථානයක් අපට නිසඟයෙන්ම මතකයට නැගෙයි. එනම් රාගම, තේවත්තේ පිහිටි ජාතික බැසිලිකා සිද්ධස්ථානය යි. මෙම පුදබිමට ලක්ෂ ගණනින් සැදැහැ ජන ගඟ ගලන දිනයක් ද වෙයි. එනම් රෝගීන් ආසිරි ගැන්වීමේ දේව මෙහෙය නොහොත් ජනතාව අතර පවතින "රෝගීන්ගේ මංගල්‍යය" දිනයයි. මෙවර එම දිනය යෙදී ඇත්තේ අගෝස්තු මස 26 වන අද දිනට යි. මෙවර මංගල්‍යයේ දි දස දිගින් එන සැදැහැවත් ජනතාවට උපරිම පහසුකම් ලබා දීමට වත්මන් සිද්ධස්ථාන පරිපාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමා සියලු විධි විධාන යොදා ඇත. පූජක, පැවිදි, ගිහි ප්‍රබල සංවිධායක කමිටුවක් එතුමන්ට සහාය වෙයි.

තේවතු පුදබිම මෙතරම් සැදැහැ ජනතාව ගේ ජන හද දිනා ගැනීමට හේතු යුක්ත වුණු කතා වස්තුව අප සැම දෙන සිහිපත් කරනුයේ ඉමහත් ගෞරව පූර්වකව ය. නව පරපුර ඒ පිළිබඳ දැනුවත් වීම අවශ්‍ය වන හෙයින් එය වැදගත් වන බව අපට හැඟේ.

ක්‍රි.ව. 1940 වන විට දෙවන ලෝක මහා සංග්‍රාමයේ ගිනිදැල් ලොව පුරා ඇවිල යමින් පැවතිණි. ඇමරිකාව හා නැගෙනහිර ඉන්දියාව දක්වා ද එම ගිනිදැල් විසිරී යමින් පැවතුණි. එතෙක් ඉදිරියට ඇදී ආ සතුරු ආක්‍රමණයනට ඉදිරි යුද මෙහෙයුම් මධ්‍යස්ථානය කර ගැනීමට තිබූ කදිම තෝතැන්නක් වූයේ ලංකාද්වීපය යි. මේ වනාහි කොළඹ අගරදගුරු පදවියේ අවසාන විදේශීය අගරදගුරු හිමිපාණන් වශයෙන් 1938 දී පදවි ප්‍රාප්ත වුණු ප්‍රංශ ජාතික අති උතුම් ජීන් මේරි මසොන් නි.ම.නි. හිමිපාණන් ගේ පාලන සමය විය. එතුමෝ වැඩි දිනක් ගත වීමට පෙරාතුව අප රට ද සතුරනට බිලිවනු නියත බව දුරදක්නා නුවණින් දුටහ. දෙව් මවුන් කෙරෙහි ඉමහත් ගෞරවාදරයකින් බැඳුණු මෙම දහම් ධරයාණෝ මෙම රටත්, ජනතාවත් යුද රකුසාගෙන් බේරා දෙන ලෙසට බැති සිතින් යාච්ඤා කළහ. එයින් නො නැවතුණු එතුමෝ රාගම, තේවත්ත පුදබිමට වන්දනාකරුවකු වශයෙන් පැමිණ පුදබිමේ ලූර්දු ගුහාව (වත්මන් කල්වාරි ප්‍රතිමා) ඉදිරියේ දණ ගසා දීර්ඝ ලෙස භාවනාත්මක යැදුමක යෙදුණහ. මුළු සිරිලකත්, මෙරට සමස්ත ජනතාවත් යුද රකුසාගෙන් බේරා ගන්නා දේව මාතාවන්ට මෙරට ජනතාවගෙන් පිදෙන ස්තුති පූර්වක ගෞරවයක් වශයෙන් ජාතික බැසිලිකා මහා දෙව් විමනක් ගොඩනගන බව ද නිර්මල දේව මාතාවන් "ශ්‍රී ලංකාවේ අප ස්වාමිදූ" වශයෙන් නම් කරන බව ද තිරසාරවම ප්‍රකාශ කළහ. මෙම ඓතිහාසික බාරය වුණු දිනය වශයෙන් 1940 මැයි මස 26 වන දින රන් අකුරින් සනිටුහන් වී ඇත.

මේ බාරය වූ අති උතුම් මසොන් නි.ම.නි. අගරදගුරු හිමිපාණෝ 1948 ජූලි මස 28 වන දින ස්වර්ගස්ථ වූ අතර එතුමන්ගේ අභාවයෙන් අනතුරුව තම සිරුර ජාතික බැසිලිකා දෙව්මැඳුර තුළම මිහිදන් කිරීම එතුමන්ගේ අභිලාෂය වුවද ඒ වන විට බැසිලිකා දෙව් විමන ගොඩනැංවීමේ කටයුතු ආරම්භ කිරීම පවා කර නොතිබුණෝත් එතුමන්ගේ දේහය කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ තැන්පත් කෙරිණි.

මේ පුදබිමේ පැවැත්වෙන රෝගීන් ආසිරි ගැන්වීමේ දේව මෙහෙය ගරු පී. ලප්‍රියන් නි.ම.නි. පියතුමන් විසින් යෝජනා කර ආරම්භ කෙරිණි. තනි තනිව පමණක් නොව පවුල් වශයෙන් ද, මීසම් වශයෙන් ද මෙම දිනයට ඇදී එන්නට වූහ. 1941 පටන් සෑම අගෝස්තු මස අවසාන ඉරුදින මෙම ගාම්භීර දේව මෙහෙය පැවැත්වෙයි. ඒ අනුව මෙම රෝගීන් ආසිරි ගැන්වීමේ මංගල්‍යය මෙවර පැවැත්වෙන්නේ 71 වන වරට ය. මෙ දිනට වර්තමානයේ ශ්‍රී ලාංකේය කතෝලික සැදැහැ ජනතාව ඒකරාශී වනුයේ ලක්ෂ ගණනකිනි. ඊට හේතුව නිර්මල දේවමාතාවන් කෙරෙහි අප දේව ජනතාව තුළ පවත්නා ගෞරව භක්තියත්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ කෙරෙහි ඇති අති මහත් ප්‍රේමනීය ආදරයත් නිසා ය. කතෝලිකයන් නොවන බැතිමතුන් ද මෙම මෙහෙයට සහභාගි වී දේවාශිර්වාද ලබා ගන්නා බව රහසක් නොවේ. සමහර බැතිමතුන් මෙහෙය පැවැත්වෙන දිනයට දින කීපයකට පෙර සිටම තේවතු පුදබිමට පැමිණ කුඩාරම් ඉදිකර ගනිති. මෙහෙය දිනය වන විට තේවතු පුදබිම අතුරු සිදුරු නොමැතිව ජනතාවගෙන් පිරී යයි.

මෙම මෙහෙයට සහභාගි වී, තද බල විශ්වාසය නිසාම ආශ්චර්යාත්මක සුවපත් වීම් ලබන ජනතාව අඩුවක් නැත. කායික, ආධ්‍යාත්මික, මානසික සුව සහනයන් ලබන පිරිස් වර්ෂයක් වර්ෂයක් පාසා මෙම ශුද්ධවු පුදබිමට ළඟා වන්නේ එහෙයිනි. කලින් කියැවුණු පරිදි අති උතුම් මසොන් නි.ම.නි. හිමිපාණන් වූ බාරයේ දෙවැනි කොටස වූයේ දේව මාතාවන් "ශ්‍රී ලංකාවේ අප ස්වාමිදූ" යයි නම් කරන බවයි. මෙයට සුදුසුනින් අවසරය ලැබිය යුතුව තිබුණි. 1947 පෙබරවාරි 15, 16 දිනවල තේවත්තේ පැවැති උත්කෘෂ්ඨ මංගල්‍ය දේව මෙහෙයේ දී 12 වැනි පියුස් සසුනිසුරාණන් වෙතින් ඒ අවසරය ලැබුණු බව සැදැහැ ජනතාවගේ අත්පොළසන් හා ඔල්වරසන් හඬ මධ්‍යයේ ප්‍රකාශයට පත් කෙරිණි.

අති උතුම් මසොන් හිමිපාණන් ගෙන් පසුව කොළඹ අගරදගුරු පදවි ප්‍රාප්ත වූයේ යුව රදගුරු අති උතුම් තෝමස් බෙන්ජමින් කුරේ නි.ම.නි. හිමිපාණන් ය. මසොන් හිමිපාණන්ගේ කාර්යභාරය ඉටු කිරීමේ වගකීම පැවරුණේ එතුමන් වෙතය. කිසිදු පසුබෑමකින් තොරව එතුමෝ එය ඉටු කළහ. තේවතු පුදබිම අද පවත්නා චමත්කාර පරිසරයේ නිර්මාතෘ කුරේ නි.ම.නි. හිමිපාණන් ය. දූරදර්ශී නුවණින් බැසිලිකාව ගොඩනැංවීමේ කාර්යය සිය සේවා කාලය තුළදීම ඉටු කළ උන්වහන්සේ තේවතු පුදබිම පුරා ආධ්‍යාත්මික පරිසරයක් ගොඩනංවනු වස් විවිධ කන්‍යාරාම ස්ථානගත කරන ලදි. වෘක්ෂලතා ඉතාම සැලසුම් සහගත ලෙස පුදබිම පුරා සිටුවන ලද්දේ උන්වහන්සේට උද්භිද විද්‍යාඥයකු වශයෙන් තිබූ දැනුම හා ආභාෂය නිසා ය. බැසිලිකාව ඉදිරිපිට වෘක්ෂලතා රෝපණය කර ඇත්තේ අතක ඇඟිලි විදහූ ආකාරයට බව කියැවේ. ඒ බහුතරයකට මෙහෙය හොඳාකාරව බලා ගැනීමේ හැකියාව ලැබෙන පරිදිය.

එතුමන්ගේ ඇවෑමෙන් අගරදගුරු පදවි ප්‍රාප්ත වූ අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් හා අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් ද තේවතු පුදබිමටත්, ලංකා අප ස්වාමි දූ වන දේව මාතාවන්ටත් දැක්වූයේ අපරිමිත භක්තියකි. උන්වහන්සේලා ගේ සේවා කාලය තුළ ජාතික බැසිලිකා පුදබිම විවිධ අයුරින් සංවර්ධනය කිරීමට දායක වූහ.

අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විශ්‍රාම යාමෙන් අනතුරුව අගරදගුරු පදවි ප්‍රාප්ත වූ අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් ද තේවත්ත පුදබිමට ඉමහත් ගෞරවයක් හා ආදරයක් දක්වයි. උන්වහන්සේ කාදිනල් ධූරයෙන් පිදුම් ලබා ශ්‍රී ලංකාවට සපැමිණි දින ප්‍රථමයෙන්ම පැමිණියේ තේවත්ත ශ්‍රී ලංකා අප ස්වාමි දූ ගේ බැසිලිකා පුදබිමට ය. එහි පැමිණ බැසිලිකා දෙව් විමනේ මෙහෙයෙන් අනතුරුව එහි "යට පල්ලිය" ලෙස සැදැහැවතුන් අතර ප්‍රචලිත වූ භූගර්භ දේවස්ථානයට (අද දිව්‍ය සත්ප්‍රසාද දෙව්මැඳුරට) සපැමිණි උන්වහන්සේ එහි මිහිදන් කරති ස්වර්ග ස්ථ වී වදාළ අති උතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමිපාණන් ගේ දේහය තැන්පත් කර ඇති ස්ථානයේ දණින් වැටී භාවනාත්මක යැදුමක යෙදීම විශේෂ කරුණකි.

මෙවර රෝගීන් ආසිරි ගැන්වීමේ මෙහෙය පැවැත්වෙන්නේ ද කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙනි.

මෙවර තේමාව "මරි මව්නි, මාංශගත වූ දෙව් වදනින් අප බලවත් කළ මැනව" යන්නයි. අගෝ. 25 දින සවස 7.00 ට සන්ධ්‍යා ගායනා මෙහෙය කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. අගෝස්තු 26 වන ඉරුදින පෙ.ව. 5.00, 6.00, 7.00, හා 8.00 ට සිංහල භාෂාවෙන් ද, පෙ.ව. 9.00 ට ඉංග්‍රීසි භාෂාවෙන් ද, පෙ.ව. 10.00 ට දෙමළ භාෂාවෙන් ද, පෙ.ව. 11.00 සිංහල භාෂාවෙන් ද, සවස 5.00 ට (අගරදගුරු පදවි නවක පූජාප්‍රසාදිතුමන්) සිංහල භාෂාවෙන් ද දිව්‍ය පූජාවන් පැවැත්වේ. ප්‍රධාන දේව මෙහෙය සහ රෝගීන් ආසිරි ගැන්වීම එදින ප.ව. 2.00 ට ආරම්භ වේ.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි හිමිපාණන්, ත්‍රි මලේ රදගුරු අති උතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ හිමිපාණන්, විශ්‍රාමික අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්, අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්, කොළඹ සහයක රදගුරු හිමිපාණන් සහ කලාපීය නාහිමිපාණන් ද පූජක සංඝය ද මීට සහභාගි වෙති. සිද්ධස්ථාන පරිපාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමන් රෝගීන් ආසිරි ගැන්වීමේ මෙහෙය මනාව සංවිධානය කර ඇත. වාර්ෂිකව පැවැත්වෙන මෙම රෝගීන් ආසිරි ගැන්වීමේ දේව මෙහෙයට සහභාගි වී ලංකා අප ස්වාමි දූ මඟින් දේවාශිර්වාද ලබා ගැනීමට දස දිග සැදැහැ ජනතාවට ඇරියුම් කෙරේ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
**පයස් ජයවර්ධන**

# සුවදානයේ ස
# ඔබත් තේ







**තේවත්ත ජාතික බැසිලිකා පුදබිමේ වාර්ෂිකව පැවැත්වෙන රෝගීන් ආසිරි ගැන්වීමේ ඉතිහාසය ජාතික බැසිලිකාවට වඩා පැරණි ඉතිහාසයකට උරුම හිමිකම් කියයි. වර්ෂ 1941 දී අගෝස්තු මස අවසාන ඉරිදා ආරම්භ කළ මේ සුවදාන මෙහෙයේ පුරෝගාමියා ගරු පී. ලප්‍රියන් නි.ම.නි. පියතුමා ය.**

එහෙත් ඇතැම් ඊනියා වෙබ් අඩවි හා මඩ පෝස්ටර් හා විද්‍යුත් තැපැල් මඟින් එහා මෙහා යවන ලිපි ගොනු වලට අනුව මේ වැයම තවත් "ෂෝ" එකක් රඟ දක්වන්නට ය. විශේෂයෙන් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ මෙහෙයවීම මත සුවය ලබන බව රඟ දක්වා රුපියල් ලක්ෂ ගණනින් ගෙවන්නට සැරසෙන බවට මඩ පුවත් මඟින් වෑයම් කර තිබිණ.

තේවත්තේ ජාතික බැසිලිකා පුදබිමේ වාර්ෂිකව පැවැත්වෙන මේ සුවදාන මෙහෙය හුදු මීසම් මට්ටමේ, දිසා මට්ටමේ හෝ පදවි මට්ටමේ මෙහෙයක් පමණක් ම නොවේ. කොළඹ අගරදගුරු වසම මුල්කරගත් මේ රටේ සිවු දිසාවන්ගෙ න් ජනතාව රොද බඳින්නේ අසන දකින කොයි කවුරුත් විමතියට පත් කරවමිනි. ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසක් සාමුහික ආධ්‍යාත්මයකින් පෙළ ගැසී, අන්‍යෝන්‍ය විශ්වාසය පෙරදැරි කරගත් බෙදා හදා ගැනීමේ පිළිවෙතක පිහිටා දේව මාතාවන්ගේ මධ්‍යස්ථකමින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ ආශිර්වාදය පතා යදිති.

තේවත්ත පුදබිම ජනතාව සැදැහැ බැතියෙන් ඇද බැඳ ගන්නා අපූර්ව අධ්‍යාත්මික පරිසරයකින් යුතු වේ. එහි පවත්නා නිහඬ නිසල බව, ගස් කොලන් වලින් නැගෙන සිලි සිලිය. යෝධයකු ලෙස නැගී සිටින බැසිලිකා දෙව් විමන, එහි සිට දැත පා සිය ජනතාව වෙත නෙත් යොමා සිටින ශ්‍රී ලංකා අප ස්වාමිදූ මාතාව ආදී මේ බොහොමයක් දෑ හදවත් නිවා සනහාලයි. නූතන ලෝකයේ දැවී දැවී දිවි ගෙවන, අනේක විධ ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික රෝග පීඩාදියෙන් දුක් විඳින ජනතාව සිය පීඩාවන්ගෙන් මිදීම පතා තේවත්ත කරා දිව එන්නේ මේ නිසාම ය.

වාර්ෂික සුවදාන මංගල්‍යයට පමණක් නොව සාමාන්‍ය සති අන්තවල පවා සැදැහැවතුන් පවුල් පිටින් දේව අම්මාගේ පිළිසරණ පතා එක්රොක්වන අයුරු දැකගත හැකිය. මෙහිදී සුව ස
හා දේව මධ්‍යස්ථභාවය අත් දැ
ජීවිත නව මං ගන්වන්නට සම
සැදැහැවතුන් වාර්ෂික සුවදාන
මංගල්‍යයට ගම් පිටින් රොද බ
සාමුහික ඇදහිල්ලේ මහිමය ත
කරමිනි. ස්වාමින් වහන්සේගේ
තනිව අත්දකින්නට අවස්ථා ල
බැව් සත්‍යයක් නමුත් මෙවන් 
විශ්වාසිකයන් සමූහයක් මධ්‍යෙ
හැලෙන, බහුලවූ දේව වරප්‍රසා
බලය අති මහත් ය. ඒ නිසාම 
සුවය අත්දකින්නටත්, ආධ්‍යාත්

# ...ැබෑ අත්දැකීමකට ...ත්තට එන්න !







විශ්වාසය තහවුරු කිරීමටත්, විශ්වාසයේ බලය වැඩි වේ. සැබැවින්ම අධ්‍යාත්මික සුවය පුද්ගල අත්දැකීමක් වන අතර මෙය එකිනෙකා සිය නිවෙස් කරා රැගෙන යන්නට වරම් ලබන තත්ත්වයකි. මේ මගින් සැදැහැවතුන් තුළ "තමන් අදහන්නේ තමන්ව අත්හරින්නේ නැති දෙවි කෙනෙකි" යන ආකල්පය තහවුරු වේ. ස්වාමින් වහන්සේ ස්වකීය විශ්වාසයට අනුව මහා සුවදායකයාණන් වන බැවින් උන්වහන්සේගේ තිරසාර සුවය අත්දකින්නට සැදැහැවත්හු පෙළ ගැසෙති.

...හනය ...කිමින් ...ත්වන ...යේ ...දින්නේ ...හවුරු ... සුවය තනි ...ැබෙන ...සුවිශාල ...යේ ඇද ...දයන්ගේ ...සාමුහික ...මික

තේවත්ත සුවදාන මෙහෙයේ දී සුවය අත් දැකීම හුදු "මැජික්" එකක් ලෙස සිදු නොවේ. එහෙත් එදා ස්වාමින් වහන්සේ එදා කඳු මුදුනට ගොස් ජනතාවට දේශනා කර ඔවුන් සුව ගැන්වූ ආධ්‍යාත්මික පසුබිම තුළ ජනතාව දිගුකාලීන සුවයක් වෙත යොමුවේ. ශාරීරික රෝගීන් පමණක් නොව මානසික හා ආධ්‍යාත්මික පීඩාවන්ගෙන් නිරන්තරයෙන් දුක්විඳින ජන කොටස් ද මේ සුවදානයෙන් මහත් වූ ඵල ලබති.

තේවත්ත ජාතික බැසිලිකා පුදබිම හුදු දේවස්ථාන බිමක් පමණක්ම නොවේ. එහි සිද්ධස්ථාන පාලක ගරු ප්‍රිය ජයමාන්න පියතුමා ඒ ගැන මෙසේ පවසයි.

"ඇත්තෙන්ම තේවත්තේ දී නිහඬතාවය තුළ ස්වාමින් වහන්සේ අත් දකින විශාල පිරිසක් සිටිනවා. රාගම රෝහලේ නේවාසික රෝගීන්ගේ ඥාතීන් දේව අම්මාව සොයාගෙන දුවගෙන එන්නේ මෙතැනට යි. සිය රෝගීන්ගේ ලෙඩ දුක් වලට පිහිට පතා යාච්ඤා කරන්නේ මෙතැනදී යි. බොහෝ අසාධ්‍ය රෝගීන් සුවය ලබා නිවෙසට යන්නට පෙර රාගම රෝහලේ සිට පැමිණෙන්නේ තේවත්තට යි.

බොහෝ විට මේ අය අතර පිට පළාත් වලින් පැමිණෙන සැදැහැවතුන් සිය සුවදානයේ අත්දැකීම් වලට තුති පුදන්නේ ඇඬූ කඳුලෙන්. ඒ වගේම පවුල් ප්‍රශ්න වල දී ඒ අය මෙහි පැමිණ දේව අම්මා පාමුල ඒවා කතා කරනවා. දිව්‍ය පූජාවට සහභාගි වී පව් කමාවේ ප්‍රසාද නිධානය ලබා ගනිමින් කැඩී බිඳී ඉසිරී යන්නට ගිය ජීවිත යළි සකසා ගන්නවා. මේ ආදි වශයෙන් බොහෝ කරුණු කාරණා වලදී ජනතාව තේවත්තට එන්නේ හුදු විනෝදයට නොවෙයි. සැබෑ භක්තිය මුසු බලාපොරොත්තු පොදි බැඳගෙන යි"

පියතුමාගේ ඒ අත්දැකීම් සනාථ කරමින් තේවත්තේ සුවදාන මෙහෙය වසරින් වසර සියලු ජන කොටස් අතර හද බැඳි අවස්ථාවක් වී ඇති අන්දම පැමිණෙන වන්දනාකරුවන්ගේ සංඛ්‍යාත්මක ඉහළ යෑමෙන් මනාව සනාථ වේ. එහිදී මේ සංඛ්‍යාත්මක වැඩිවීමට සමාන්තරව සුවදානයේ මහඟු වරමට උරුම හිමිකම් කියන්නට වැඩි පිරිසකට හැකිවීම ඊනියා අන්තවාදීන්ගේ ඇස්වල කටු ඇනෙන්නාක් මෙන් වීම ඒ හැටි පුදුමයක් නොවේ.

**ශිරාන් මෛත්‍රී**

# මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගිවරු

**මන්නාරම, කතෝලික සැදැහැවතුන් බහුලව වෙසෙන පළාතකි. මෙම කතෝලික සැදැහැවතුන් සතු වැදගත් ඉතිහාසයක් සටහන් වී ඇත. එය ආරම්භ වන්නේ ශු. ප්‍රැන්සිස් සාවියර් මුනිඳුන්ගෙන් ය.**

ගරු ෆ්‍රැන්සිස් සාවියර් පියතුමා (එවකට) ක්‍රි.ව. 1541 අප්‍රේල් මස 7 වැනි දා ලිස්බන් නුවර සිට ඉන්දියාව බලා නැව් නැග්ගේ ය. එතුමන් සමඟ ගමන් ඇරැඹූ තවත් පදවි පූජක තුමකු සහ ජේසු නිකායික සහෝදරතුමකු මොසැම්බික්හි දී පමා වුවත් සාවියර් පියතුමා 1542 මැයි මස 6 වැනි දින ඉන්දියාවේ ගෝවේ නගරයට සැපත් විය. මෙසේ පෙරදිගට පැමිණි ප්‍රථම ජේසු නිකායික පියතුමා එතුමා විය.


ගෝවේ පුරය තුළ පස් මසක් පමණ සේවා කළ එතුමෝ ඉනික්බිති දකුණු ඉන්දීය ප්‍රදේශයන් වෙත ගමන් කළෝ ය. ගෝවේ සිට මයිල (සැතපුම්) අට සියයක් පමණ දුරින් පිහිටි කොමරින් තුඩුව අසළ වෙරළබඩ ප්‍රදේශය වෙත සැපත් වූ එතුමනට හමුවූවෝ දෙමළ බස කතා කරන පරවර පිරිසකි. මීට ස්වල්ප වසරකට පෙර හෙවත් ක්‍රි.ව. 1535 දී මෙම පිරිස කිතු දහම වැළැඳ ගැනීම සඳහා තමන් ගේ කැමැත්ත දක්වා සිටි පිරිසකි. මීට වඩාත් හේතු වී ඇත්තේ හින්දු සහ මුස්ලිම් වෙළෙඳුන් ගෙන් ඔවුන් පීඩනයට පත්ව සිටීම යි. එවකට ගෝවේ පදවි පරිපාලනය බාරව සිටි මිගෙල් වාස් ගිහි නායකයා ගරු පූජාප්‍රසාදීන් වහන්සේ පිරිසක් සමඟ පැමිණ ඔවුන් ගෙන් විසි දහසක් පමණ කිතු දහමට කුල වද්දන ලද නමුත් ඔවුන් තුළ දහම ගැන වැඩි අවබෝධයක් නො වීය. මෙ තැන් සිට යළි හුදෙකලා ජීවත් වූ මේ පිරිස, නමින් පමණක් කිතුනුවෝ වූහ.

මේ පිරිස දෙමළ බස කතා කළහ. සාවියර් පියතුමා දෙමළ බස නො දැන සිටියත් භාෂා පරිවර්තකයකු සමඟ මයිල සියයකට අධික මේ වෙරළබඩ ප්‍රදේශයේ ගමෙන් ගමට ගමන් කළෝ ය.

එසේ යමින් ඔවුනට දහම හොඳින් අවබෝධ කැර දුණි. මේ සඳහා එතුමා දෙමළ බසින් සකස් කරන ලද කුඩා ධර්මෝපදේශ ග්‍රන්ථයක් ද උපයෝගී කැර ගත්තේ ය. එසේ එතුමන් පැමිණි සැම ග්‍රාමයක් තුළ ම කිතුනු ඒකක පිහිටුවා ඒවා බාරව ගිහි නායකයන් පත් කළේ ය. මෙසේ පරවර ජනතාව දහම පිළිබඳ සවිමත් පදනමක් ලදහ. පරවර පිරිස මෙන් ම ඒ අසළ සිටි තවත් ධීවර පිරිසක් ද වූහ. දෙමළ බසින් කරෙයිවරු හෙවත් කදෙයිවරු ලෙස හඳුන්වන ලද මේ පිරිස මෙතෙක් කිතු දහම ගැන දැන සිටියේ නැත. දකුණේ වසරක පමණ කාලයක් රැඳී සිටි සාවියර් පියතුමා ක්‍රි.ව. 1543 සැප්තැම්බර් මස පෙරළා ගෝවේ පුරය බලා ගියේ ය. එහි දී තමන් සමඟ ගමන් ආරම්භ කොට මඟ (මොසැම්බික්හි) රැඳී සිටි පියවරුන් ද පැමිණ සිට හමුවි ය. මේ අනුව ඉන් එක් පියතුමකු ඇතුළුව තවත් සිව් දෙනකු සමඟ යළි දකුණු වෙරළබඩ ප්‍රදේශයට සාවියර් පියතුමා පැමිණියේ ය. මෙසේ ක්‍රි.ව. 1544 දී එතුමන් සමඟ පැමිණියේ ජේසු නිකායික ගරු සහෝදර ෆ්‍රැන්සිස්කෝ මන්සිල්හාස්, පදවි පූජකවර ගරු ජුවාන් ද ලිසානෝ සහ ෆ්‍රැන්සිස්කෝ කොහේලෝ මෙන් ම පෘතුගීසි ජාතිකයකු වූ ජුවාම් ද ආර්ටියාගා ය. මේ පිරිස වෙරළබඩ ගම්මාන තුළ විසිර ගොස් විශාල දූත සේවාවක් කළෝ ය.

මේ කාලයේ මන්නාරම ඇතුළුව දිවයිනේ බටහිර වෙරළබඩ ධීවර පිරිස සහ ඉන්දීය ධීවර තුඩුවේ විසූ ජනතාව ද අතර කිට්ටු සබඳතා පැවැති බව වාර්තා වන්නේ ය. එකම රැකියාව කරමින් එක ම කුලයට අයත් මේ දෙ පිරිස අතර එසේ සම්බන්ධතා පැවැතීම පුදුමයට හේතුවක් නො වේ. සොළොස් වැනි සත වසරේ ඉන්දියාවට මෙම කුලයට අයත් පිරිසගෙන් කණ්ඩායමක් මෙහි පැමිණි බව පෘතුගීසි වාර්තාවක සඳහන් වන්නේ ය.

මන්නාරමේ මේ පිරිසට මෙම "සුදු ස්වාමියාර්" වසරක් පමණ කාලයක් තුළ කරැති සේවාව ගැන ආරංචි ලැබිණි. එතුමා ගේ දැහැමි හා ශික්ෂාකාමී පැවැත්ම ගැනත්, ජනතා සමීප සේවාව ගැනත් මන්නාරමේ පිරිස දැනගත්හ. "පෙරිය පාද්‍රේ" හෙවත් "ලොකු ස්වාමි" නමින් එහි විශාල ගෞරවයට පාත්‍ර වී සිටි එතුමන් මෙහි ද ගෙන්වා ගැනීම ඔවුන් ගේ අපේක්ෂාව විය. මෙසේ සාවියර් පියතුමනට මන්නාරම වෙත වැඩම කරන ලෙස ආරාධනා කරන ලදි.



**යටගිය දවස**

**විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**120**


මන්නාරමේ කිතුනු පිරිස හුදෙක් තම ආරක්ෂාව පිණිස පෘතුගීසින් ගේ සිත් දිනා ගැනීමේ චේතනාවෙන් මෙසේ ආරාධනා කළහුද යන්න ඇතැම්හු ප්‍රශ්න කරත්. එහෙත් සාවියර් පියතුමා ගේ ලිපි වලින් ම පැහැදිලි වන්නේ එසේ නො වන බව යි. ගරු ෆ්‍රැන්සිස් සාවියර් පියතුමා ගේ යහපත් පැවැත් ම සහ සේවාව ද හොඳින් හඳුනා ගෙන සිටි මේ පිරිස කිතු දහම වැළැඳ ගැනීමේ පිරිසිඳු චේතනාවෙන් එසේ කළ බව පැහැදිලි වන්නේ ය.

මෙසේ ආරාධනා ලද ෆ්‍රැන්සිස් සාවියර් පියතුමාට මෙහි පැමිණීම සඳහා පහසුවක් නොතිබිණි. එම නිසා තම හිතවත් සහායක මන්සිල්හාස් පියතුමන් එවන්නට එතුමෝ සැලැසුම් කළෝ ය. එම උත්සාහය ද අසාර්ථක විය. එම පියතුමාට ද තමන් සිටි තුත්තුකුඩියේ පැවැති විරුද්ධවාදීන් ගේ ගැටුම් නිසා සිටි තැනින් ඉවත් වීම අපහසු බව දන්වන ලදි. මේ සියල්ල නිසා එහි සිටි එක ම පදවි පූජක ජුවාම් ද ලිසානෝ පියතුමන් මෙහි එවන ලදි. ජුවාම් ද ලිසානෝ පියතුමෝ මෙහි පැමිණ, ක්‍රි.ව. 1536 දී විසි දහසක් වූ ජන සමූහයක් කිතු දහමේ කුලවැද්දූහ. මේ පිරිස ලැබූ දහම් දැනුම අල්ප බව අමුතුවෙන් කිව යුතු නො වේ. එහෙත් සාවියර් පියතුමන් සැලැසුම් කළ පරිදි, ඒ දැනුම ක්‍රමයෙන් ව්‍යාප්ත කැර දියුණු කරන ලදි. කෙසේ වෙතත් කල් ගත වන්නට පෙර මෙහි වගතුග දනගත් චෙකරාස සේකරන් හෙවත් සංකිලි රජතුමා මේ ගැන වියරු විය. ඒ සඳහා හේතුවූයේ කුමක්දැයි ප්‍රශ්න කළ හැකිය. මේ වන විටත් පෘතුගීසින් සමඟ උරණ වී සිටි නිසා තම රටවැසි පිරිසක් "පෘතුගීසීන් ගෙනා" ආගම වැළැඳ ගැනීමෙන් තමාට විරුද්ධව ඔවුනට පක්ෂපාතී වෙත් දැයි ඇති වූ සැකය නිසා ද? එසේ නැත්නම් ඔවුන් කිතු දහම වැළැඳ ගැනීම පමණක් නිසා එසේ උරණ වූයේ ද? යනු ප්‍රශ්න කිහිපයකි. ඒ කුමක් වූවත් රජ මේ මුළු පිරිසම මරා දැමුවේ ය. මේ අනුව මැරුම් කෑ පිරිස නව කිතුනු පිරිසක් වූවත් එඩිතරව දිවි පිදුවේ කතෝලික දහම කෙරෙහි තමන් දැක් වූ විශ්වාසය නිසාම ය. මොවුන් ඝාතනය කරන ලද්දේ පතිම් නමැති ස්ථානයේ දී ය. පසු කළ හෙළි වී ඇති ලේඛන අනුව මැරුම් කෑ සංඛ්‍යාව හය සියය ඉක්ම වන්නේ ය. මේ සිදුවීම ඛේදජනක වන නමුත් දිවයිනේ කතෝලිකයිනට ජයග්‍රහණයේ ප්‍රතිමූර්තියක් සහ නිදර්ශනයක් ද වන්නේ ය. මේ සියල්ලෝ නිසැකවම ප්‍රාණ පරිත්‍යාගවරු ය.

අද මෙ වැන්නෝ අප අතර ඇත්තහු ද?

කලා සංග්‍රහය

# සන්තානා දීපය




**කර්තෘ - සාගර ජයසිංහ**

කල්පිටියේ කතෝලික දෙව්මැඳුරු පුරාණය ඇසුරු කර ගනිමින් මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨයේ සමෝධාන නිර්මාණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයකු මෙන්ම වරලත් වාස්තු විද්‍යාඥයකු වන සාගර ජයසිංහ සන්තානා දීපය නිර්මාණය කර තිබේ.

කල්පිටිය අර්ධද්වීපයේ කතෝලික උරුමය හඹා යමින් කතෝලික දේවස්ථාන පිළිබඳ ඓතිහාසික තොරතුරු සමඟ ඉතා වටිනා ඡායාරූප රැසකින් සංගෘහිත මේ ග්‍රන්ථය අධ්‍යාපනික වටිනාකමකින් ද යුතුවේ. කතෝලික දෙව්මැඳුරු වල ගෘහ නිර්මාණ ශිල්පයේ ඓතිහාසික වටිනාකම් අධ්‍යයනය කර ලබාගත් තොරතුරු අඩංගු පර්යේෂණාත්මක කෘතියක් මෙසේ එළිදැක්වීම කතෝලික උරුමය සාක්ෂි සහිතව සනාථ කිරීමකි.

තලවිල සාන්ත ආනා පුදබිමේ 250 වැනි ජයන්තිය නිමිත්තෙන් එළිදැක්වූ මේ ග්‍රන්ථය මගින් සියවස් හතරකටත් වඩා පැරැණි කල්පිටියේ කතෝලික උරුමය හා පෞරාණික ගෘහ නිර්මාණ ශිල්පය තෙවන සහස්‍රකයට අනාවරණය කිරීමක් ලෙස හඳුන්වා දිය හැකිය. ඒ සමඟම මෙවන් පෞරාණික කතෝලික සිද්ධස්ථාන හා දෙව්මැඳුරු කාලගුණික හා සොබාවික අතුරු ආන්තරාවන්ට ගොදුරු නොවී නිසි නඩත්තු කටයුතු වලින් පවත්වාගෙන යෑමේ බරපතළ අභියෝගයක්ද මතුව ඇත. සන්තානාදීපය මෙරට ප්‍රකට කතෝලික දේවස්ථාන නිර්මාණ පිළිබඳව උනන්දු වන සියලු ගවේෂකයන්ට මෙන්ම පර්යේෂකයන්ටද මූලික අත්පොතක් වනු නොඅනුමානය. සාගර ජයසිංහයන්ට ඥානාර්ථ ප්‍රදීපයෙන් උණුසුම් සුබ පැතුම්!

# කතෝලික අධ්‍යාපනය සහ පාසල් රජයට පවරා ගැනීම



**කර්තෘ - ඩබ්ලිව් එම්. ප්‍රනාන්දු**
**මිළ - රු. 300/=**

කතෝලික අධ්‍යාපනය සහ, පාසල් රජයට පවරා ගැනීම නමැති මේ ග්‍රන්ථය මෙරට කතෝලික පොත්පත් ක්ෂේත්‍රයේ බරපතළ හිඩැසක් පුරවාලීමේ වෑයමක් ලෙස දක්වනු කැමැත්තෙමි. කතෝලික පුහුණු ගුරුවරයකු, පාර්ලිමේන්තු හැන්සාඩ් සංස්කාරකවරයකු මෙන්ම අගරදගුරු පදවි අධ්‍යාපන කාර්යාලයේ නිලදරුවකු ලෙස හැට වසරකට අධික කාලයක අත්දැකීම් වලින් සපිරි ඩබ්ලිව් එම්. ප්‍රනාන්දු ශූරීන් අද බහුතර ජනතාවගේ කතාබහට ලක්වූ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව ග්‍රන්ථයක් පළකිරීම ඉතා වැදගත්ය.

විශේෂයෙන් අධ්‍යාපනය එකම කැඳහැලියක් බවට පත්වී එහි නියමුවෝ විවිධාකාර නුල් සූත්තර මගින් වැඩ පෙන්නන්නට වෑයම් කළද දූ දරු පරපුරත්. දෙමාපිය වැඩිහිටි පරපුරත් එක සේ පීඩාවට හෙළා ඇති බැව් නොරහසකි. පාසල් රජයට පවරා ගැනීම කතෝලික සභාව ආණ්ඩු මට්ටු කිරීමේ කදිම නිමිත්තක් ලෙස එදා බලධාරීන් පුච්චානම් බස් දෙඩුවද ඉන් දශක හයකට පසු රටම පත්ව ඇති අධ්‍යාපන අවුල ගැන සලකා බලන කල ආණ්ඩු මට්ටු වී ඇත්තේ අහිංසක දරු පරපුර බැව් අමුතුවෙන් කිව යුතු නොවේ.

පාසල් රජයට පවරා ගැනීම නිසා මෙරට අධ්‍යාපනය ලබන දරුවන්ට විශේෂයෙන් කතෝලික දරුවන් - දෙමාපියන් මුහුණපාන ගැටලු පිළිබඳ ලත් අත්දැකීම් වලින් හැට වසරකට පසු ඒ දෙස ආපසු හැරී බැලීමේ පියවරක් ලෙස මේ ග්‍රන්ථය හඳුන්වා දිය හැකිය. පවරා ගැනීමේදී පැනවූ නීති රජයයන් හා නිළධාරීන් විසින්ම කඩකොට ඇති අන්දම ගැන කරන හෙළිදරව්ව අපූරුය. කතුවරයාට ප්‍රදීප සුබාසිරි.

# 'උපතක අරුතක්' දොරට වඩී



ගරු රෝෂන් ජනක පියතුමාගේ කුළුදුල් ගීතිකා සංයුක්ත තැටිය 'උපතක අරුතක්' ලෙසින් කුරණ ශා. ජුඩ් විදුහල් ශ්‍රවණාගාරයේදී අති උත්කර්ෂවත් අන්දමින් දොරට වැඩියේය. මෙහි ඇතුලත් බොහෝ ගීතිකා අම්පිටිය ජාතික දෙව්සත්හලේ කැරොල් ගායනා තරගවලින් ජයග්‍රහණ ලැබූ ඒවා වන අතර සියලුම ගීතිකා ජාතික ජනවන්දනා කොමිසමේ අනුමැතිය සහිතය. එදින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමාට ප්‍රථම සංයුක්ත තැටිය පිරිනැමූ අයුරු සේයාරුවෙන් දැක්වේ.

# වත්මන් ගුරු භූමිකාවේ අභියෝග



**කර්තෘ - ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු**
**මිළ - රු. 100/=**

ශාස්ත්‍රවේදී උපාධිධාරිණී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරිනි ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු මහත්මිය සිය විසි වසරක ගුරුවෘත්තීය අත්දැකීම් පාදක කරගනිමින් මේ ග්‍රන්ථය සම්පාදනය කර තිබේ.

දෙමාපියන් රැකියාවන්හි නියැලෙන පවුල් වල දරුවන් මවුපියන් විදේශගතවීම නිසා හුදකලා වන දරු දැරියන්, පරිගණකය ජංගම දුරකතනය, රූපවාහිනියේ විවිධ වැඩසටහන් අතර වල්මත්වන සිසු දරුවන් කිසිදු හවිහරණක් නැතිව පංති කාමරයට ප්‍රවේශ වීම නිසා මතුවන තත්ත්වය මේ ග්‍රන්ථයෙන් අපූරුවට හෙළිදරව්වේ. නූතන ගුරු භූමිකාව හුදෙක් පොතපත ඇසුරේ හෝ දැනුම ලබාදීමේ ක්‍රියාදාමයෙන් පමණක් සැනසීමට හැකි තත්ත්වයක පවතීද?

ස්වකීය විෂය ධාරාව තුළ දැනුමෙන් පූර්ණත්වයට පත්වීමෙන් පමණක් නූතන ගුරුවරයාට සාර්ථක විය හැකිදැයි යන්න විමසන කතුවරිය සිසු නිපුණතා සංවර්ධනය අද ගුරුවරයා හමුවේ ඇති ප්‍රධාන අභියෝගය වී ඇති සමයක නිර්මාණශීලිව ප්‍රතිචාර දැක්වීමේ ප්‍රවේශයක වැදගත්කම කතුවරිය අවධාරණය කරන්නීය. බොහෝවිට ශිෂ්‍යයා කේන්ද්‍රකරගත් අධ්‍යාපන රටාවක් වෙනුවට දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමවේදයක් මගින් සිදුවන තත්ත්වයද අවධානයට ගත යුතුය. වත්මන් ගුරු භූමිකාවේ සන්දර්භය ඇසුරු කර ගනිමින් එහි අභියෝග විමසුමට ලක් කරන කතුවරිය ප්‍රායෝගික තලයක පිහිටා සිය මතවාදයන් ඉදිරිපත් කරන්නීය. ගුරු වෘත්තීය හුදු ටියුෂන් රස්සාවට පමණක් පේවී ඇතැයි යන මතවාද සිසු දෙමාපිය දෙපිරිස අතර පැතිරයන වකවානුවක වත්මන් ගුරු භූමිකාවේ අභියෝග මගින් කතුවරිය ඒ සියලු දෙනා අවදිකරන්නට සමත් වන්නීය. කතුවරියට ප්‍රදීප සුපැතුම්!

# සඳුට හොරෙන්



**කර්තෘ - ලිලී ඇග්නස් සියඹලාපිටිය**
**මිළ - රු. 150/=**

ඥානාර්ථ ප්‍රදීපය සුහද සේවා වාර්තාකාරිණියක මෙන්ම කිතුනුලේඛිකාවකවනකටුවාපිටියේ ලිලී ඇග්නස් සියඹලාපිටිය, සිය පස්වන නිර්මාණ සංග්‍රහය 'සඳුට හොරෙන්' එළි දක්වා ඇත.

කෙටිකතා දොළසකින් සංගෘහිත සඳුට හොරෙන් ග්‍රන්ථය තුළින් කිතුනුවාට නිසගයෙන් උරුම විය යුතු උපේක්ෂාවේ මහඟු ගුණාංගය ඉස්මතුව පෙනේ. දිරිය හා සවිය පෙරටුකරගෙන උත්තම උපේක්ෂාවෙන් දිවි මඟ සරණ කිතුනු ලේඛිකාවකි.

මේ නිසාම සිය ජීවන මඟේ ලත් දහසකුත් එකක් අත්දැකීම් තුරුළු කර ගනිමින් ජීවිතය ජයගන්නට වෙර දරණ සමාජයට පහනක් ලෙස දැවී යන්නට ඇරියුම් කරන කතුවරිය පරාජයට බියවී ඇදවැටී මුළු ගැන්වී සිටිනවාට වඩා ඒ තුළින් නැගිටීමට සිය ජීවිත අත්දැකීම් උපයෝගි කර ගනී.

අසුබවාදී ලෙස දුප්පත්කම, දරිද්‍රතාව පීඩාවන් දෙස නොබලා ඒ දුෂ්කරතා ජයගැනීමට ආත්ම විශ්වාසය හා දිරිමත් බවේ මෙවලමින් සන්නද්ධ වීමට ඇරියුම් කරයි. සිය ලේඛක ගමන් මඟේ දෙවන කෙටිකතා සංග්‍රහය ලෙස සඳුට හොරෙන් එළිදක්වන කතුවරිය ඒ ඔස්සේ පළකරන උපේක්ෂා සහගත බවේ දැක්ම කොයි කාටත් කදිම ආදර්ශයකි. කතුවරියට ප්‍රදීප සුබාසිරි.

# ආර්ථික විද්‍යාව ව්‍යුහගත විසඳුම්



**කර්තෘ - වින්සන් මර්වින් ප්‍රනාන්දු**
**මිළ - රු. 550/=**


ප්‍රවීන ආර්ථික විද්‍යා විශ්ලේෂකයකු, දේශකයකු, ගුරුවරයකු වන වින්සන් මර්වින් ප්‍රනාන්දු ග්‍රන්ථ ගණනාවක් නිකුත් කළ ලේඛකයෙකි. 2012 සිට නව නිර්දේශිත ආර්ථික විද්‍යාව ව්‍යුහගත විසඳුම් 2 - විභාග අත්වැල ග්‍රන්ථය ඔහුගේ නවතම නිර්මාණයයි.

කතෝලික ලේඛකයකු ලෙස ඥානාර්ථ ප්‍රදීපයෙන් අත්පොත් තැබූ ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥයකු ලෙස මෙරට මෙන්ම එතෙර ද ප්‍රකට චරිතයකි. වසර ගණනාවක් තිස්සේ මෙරට ආර්ථික විද්‍යා සිසුන්ට අත්වැල් සපයන විභාග අත්වැල පොත් පෙළ සම්පාදනය කළ කතුවරයා මෙවර නව නිර්දේශයටද අනුකූලව ග්‍රන්ථය සකස් කර ඇත.

මෙහි සෑම ඒකකයකටම අදාළව ආර්ථික විද්‍යාව 11 ව්‍යුහගත රචනා ගැටලු අන්තර්ගත කොට තිබීම සුවිශේෂී ලක්ෂණයකි. ප්‍රශ්න පිළියෙළ කිරීමේදී 2012 සිට ක්‍රියාත්මක වන සංශෝධිත නව නිර්දේශයට අනුව ප්‍රශ්න සැකසීම සුබ ලකුණකි. අලුත්ම තොරතුරු සහිත ව්‍යුහගත රචනා ගැටලු හා විසඳුම් වලට එක්වීම තවත් ලක්ෂණයකි.

මේ ආදි වශයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳව හසල දැනුමක්, බුද්ධියක් මෙන්ම ප්‍රවීන අත්දැකීම් රාශියක් කැටිකරගත් වින්සන් මර්වින් ප්‍රනාන්දු සූරීන්ගේ මේ ග්‍රන්ථය මෙරට සිසු දරු පරපුරට මහඟු අත්වැලක් වනු නොඅනුමානය. කතුවරයාට අපෙන් සුපැතුම්!

# දේව රාජ්‍යයේ උදාව (දෙවිඳුන් මිනිසකු ලෙසින්)




**කර්තෘ - ගරු නිමාල් පෙරේරා පැවදි සොයුරිය**
**මිළ - රු. 280/=**

දේව රාජ්‍යයේ උදාව යන පුළුල් තේමාව ඔස්සේ ගරු නිමාල් පෙරේරා පැවදි සොයුරිය මීට පෙර ආලෝකවත් හදවතකින් ප්‍රඥාවේ ජීවිතයක්, විශ්මිත විශ්වය කිතුනු ඇසින්, ආදරය පිටුපා යන මිනිසුන් ග්‍රන්ථ කාණ්ඩ තුන නිකුත් කළ අතර නවතම කාණ්ඩය දෙවිඳුන් මිනිසකු ලෙසින් මිනිස් ලොවට යන තේමාව ඔස්සේ එළිදැක තිබේ. එය නව ගිවිසුමට පිවිසීමකි. මුල් කාණ්ඩ තුන පැරැණි ගිවිසුම තුළ සම්පාදනය කළ කතුවරිය නව ගිවිසුම ඔස්සේ පියමං තැබීමට මේ ග්‍රන්ථය අත්වැලක් කර ගන්නීය.

මේ ග්‍රන්ථය තුළින් දේව රාජ්‍ය හඳුනා ගැනීමට ඇරියුම් කර කතුවරිය මිනිස් සමානාත්මකතාවය තුළ මිනිස් ගරුත්වය රැකෙන සෑම මිනිසකු ජීවත්වන සමාජයක්, දේශයක්, ලෝකයක් ගොඩනැංවීමට මඟ පෙන්වයි. මේ දේශයේ ජීවත්වන ඇතැමුන් දේව රාජ්‍යය පිළිබඳ ඇතිකරගෙන සිටින වැරැදි මතවාදයන්ද, බලහත්කාරයෙන් ආගමට හරවා ගැනීමක් ලෙසද අර්ථ දැක්වීම නිවැරැදි කරන කතුවරිය කිතු දහම අවතක්සේරු කිරීමෙන්, දහමට අපහාස උපහාස කිරීමෙන් නොනැවතී අන්තවාදී ලෙස ගැරහීම ගැන උපේක්ෂාවෙන් බලන්නීය.

දේව රාජ්‍යයේ සැබෑ වටිනාකම් හා සමාජ අරමුණු මත ජේසුන් වහන්සේගේ වැඩසිටීමේ ජීවමාන සංකේතය ලෙස ශුද්ධ වූ කතෝලික සභාව හඳුන්වන කතුවරිය මේ සභාවේ පැවැත්ම පවතිනුයේ ජේසුන් වහන්සේට ලෝකය තුළ සාක්ෂි දැරීමෙන් බව අවධාරණය කරන්නීය. දේව රාජ්‍යය පිළිබඳ දේවධර්මය මැනවින් ප්‍රගුණ කර සිටින මරියතුමියගේ ප්‍රැන්සිස්කාන පැවදි නිකායේ ගරු නිමාල් පෙරේරා පැවිදි සොයුරියගේ මේ වෑයම අගය කරන අතර ඉදිරි කටයුතු වලටද ප්‍රදීපයෙන් පිදෙන සුබාසිංසනයයි මේ.

# ප්‍රඥා සාහිත්‍යයේ ජෝබ් විවරණය සහ දෙව් මිනිස් සබඳතාවය



**කර්තෘ - නීටා ලෝවි**
**මිළ - රු. 450/=**

කැළණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ණී නීටා ලෝවි ප්‍රඥා සාහිත්‍යයේ ජෝබ් විවරණය සහ දෙව් මිනිස් සබඳතාවය යන ග්‍රන්ථය මගින් අවුරුදු දහස් ගණනකට පෙර හේබ්‍රෙව් භාෂාවෙන් ලියන ලද පුරාතන සාහිත්‍යයේ උත්තම කෘතියක් ලෙස සැලකෙන, ශුද්ධ බයිබලයට අයත් ග්‍රන්ථ මාලාවේ ඇති ජෝබ් කතාව තුළ අන්තර්ගතය විමර්ශනාත්මකව අධ්‍යයනය කර විවරණය කිරීමට උත්සුකව සිටී.

ශුද්ධ බයිබලය දේවානුභාවයෙන් සම්පාදිත ධර්ම පුස්තකයක් ලෙස සලකන කල්හි ප්‍රඥා සාහිත්‍යයේ උත්තම ගණයේ ග්‍රන්ථද ඊට අයත් වේ. ඒ අතරින් ජෝබ් කතාවට ඉහළ තැනක් ලැබේ. හුදෙක් උත්තම සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස ලෝකයේ පිළිගැනීමට ලක්වුවද කිතුනු විශ්වාසයට අනුව ශුද්ධ බයිබලයේ ඇත්තේ දේව වචනයයි. එම නිසා එය ශුද්ධ වූ ග්‍රන්ථයකි. මේ ග්‍රන්ථ අතර ජෝබ්ගේ කතාවද වේ. ප්‍රඥා සාහිත්‍යයේ ඉමහත් බලපෑමක් ලබා ඇති ජෝබ්ගේ කතාව මතුපිටින් ඉතා සරල ආකාරයට අර්ථ ගෙන දෙන ලෙස ඉදිරිපත් කැරේ. ඊශ්‍රායෙල් ජාතිකයකු නොවන විදේශිකයකු ලෙස ලෞකික සකල සැපසම්පතින් ආඪ්‍යව, දැඩි දේව විශ්වාසයෙන් හා ගරුබියෙන් දිවි ගෙවූ තැනැත්තෙකි. දුක් විඳීම හුදු වරදකට ලැබෙන දඬුවමක් හෝ වරදක ප්‍රතිඵලයක් නොවන බැව් මින් අපූරුවට ඉදිරිපත් කැරේ.

මේ විවරණය සමඟ ජෝබ්ගේ කතාවද පාඨකයාට ලබාදීමට ගත් තීරණය ඉතා ඵලදායි එකකි. ප්‍රඥා සාහිත්‍යයේ අපූර්වතම ග්‍රන්ථයක් සිංහල බසින් විවරණයකර පාඨකයාට ලබාදීමට ගත් වෑයමට ප්‍රදීප සුපැතුම්!

**මෛත්‍රී**

173

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු



කුඹුරට බැස්සම මඩ ගෑවෙනවා
විලකට බැස්සම මඩ පෑගෙනවා
පාරට බැස්සම මඩ තැවරෙනවා
චන්දෙට බැස්සම මඩ නාවනවා

චට පට ගා පුපුරනවා රටේ රතිඤ්ඤං
සට සට ගා පැතිරෙනවා බොරුව බොලඤ්ඤං
කට කට ගා කඩවෙනවා පොරොන්දු දෙඤ්ඤං
බස බස ගා රටම හබක් අඤ්ඤං මඤ්ඤං

**ගායනය : දියවන්නාවේ හීන් බණ්ඩා**

විශ්ව සභාව

බැසිල් ෆොන්සේකා විසිනි

# ආගමික නිදහස නොමැති රටවල ජීවත්වන ජනතාව බිලියනයකි




ලෝකයේ බෙහෝ රටවල් විසින් ඒ ඒ ජනතාවගේ ආගමික නිදහස විවිධාකාරයෙන් යටපත් කොට ඇත. එලෙස ආගමික නිදහස අහිමිකර ඇත්තාවූ ජන සංඛ්‍යාව බිලියනයකට අධික යයි ද වාර්තා කරනු ලැබ ඇත්තේ, ජූලි මස 30 වැනිදා නිකුත් කර ඇති ආගමික නිදහස පිළිබඳ ජාත්‍යන්තර වාර්තාව මගිනි.

ආගමික නිදහස පිළිබඳව ලෝකය විසින් අනුගමනය කරනු ලබන්නේ පස්සට රුට්ටා යන ප්‍රතිපත්තියක් යැයි ද එහි දක්වා ඇත. ආගම් මර්ධනය කිරීම විවිධාකාරයෙන් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන රටවල් වශයෙන් චීනය, එරිත්‍රෙයාව, ඉරානය, උතුරු කොරියාව, සවුදි අරාබිය, සුඩානය, බුරුමය, උස්බෙකිස්ථානය නම් කොට ඇත.

තවද ඒ ඒ ආගමික කොටස් විවිධ රටවල විවිධාකාරයේ මර්ධනයන්ට පාත්‍ර වෙමින් පවතී. නිදර්ශන වශයෙන් ක්‍රිස්තියානින් ඊජිප්තුවේ ද සුන්නි මුස්ලිම්වරු ඉන්දුනීසියාවේ ද කිතුනු, මුස්ලිම් සහ බෞද්ධ බැතිමතුන් චීනයේද මුස්ලිම්වරුන් බොහෝ යුරෝපීය රටවල ද ආගමික හිංසනයට පාත්‍ර වන බැව් වාර්තා වේ.

බෙල්ජියම හා ප්‍රංශය විසින් මුස්ලිම් බැතිමතුන්ට යම් යම් වෙනස්කම් ඇති කැරෙනා බැව් ද දක්වා ඇත. අන්තවාදී ආගමික කණ්ඩායම් විසින් ද කිතුනුවන්ට හිරිහැර පමුණුවන බැව් අරාබි ලෝකයෙන් නිරන්තරයෙන් වාර්තා වේ. 'බොකෝ හරාම්' වනි අන්තවාදි මුස්ලිම් ත්‍රස්ත කණ්ඩායම් විසින් ද කිතුනුවන් හට පීඩා කරනා බැව් නිරන්තරයෙන් වාර්තා වේ. ඒකපාක්ෂික ඉස්ලාම් පරිභව නීතිය ද සුළුතර ආගමිකයන් කෙරෙහි අසාධාරණ ලෙසින් භාවිත කරනා බැව් ද වාර්තා වේ.

# හිට්ලර්ගේ මෙහෙයුමෙන් ජිප්සි ගෝත්‍රිකයන් 5,00000 ක ඝාතනය සිහි ගැන්වේ



අගෝස්තු මස 03 වැනිදා දහවල් දොළහට ලන්ඩනයේ හයිඩ් පාක් හී පිහිටි හිට්ලර්ගේ ඝාතක ස්මාරකය අභිමුවෙහි දි ජිප්සි ගෝත්‍රිකයන් 5,00000 මරා දැමීම සිහි ගැන්වීමේ මෙහෙයක් පවත්වන ලදී. ජිප්සි ගෝත්‍රිකයන්ගේ කළු පැහැති ධජය අහසට නංවමින් විනාඩි කීපයක නිහඬතාවයකින් පසුව යැදුම් මෙහෙය ආරම්භ කෙරුණි.

තවද යුරෝපීය ජිප්සි ගෝත්‍රික සංචාරකයන්ගේ සංසදය විසින් ද ඝාතනය කරනු ලැබූ සිය ජනතාව සිහිකරලීමේ මෙහෙයක් එම ස්ථානයේදීම පෙර දින පවත්වනු ලැබීය. වර්ෂ 1944 අගෝස්තු මස 03 වැනිදා අවසන් වරට ජිප්සි ගෝත්‍රිකයන් 3000 කට වැඩි සංඛ්‍යාවක් මරා දමනු ලැබූ අවස්ථාව ඇසූ දුටු අයගේ සාක්ෂි ඔස්සේ සටහන් කොට ඇත. අයුෂ් විච් නම් වදකාගාරයේදී එම ඝාතනය ක්‍රියාත්මක කරනු ලැබීය. ඝාතනයට සූදානම් කිරීමේදි 3000 කට වැඩි එම මහා පිරිස අතර සිටි ගැහැනු ද, දරුවන් ද වයස්ගත වූවන් ද දෑත් නගමින් හඬා වැටුණු අයුරු නට්සි පාප කර්මයේ ඉතිහාසය තුළ ලියැවී ඇත. ජිප්සි ගෝත්‍රිකයන්ගේ ශෝකාලාපය අදත් පවතින බැව් සමාජ ක්‍රියාකරුවන් විසින් අදත් හුවා දක්වනු ලබයි. ලෝකයේ විවිධ රටවල ජීවත්වන ජිප්සි ගෝත්‍රිකයන් සමාජ පැවැත්ම තුළ කොන් කිරීම් ද ඔවුන් ඒ ඒ ප්‍රදේශ වලින් පන්නා දැමීම ද මරණහානි පැමිණවීම ද තවමත් කැරෙනා බැව් දැක්වේ. එබැවින් හිට්ලර් විසින් ජිප්සි ගෝත්‍රිකයන් විනාශ කිරීම වැනි කාර්යයන් අද නොකෙරුණත් ඔවුන්ට කැරෙන පීඩන නොනැවතී පවත්නා හෙයින් ඔවුන්ගේ සමාජ අයිතීන් සඳහා ජාත්‍යන්තර හඬ බලගතු විය යුතු යයි ද ජිප්සි ගෝත්‍රිකයන්ගේ පිරිසක් ශුද්ධොත්තම පියාණන් හමුවූ අවස්ථාවේදී ද එතුමන් විසින් අවධාරණය කරනු ලැබීය.

# රාමසාන් කාලයේ සාත්තු සේවකයින් බිවූ තේ විෂ වේ

ජූලි මස 30 වැනිදා පකිස්තානයේ කරච්චියේ පිහිටි මහ රෝහලේ මුස්ලිම් නොවන සාත්තු සේවකයින් පිරිසක් සවස තේ බීවේ රාමසාන් කාලය පවතිද්දීය. තේ පානය අවසන් වී විනාඩි 10 ක් ගතවීමටත් පෙර තේ පානය කළ එකොළොස්දෙනා හදිසියෙන්ම රෝගාතුර වූහ. එම එකොළොස්දෙනා අතර කිතුනුවන් හතර දෙනෙක් ද අනෙක් අය ඉස්ලාම් නොවන ආගමිකයෝ ද වූහ.

කීප දෙනෙක් ඇඩ් සත්කාරයේ ප්‍රතිකාර ලැබූ අතර මරණ හානි සිදු නොවුණත් ඔවුන් ආරක්ෂක තත්ත්වයේ තබන ලදී. මේ අතර තුරේදි කරනු ලැබූ පරීක්ෂණ වලින් හෙළි වී ඇත්තේ පානය කරන ලද තේ හා වසක් මිශ්‍ර වී ඇති බවයි. රෝහල් බලධාරීන්ගේ ද මතය වී ඇත්තේ අන්තවාදී මුස්ලිම් පිරිසක් විසින් එම අමානුෂික වස මිශ්‍රණය කරති බවය. රාමසාන් කාලය ගෙවී යන්ට ප්‍රථම ඇතැම් ඉස්ලාම් ආගමිකයන් විසින් කරති මේ දුර්දාන්ත ක්‍රියාව සියළුමදෙනා විසින් අධම ක්‍රියාවක් සේ පිළිගෙන තිබේ. තවද සාමය හා සාධාරණය පිළිබඳ කතෝලික කොමිෂන් සභාව විසින් ද මෙම දීන හීන ක්‍රියාව හෙලා දකිමින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ආගමික නිදහසට එරෙහිවීමක් ලෙසින් පෙන්වා දෙමිනි. 'කරච්චි ප්‍රදේශය තුළ බෙහෝ අවස්ථාවන් හිදි සුළුතර ආගමිකයන්ගේ නිදහසට බාධා පමුණුවන බැව් සත්‍යයකි. එබැවින් මෙවැනි දුර්දාන්ත ක්‍රියාවන්ට අනුබල නොදී ආගමික සහෝදරත්වය සුරැකීම සියළු ජන කොටස්වල යුතුකම් වෙනවා." මෙලෙසින් ප්‍රකාශ කරනු ලැබුවේ කරච්චියේදී ජෝශප් කවුස් අගරදගුරු හිමිපාණෝය.

ඊජිප්තු ගම්මානයකින් කිතුනු පවුල් 100 ක් එළැවේ. ඊජිප්තුවේ දකුණු කයිරෝවේ පිහිටි ඩෂූර් නම් ගමේ ජීවත්වූ කිතුනු ව්‍යාපාරිකයකු සමඟ මුස්ලිම් පිරිසක් අගෝස්තු 1 වැනිදා අරගලයක් ඇති කර ගත්තෝය. එම අරගලයේ ප්‍රතිඵලයක් වශයෙන් තව තවත් මුස්ලිම් පිරිස් ගමේ වෙසෙන කිතුනුවන්ට පහර දෙන්නට වූහ. එම පහර දීමේදී කිතුනුවෝ 15 දෙනෙක් බරපතළ තුවාළ ලදහ. තව තවත් පහරදීම් 100 ට වැඩි පවුල් සංඛ්‍යාවක් ගමෙන් එළවා දමන ලදි. තවද දෙව් මැඳුරු ද, කඩ සාප්පුද, ගෙවල් දොරවල්ද ගණනාවක් පුළුස්සා දමා ඇතැයි වාර්තාවේ. සියල්ල අතහැර ගිය කිතුනුවෝ ආරක්ෂක ස්ථාන වල රැඳී සිටිති.

# ගබ්සාවන්ට එරෙහි දින 40 ක ජපමාල බැතිය

ලන්ඩනයේ 'ජීවිත සුරැකීමේ 40 දින' නමැති සංවිධානය විසින් ගබ්සාවට එරෙහි දින 40 සර්ව රාත්‍රික ජපමාල යැදුම දැනටමත් ආරම්භ කර ඇත. මෙම සර්ව රාත්‍රික ජපමාල උච්චාරණය කරනු ලබනුයේ ගබ්සාව පවත්වාගෙන යන ඒ ඒ චිකිත්සාගාර පරිසරයන් හිදීය.

මෙම ජපමාලයේ දේව කන්නලව්ව සඳහා ජනතාව වැඩි වැඩියෙන් එකතු වන හෙයින් ඊට විරුද්ධව ගබ්සාවට පක්ෂ ක්‍රියාකරුවන් විසින් ද විරෝධතාවයන් සංවිධානය කර ඇතත් ජපමාල බැතිය එලෙසම කරගෙන යනු ලැබේ. ඇතැම් මාධ්‍යයන් විසින් ද ජීවිත සුරැකීමේ හතළිස් දිනැ ජපමාල බැතියට එරෙහිව පුවත් පළ කර ඇතත් දිනෙන් දිනැ එම ජපමාල බැතිය වර්ධනය වන බැව් ද වාර්තා වේ. තවද ඇතැම් නීතිඥයන් විසින් ද ගබ්සාවට පක්ෂව ඉදිරිපත් වෙමින් ගබ්සා විරෝධි හතළිස් දිනැ සර්ව රාත්‍රික ජපමාල බැතියට එරෙහිව නීති මගට බසිනා බවට තර්ජනය කළත් ඇදැහිළි වන්තයෝ හතළිස් දින ජපමාල බැතියේ නොතිත්ව යෙදෙනා බැව් කතෝලික පුවත් වාර්තා කරයි.

# දෙව් මැඳුරක් තුළ 19 දෙනෙක් මරා දමති

අගෝස්තු මස 06 වෙනිදා නයිජීරියාවේ මධ්‍යම පළාතේ පිහිටි දෙව් මැඳුරකට කඩා වැදුණු ත්‍රස්තයෝ තිදෙනෙක් ආලෝකය විසන්ධි කොට අඳුරේ වෙඩි තබන්නට පටන් ගත්තෝය. තප්පර කීපයක් තුළදී 19 දෙනෙක් මැරී වැටී ඇත. පොලිසිය විසින් වාර්තා කරති පරිදි තවත් විසි දෙනෙක් පමණ මරණහානි ලබා ඇත.

අන්ධකාරය නිසා කිසිවකුට දෙව් මැඳුරෙන් පිටතට යෑමට නොහැකි වූ බැව් තුවාල ලබා රෝහල් ගතව සිටින ලෝවන් සිලියු විසින් මාධ්‍යයට පවසා ඇත. මෙවර ද 'බොකෝ හරාම්' නමැති ත්‍රස්ත කණ්ඩායම් විසින් එම ඝාතනය සිදු කරති බැව් නිගමනය කළ හැකි වූවත් එතෙක් සැකකටයුතු කිසිවෙක් නීතියේ රැහැනට හසුකර ගැන්මට නොහැකි වී ඇතැයි පොලිස් ප්‍රකාශකයෙක් මාධ්‍යයට පැවැසුවේය.

මෙයට පෙර අවස්ථා කීපයකදීම බොකෝ හරාම් නැමති ත්‍රස්ත කණ්ඩායම විසින් කිතුනුවන් විශාල සංඛ්‍යාවක් මරා දමා ඇත. මේ වසර තුළදී පමණක් 'බොකෝ හරාම්' සංවිධානය විසින් 660 දෙනෙක් මරා දමා ඇති බවත් ඉන් විශාල සංඛ්‍යාවක් කිතුනුවන් බවත් ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් වාර්තා කැරේ.

නයිජීරියාවේ මුළු ජනගහණය මිලියන 160 කි. එරට උතුරු මුස්ලිම් හා දකුණු කිතුනු වශයෙන් බෙදී පවතී. බොහෝවිට මුස්ලිම්වරු හා කිතුනුවෝ සේවා ස්ථානයන් හිදී එකාවන්ව රාජකාරියෙහි යෙදෙති. දෙපාර්ශවයන් අතර විවාහයන් සිදුවන අවස්ථා එමටය.

එහෙත් එබඳු සහෝදරත්වයේ පැවැත්මකට 'බොකෝ හරාම්' වැනි මුස්ලිම් සංවිධාන විසින් දක්වනු ලබන්නේ දැඩි විරෝධතාවයන්ය.

## සවුදි අරාබියේ හිරේ සිටි කිතුනුවන් පිටුවහල් කැරේ

සවුදි අරාබියේ පෞද්ගලික නිවසක යැඳුමේ යෙදී සිටි කිතුනුවන් තිස් පස් දෙනෙක් ඒ රටේ ආගමික පොලිසිය විසින් වටලනු ලැබුවේ මාස කීපයකට ඉහතදීය.

මෙම සියළු කිතුනුවෝ සවුදි අරාබියට රැකියාව සඳහා පැමිණි ඉතියෝපියානු ජාතිකයෝය. ඔවුන් ඒකරාශි වී යාච්ඤා කිරීමේ වරදට හයමසක් පමණ කාලයක් සිරබත් කන්නට ඔවුන්ට සිදුවිය. සවුදි අරාබියේ රැකියාවට පැමිණෙන ඉස්ලාම් නොවන වෙනත් ආගමිකයන්ට තම තමන්ගේ ආගම පෞද්ගලිකව හෝ පොදුවේ අදහා ගැන්මට කිසිදු අවකාශයක් නොමැත.

රට තුළ පවත්නා සාමාන්‍ය පොලීසියට අමතරව ආගමික පොලීසියක් ද එරටේ ක්‍රියාත්මක වේ. ආගමික පොලීසියේ කාර්යය වී ඇත්තේ ඉස්ලාම් දහම නොඅදහන වෙනත් ආගමිකයන් ඔවුන්ගේ ආගම් ඇදැහීමෙන් වළකාලීමයි. අන්‍යාගමිකයන් විසින් එසේ කරනු ලැබුවහොත් ආගමික පොලීසිය විසින් ඔවුන් අත් අඩංගුවට ගෙන දඬුවම් පැමිණවීම වර්ෂ ගණනාවක් මුළුල්ලේම සිදුවන්නකි.

ඉතියෝපියානු කිතුනුවන් සිරගතකොට තිබියදී තමන් විවිධ තාඩන පීඩන වලට ලක්වූ බැව් ද හෙළි දක්වා ඇත. එමෙන්ම ඉතියෝපියානු කාන්තාවන් විසින් ප්‍රකාශ කරනු ලැබුවේ තමන් ද විවිධ කාමුක අතවරණයන්ට පවා පාත්‍ර කැරුණු බවය. සවුදි අරාබියේ සේවය කරන්නාවූ දහස් සංඛ්‍යාත ශ්‍රමිකයන්ට ඔවුනොවුන්ගේ ආගමික නිදහස අහිමි කර ඇතත් ඒ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව විසින් යම් ක්‍රියා මාර්ගයක් නොගන්නේ මන්දැයි කිතුනු පුවත් විසින් අසනු ලබන පැනයකි.

## ආගම් අදහන හා නොඅදහන රටවල් පිළිබඳ සමීක්ෂණයක්

මෑතදී ජාත්‍යන්තර ජනමත විචාරණ සංවිධානයක් විසින් ආගම් අදහන හා නොඅදහන රටවල් පිළිබඳ සත්‍ය තත්ත්වයන් දැන ගැනීම සඳහා රටවල් 59 ක් ජනමත විචාරණයකට පාත්‍ර කරන ලදි. එම රටවල් පනස් නවයක ජනතාවගෙන් සියයට පනස් නවයක් පවසා ඇත්තේ තමන් සිය ආගම පිළිපදිනා බවයි; සියයට විසි තුනකගේ ප්‍රකාශය වී ඇත්තේ තමන් අයත් ආගම නොඅදහනා බවයි; තවද සියයට දහතුනක ජනතාවක් විසින් පවසා ඇත්තේ තමන් නියත අදේව දෘෂ්ටිකයන් බැවින් කිසිදු ආගමක් නොඅදහනා බවයි.


තමන් අදහන ආගම තම තමන්ගේ ජීවිතයේ ප්‍රමුඛ ස්ථානය ගන්නා බැව් හෙළි දැක්වූ රටවල් අතර ඝානාව, නයිජීරියාව, ආර්මේනියාව, ෆීජි, මැසදෝනියාව, රුමේනියාව, ඉරාකය, කෙන්යාව, පේරු සහ බ්‍රසීලය ප්‍රමුඛ ස්ථානයන් ගනී. තමන් කිසිදු ආගමකට අයත් නැතැයි නියත අදේව දෘෂ්ටිකයන් බැව් ප්‍රකාශ කළ වැඩි ජනතාවන් ජීවත් වන රටවල් නම් චීනය, ජපානය, චෙක් රිපබ්ලික්, ප්‍රංශය, දකුණු කොරියාව, ජර්මනිය, නෙදර්ලන්තය, අවුස්ත්‍රියාව, අයිස්ලන්තය, ඔස්ත්‍රේලියාව සහ අයර්ලන්තයයි.

## අරාබි කරයේ කතෝලික සභා මූලස්ථානය දැන් බහරේනයේ

අරාබිකරයේ වෙසෙන කිතුනු ජනතාවට අධ්‍යාත්මික සේවාවන් සළසනු ලබන කතෝලික සභා මූලස්ථානය දැන් ඇත්තේ බහරේනයේය. අරාබි රටවල උතුරු කරයේ ජනතාව ඇදහිල්ල තුළ බලගතු කිරීමේ කාර්යයන් කමිලෝ බලින්න රදගුරු හිමිපාණන්ගේ මෙහෙයවීම යටතේ සිදුවනු ඇත. බහරේන් හි නව කතෝලික සභා මධ්‍යස්ථානය පිහිටුවීමට සමගාමීව එරටේ ඉදිකරන ලද නව කතෝලික දෙව් මැඳුර ද ආසිරි ගන්වන ලදි. උතුරු ආරාබි කරයේ පිහිටා ඇති දෙව් මැඳුරු පිළිබඳ පාලනයද බහරේන් හි කතෝලික මධ්‍යස්ථානය විසින් සිදු කෙරෙනු ඇත. එම කලාපයේ මිලියන දෙකක් පමණ කතෝලිකයන් දැනට ජීවත්වන බැව් ද කතෝලික පුවත් වාර්තා කරයි.

යොවුන් සංග්‍රහය

# භද්‍ර යෞවනියන්ගේ ආරක්ෂක මුනිවරිය



**ශුද්ධවූ සභාවේ මුනිතුමියන්ගේ නාමාවලියට එක් වූ මරිය ගොරෙත්ති තුමිය මෙලොව එළිය දුටුවේ වර්ෂ 1890 ඔක්තෝබර් මස 16 වැනි දා ය. කොරිනැල්ඩෝ නම් වූ කුඩා නුවර පිහිටියේ ඉතාලියේ ය. එතුමිය ස්වකීය දෙමාපියන් සමඟ එහි විසීය. එතුමියගේ මෑණියන් අසුන්තා ගොරෙත්ති වූ අතර පියාණන් වූයේ ලූවිස් ගොරෙත්තිය. ඔහුගේ ජීවිකාව වූයේ ගොවිතැනයි. නිවසේ සියලු සාමාජිකයන් ගොවිතැනෙහි සාමාජිකත්වය දැරීය.**

දිළිඳු පවුලක් වුවද දෙවිඳුන්ගේ ආසිරි වැස්සෙන් තෙමුණු ඔවුහු සතුටින් දිවි ගෙවූහ. දරුවන් හත් දෙනා අතරින් මෙතුමිය පවුලේ තුන්වැන්නා විය. මෙතුමියගේ සදාදර මාතාව වූ අසුන්තා, දෙව් මවට මුළු හදින් ලං විය. භක්ත්‍යාදරය දැක්වීය. මරියා ගොරෙත්ති දියණිය ජපමාල මාසයේ ජන්ම ලාභය ලැබීම එම දිරිය මවගේ අමන්දානන්දයට පාදක විය. මරිය ගොරෙත්තිට වයස අවුරුදු 6 වන විට මුළු පවුල පිලියානෝ ප්‍රදේශයට පදිංචිය සඳහා ගියහ.

එම ප්‍රදේශයේ කුළියට ගත් ගොවිපොළක වසර 3 ක් පමණ අසීරු කාර්යයන් වල නිරත වන්නට ඔවුනට සිදුවිය. ඉන් අනතුරුව නැවත ඔවුන් පදිංචිය වෙනස් කළ අතර පෙරියේ නමැති ප්‍රදේශයට ගමන් ගත්හ. මෙම ප්‍රදේශය පෙරටත් වඩා අධික වශයෙන් දුෂ්කර විය. දේශගුණය පවා කටුක විය. මරියාගේ පියා අසනීප වූ අතර මව හා කැටුව එතුමිය පියාණන්ට ඇප උපස්ථාන කළාය. එනමුදු පියා ජීවිතයට සමු දුන්නේය.

පසුව මරියා, මව හා පවුලේ වගකීම් බාර ගත්තාය. බාල සොයුරු සොයුරියන් බලා ගත්තා ය. දවසින් දවස මරියා හද යෞවනයේ මල්බර හිමිදිරියට ළං වූවාය. රූප සම්පත්තියෙන් ඕ දකින සියලු දෙනාගේ සිත් සතන් ආකර්ශනය කරන්නට පවා හේතු විය. අසහාය වදන්, කතන්දර ප්‍රතික්ෂේප කරන්නට තරම් මරියාවෝ දුර්පරික්ෂා හඳුනා ගත්තෝ ය. ඕ දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ දී කළ පොරොන්දු සටහන් පොතක අඩංගු කළාය. "මියෙන්නට සිදුවුවද මා මගේ දේව ජීවිතය නසන්නේ නැත" යන්න එක් පොරොන්දුවකි. වර්ෂ 1902 ජූලි මස 05 වැනි දා අවුරුදු එකොළහමාරක් වයසැති මරියා නිවසේ හුදෙකලාව බාලයින් රැක බලා ගනිමින් සිටියදී අසල්වැසි යෞවනයකු වූ ඇලෙක්සැන්ඩ්‍රෝ පැමිණ ඇය කෙලෙසන්නට ප්‍රයත්න දැරීය. එයට එරෙහිව පොර බැදූ මරියා ගොරෙත්ති එය පාපයක් බවත් දෙවිඳුන්ට අප්‍රසන්න දෙයක් බවත් ප්‍රකාශ කළාය. එයින් දැඩි ලෙස කෝපාග්නියෙන් දැල්වුණු ඇලෙක්සැන්ඩ්‍රෝ ඇයගේ දේහයේ එකොළොස් තැනකට පිහියෙන් ඇනීය.

**අසහාය වදන්, කතන්දර ප්‍රතික්ෂේප කරන්නට තරම් මරියාවෝ දුර්පරික්ෂා හඳුනා ගත්තෝ ය. ඕ දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ දී කළ පොරොන්දු සටහන් පොතක අඩංගු කළාය. "මියෙන්නට සිදුවුවද මා මගේ දේව ජීවිතය නසන්නේ නැත" යන්න එක් පොරොන්දුවකි.**

ඇය රෝහල්ගත කෙරිණි. ඉන් පසුව තදබල ශල්‍ය කර්මයකට භාජනය කළාය. ඇයට සිහිය පැමිණි විට ඇය මුළු හදවතින් ඔහුට සමාව දෙන බවට ප්‍රකාශ කළාය. එහෙත් අවසානයේ එනම් පසුදින 1902 ජූලි මස 6 වැනි දා ඇය මහෝත්තම දෙව් පියාණන් දර්ශනය කරන්නට මෙලොව දිවියේ අවසන් නින්දට ගියාය. වසර 30 ක සිර දඬුවමකින් පසුව ඇලෙක්සැන්ඩ්‍රෝ නිදහස් වී මරියාගේ මව බැහැදැක දණින් වැටී සමාව ඉල්ලීය. මරියා සිය මරණයට පෙර ඔහුට සමාව දුන් නිසා මෑණියන් ද ඔහුට මුළු හදින් සමාව දුන්නීය.

1947 අප්‍රියෙල් මස 27 වැනි දා 12 වැනි පියුස් පාප්තුමා විසින් වතිකානයේ ශුද්ධවූ පේදුරු බැසිලිකාවේ පැවැති දේව මෙහෙයේ දී මරියා ගොරෙත්ති තුමිය භාග්‍යවරයට එසැවීය. එම දේව මෙහෙය සඳහා එතුමියගේ මව වූ අසුන්තා ද, ඇලෙක්සැන්ඩ්‍රෝ ද සහභාගි වූහ.

එවකට ඇලෙක්සැන්ඩ්‍රෝ සමූලික ජීවිත වෙනසකට පත් වී සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස තාපසාරාමයක පූජකවරයෙක් වී ද සිටියේය. සාන්තුවරයන්ගේ නාමාවලියට මරියා ගොරෙත්ති නම ද අඩංගු කළ 12 වැනි පියුස් පාප්තුමා 1950 ජුනි 24 වැනි දා සිදුකළ දේව මෙහෙයට ඇයගේ මාතාවන් ද පැමිණ සිටියාය. සිය දරුවා ශුද්ධවරයට එසැවීමේ දිව්‍ය පූජා යාගයට එන්නට වරම් ලත් එකම මව ඇය බවට ද අදහසක් තිබේ.

මෙතුමියගේ ශරීර කොටස් රෝමයේ බැසිලිකාවක තැන්පත් කර තිබේ. අතවරයට ලක් වූවන්ගේ, යෞවනියන්ගේ සාන්තුවරිය ලෙස ප්‍රකටය. එමෙන්ම පිරිසිදු බවේ, දුගී බවේ, සමාව දීමේ සාන්තුවරිය ලෙස ද සදා විරාජමානව ස්වර්ගයේ සිටී.

**✍ මලින්ත බෝපෙආරච්චි**
**දළුගම, කැලනිය**

## මිණිපුර යොවුන් කඳවුරේ දී හමුවුනු අයියා - නගෝ කතා පුවත



**සේයා - රොෂාන් කරන්නාගොඩ**

වසර 12 ක් එකිනෙකාගෙන් වෙන්ව සිටි සහෝදර දෙපළක් කුඩාගම දී එකට මුණ ගැසුණි. කුඩාගම නිර්මල ලූර්දු මාතා සිද්ධස්ථානයේ පැවති මිණිපුර තරුණ කඳවුරේ දී මෙම අපූර්ව හමුවීම සිදුවුණි.

දොළොස් වසරකට පෙර කෑගල්ල ශාන්ත මරියා දේවස්ථානය තුළ වයසින් අවුරුදු පහක් පමණ වූ පිරිමි දරුවෙක් හා වයස අවුරුදු 2 ක් වූ කුඩා දැරියක කිසිවකු විසින් දමා ගොස් තිබුණි. එවකට කෑගල්ල ශාන්ත මරියා දේවස්ථාන මීසම් පාලනාධිපති ලෙස සිටි පසුගියදා ස්වර්ගස්ථ වූ ගරු. කේ. ඩී. ජෝශප් පියතුමාණන් හට මෙම දරු දෙපළ හමුවීමේ ප්‍රතිඵලයක් ලෙස පියතුමා භාරයේ ළමා නිවාස වෙත භාර දී ඇත. මින් පුංචි දියණිය යාබද කන්‍යාරාමයට භාර දී ඇති අතර ඇගේ සොහොයුරා භාර දුන් ස්ථානයක් පිළිබඳ නිශ්චිත තොරතුරක් ලැබී නොමැත.

කාලය කෙමෙන් ගත විය. වයසින් මුහුකුරා ගිය මෙම සහෝදර දෙපලට සිය සොහොයුරා සොහොයුරිය පිළිබඳ තිබූ පුංචි මතකය අවදි වන්නට විය. ඒ අනුව සොහොයුරා සිය නැගණිය පිළිබඳ තොරතුරු සොයා ගිය ගමනේ දී ඔවුන්ගේ උපන්ගම අවිස්සාවේල්ල බව ද සිය නිවස, දෙමාපියන් පිළිබඳ තොරතුරු සොයා ගැන්මට සමත් විය. සැකහැර තොරතුරු දැනගත් නමුදු නැගණියගේ හමු නොවීම තියුණු වේදනාකාරී පැනයක් විය.

නව යොවුන් වියේ පසුවන හේ මිණිපුර තරුණ රැළියට ඉකුත් දා කුඩාගමට පැමිණුනි. ඇගේ නැගණිය ද මෙම කඳවුරට සහභාගි වී සිටින ලදි. නමුත් දෙදෙනාට දෙදෙනා පිළිබඳ මතකයන් දැන හැඳුනුම්කම් නොතිබුණු බැවින් එකිනෙකා මුණ නොගැසුණි.

කඳවුරේ ලත් විරාමයේ දී ලූර්දු මවගේ ප්‍රාතිහාර්යාත්මක ලූර්දු ගුහාව තුළ විවිධාකාර දුක් දොම්නස් වලට පිහිට අයදින අය අතරෙහි මේ දෙපළ ද ලූර්දු මව අමතමින් සිය සොයුරා සොයුරිය සොයා දෙන මෙන් අයැද සිටියහ.

අපරිමිත කරුණා ගුණයෙන් පිරිපුන් ලූර්දු මෑණියන්ගේ ප්‍රාතිහාර්යය සැනෙකින් ගලා හැලුණි. වසර 12 ක් එකිනෙකාගෙන් දුරස් වුණු සහෝදර ප්‍රේමයක් මරිමච් දෙපා මුල එකට අත්වැල් බැඳගති.

ඔහු ශිව කුමාර්ය. ඇය ශෙල්විය. ඉකුත් දා ලූර්දු මවට තුති පුදා නැවත මුණ ගැසුණු අයියණ්ඩිය සහ නැගණිය සිය ආදරණීය දෙමාපියන් හා සිය නිවහන කරා දෝර ගලනා සතුටින් නික්ම ගියහ.

**✍ ෂෙරීන් අහිංසා මධුමාල්**

## නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධන වැඩමුළුවක් උඩුගම්පල දී

බුරුල්ලපිටිය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද පියතුමාගේ යෝජනාවකට අනුව සංජීව ප්‍රභාත් මහතාගේ මෙහෙයවීමෙන් පසුගිය පොහොය දින උඩුගම්පල ශු. ප්‍රැන්සිස් අසීසි දෙව්මැඳුරු භූමියේ එම දේවස්ථාන තරුණ කැල විසින් නායකත්ව හා පෞරුෂත්ව සංවර්ධන වැඩමුළුවක් පවත්වන ලදි.



මේ සඳහා උඩුගම්පල දේවස්ථාන තරුණ පිරිසට අමතරව ආරාධිත දේවස්ථාන තරුණ තරුණියන් ලෙස බුරුල්ලපිටිය, පොල් වත්ත, නිල්පනාගොඩ දේවස්ථාන වලට අයත් තරුණ තරුණියන් ද සහභාගි වූ අතර තරුණ තරුණියන් තුළ ඒ මගින් ආධ්‍යාත්මික, මානසික හා කායික ලෙස පිබිදීමක් ඇති විය. මීට එක්වූ තරුණ පිරිස සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **(සලිනි මානවී)**

## රාජකදළුව තරුණ සමිතියෙන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක්

රාජකදළුව ශුද්ධවූ පවුලේ තරුණ සමිතිය සයවන වරටත් සංවිධානය කරන ලද පස්වන වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණය පසුගියදා රාජකදළුව ශුද්ධවූ පවුල ශ්‍රවණාගාරයේ දී පැවැත්වුණි. මීසම් සේවක ගරු චමින්ද ප්‍රසාද් පියතුමාගේ අනුශාසකත්වය යටතේ මෙම සම්මන්ත්‍රණය සංවිධානය කෙරිණි. මේ සඳහා අවට ප්‍රදේශවල පාසල් දහයක පමණ ළමෝ එකසිය පනහක් සහභාගි වූහ. එදින දරුවන්ට සංග්‍රහයක් ද පිළිගැන්විණ. ප්‍රවීන ආචාරිණී අශෝක ලීමන් මහත්මිය සම්මන්ත්‍රණය මෙහෙයවන ලදි. **(ක්‍රිස්ටෝපර් ජාන්ස)**

## ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමයට නව නිලධාරී මඬුල්ලක්

ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමය සඳහා නව නිල මඬුල්ලක් පදවි එඬේරාණන් වන අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන්ගේ මඟ පෙන්වීම මත පදවි තරුණ කටයුතු අධ්‍යක්ෂ ගරු ආනන්ද වීරකෝන් පියතුමන්ගේ මෙහෙයවීමෙන් පසුගියදා තෝරා පත්කර ගැනුණි.

සභාපති - නිමල් මදුසංඛ ( බුළුපිටිය මීසම), ලේකම් - දිනූෂා බර්නදෙත් (පන්නල මීසම), භාණ්ඩාගාරික - ශ්‍රේෂන් වර්නන් (පැල්ලන්දෙණිය මීසම), උප සභාපති - කුෂාන් චානක (පැල්ලන්දෙණිය මීසම), උප ලේකම් - මනෝජි සෙව්වන්දිකා (මණ්ඩකොන්ඩාන මීසම), ප්‍රධාන සංස්කාරක - ලක්රුවන් වර්ණකුලසූරිය (බුළුපිටිය මීසම) ජනවන්දනා පර්ෂදය - සුරාජ් රුවන්ත (මැල්සිරිපුර මීසම), මාධ්‍ය පර්ෂදය - ඉසුරු ලිවේරා (ඉරබඩගම මීසම), නාට්‍ය හා සංගීත පර්ෂදය - අංජන රුවන් (ඉරබඩගම මීසම), අධ්‍යාපන නිපුණතා පර්ෂදය - ඇන් දිලිනි (කට්ටිමහන මීසම), ක්‍රීඩා පර්ෂදය - ක්‍රිස්ටියල් නිලන්ද (කුලියාපිටිය මීසම).

**✍ ලක්රුවන් වර්ණකුලසූරිය**

## ජාතික මානව සම්පත් සංවර්ධන පදනමේ ව්‍යාපෘතියක්

**දිවයින පුරා විසිරී සිටින ස්වයං රැකියාලාභින් ඒකරාශි කිරීම හා ඔවුනගේ තොරතුරු ලියාපදිංචි කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ජාතික මානව සම්පත් සංවර්ධන පදනම කටයුතු යොදා ඇත.**

සිය ජීවිතයට අත්වැලක් සපයා ගනිමින් රටේ සංවර්ධනයට දායක වන විවිධ වූ ස්වයං රැකියා තෝරාගෙන එහි නියැලී සිටින සියලුම ස්වයං රැකියා ලාභීන් හට මෙම සංවිධානයේ ලියාපදිංචිය ලබා ගත හැකිය. රැකියා නොමැතිවුව ද තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීම උදෙසා නියැලී සිටින ස්වයං රැකියා වැඩි දියුණු කර ගැනීමට ඇති බාධක හඳුනා ගනිමින් එයට නිසි පිළියම් ලබා දීමටත් නිෂ්පාදන ද්‍රව්‍ය වෙළෙඳපලට සැපයීමේ දී පවතින ගැටලු නිරාකරණය කරදීමටත් පියවර ගැනීම මෙම සංවිධානයේ මූලික පරමාර්ථය බව එහි ලේකම් ඒ. ආර්. නවාස් මහතා පවසයි.

ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කෙරෙන මෙම ජාතික වැඩපිළිවෙල ශක්තිමත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් සංවිධාන පිහිටුවීමට කටයුතු කෙරෙන බව ද හෙතෙම වැඩිදුරටත් කීය.

මෙම සංවිධානයේ ලියාපදිංචිය අපේක්ෂිත ස්වයං රැකියාලාභි කාන්තා හා පිරිමි ඕනෑම අයෙකුට තම අයදුම්පත්‍රය

**ලේකම්, ජාතික මානව සම්පත් සංවර්ධන පදනම, ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ජාතික සම්මේලනය, අංක 52 /ඒ, දිනපතා පොළ වෙළෙඳ සංකීර්ණය, නුවර පාර, නුවරඑළිය.**

යන ලිපිනයට යොමුකළ හැකිය. දු. අංක 072 4307395 / 052-2051622 වැඩි විස්තර ලබා ගත හැකිය.

අද පටන් ඥානාර්ථ ප්‍රදීපය මාසිකව ගෙන එන නවතම විශේෂාංගය




# යුරෝපයේ ණය අර්බුදයෙන් බැටකන අපේ ආර්ථිකය

ජූලි අවසානය වනවිට යුරෝපා සංගමයේ රටවල උද්ධමනය අනවරතව ම තුන්වන මාසයටත් ඉහළ යමින් පැවැතිණි. වාර්ෂික පදනමින් සංසන්දනය කරන විට පසුගිය ජූලි මාසයේ එහි සාමාජික රටවල් 17 ම පාරිභෝගික ද්‍රව්‍යවල මිල ගණන් 2.4% කින් ඉහළ ගිය බව යුරෝපා සංගමයේ සංඛ්‍යාලේඛන විශ්ලේෂක 'යුරෝස්ටැට්' ආයතනය පසුගිය දා ප්‍රකාශයට පත් කළ වාර්තාවක සඳහන් වෙයි. ඒ, මේ කාලය තුළ බ්‍රෙන්ට් නොනිමි ඉන්ධන මිල පහළ ගොස් තිබියදීත් ය.

යුරෝපා සංගමයේ රටවල ආර්ථික අර්බුදය සාමාන්‍ය පාරිභෝගික ජනතාව බලවත් සේ පීඩාවට පත් කරන්නට හා රැකියා අහිමි වීමේ අවදානමකට යොමු කරන්නට හේතු කරක වී ඇති බව ප්‍රකට කරුණකි.

මාධ්‍ය වාර්තා කරන පරිදි යුරෝපයේ විරැකියා අනුපාතය 11.2% තරම් ඉහළ මට්ටමක පවතින අතර ප්‍රමාණාත්මක ව මෙය මිලියන 18 ක් පමණ වෙයි. පසුගිය මාස 14 ක් තිස්සේ එම සංඛ්‍යා දිගට ම ඉහළ නැංගේ ය. යුරෝපා සංගමයේ සාමාජිකයන් අතරින් 9 කම විරැකියා අනුපාතය ද්විඅංක සංඛ්‍යාවක් බවට පත්වී තිබෙනු දැකිය හැකිය. ජර්මනියේ පවා පසුගිය මාස හතරේ ම විරැකියා අනුපාතය ඉහළ යමින් පැවැති ඇති අතර ජූලි අවසානය වන විට එය 6.8% මට්ටමක පැවැතිණි. ඉහළම ප්‍රතිශතය වාර්තා වනුයේ ස්පාඤ්ඤයෙනි. ඒ 24.8% කි. 22.5% වන ග්‍රීසිය දෙවැනි තැනට පත් වෙයි. කෙසේවෙතත් මේ රටවල තරුණ විරැකියාව 50% ඉක්මවන බව පැවසේ.

ග්‍රීක සහ ස්පාඤ්ඤ මිනිසුන් රැකියා විරහිත භාවය නිසා වියරු වැටී සිටින හෙයින් දැන් ප්‍රතිපත්ති සම්පාදකයන්ට ඇහැකන පියාගෙන සිටිය නොහැකි බවත් වහා ඊට පිළියම් යෙදිය යුතු බවත් විචාරකයෝ පෙන්වා දෙති. නැතහොත් ලේ ගැලීම් සිදු විය හැකිය.

ජර්මනියේ සේවා යෝජකයෝ මේ දිනවල අලුත් සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් වැළැකී සිටිතියි පැවසේ. කම්හල්වල වැඩ පැය ගණන සීමා කොට ඇති අතර ඒ අනුව සේවකයන්ට ලැබෙන වැඩ ප්‍රමාණයත් ඊට සාපේක්ෂ වශයෙන් දීමනාත් අඩු වන්නට පටන් ගෙන තිබේ. පසුගිය ජූනි මාසයේ පැවැති හමුවක දී මීට අදාළව ඵලදායී පියවර ගන්නා ලෙස ඉතාලි, ප්‍රංශ සහ ස්පාඤ්ඤ නායකයෝ ජර්මානු බලධාරීන්ගෙන් ඉල්ලා සිටියෝ ය. ජර්මානු විපක්ෂයේ අදහස වනුයේ යුරෝපා මහ බැංකුවේ මැදිහත් වීම මෙයට වඩා බලවත් විය යුතු බවය.

යුරෝපා මහ බැංකුව අපේක්ෂා කළේ (තෙල් මිල ඉහළ යමින් පැවැතියත්) වර්ෂාවසානය වනවිට උද්ධමන අනුපාතය 2.0% අඩු මට්ටමක පවත්වාගෙන යන්නටය. එනමුත් එය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිතැයි එහි ප්‍රධානී මාරියෝ ඩ්රාගී මීට සති කිහිපයකට පෙර මාධ්‍යයට පවසා තිබිණි.

මේ සැම ව්‍යාධියක ම නිධානය වනුයේ යුරෝපාකරයේ රාජ්‍ය ණය අර්බුදයයි. (European Sovereign Debt Crisis) ග්‍රීසිය, ස්පාඤ්ඤය, පෘතුගාලය සහ සයිප්‍රසය යන රටවල ඉහවහා ගොස් ඇති රාජ්‍ය ණය නිසා ඒවාට බාහිර ආධාර නොමැතිව සිය රටවල මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගෙන යෑම අසීරු බව ප්‍රකට ය. ඉතාලිය, බෙල්ජියම, ස්විට්සර්ලන්තය, එක්සත් රාජධානිය මතු නොව ස්ථාවර ආර්ථික ඇතැයි සාමාන්‍ය පිළිගැනීමක් ඇති ප්‍රංශය සහ ජර්මනිය ද අනතුරට මුහුණ පා සිටිතැයි වාර්තා වෙයි. මෙයට පොදු හේතුවක් පෙන්වා දිය නොහැකි ය. හේතු ඒ ඒ රටවලට පෞද්ගලික වෙයි.

ඉහතින් සඳහන් කැරුණු බාහිර ආධාරයක් යනු අවම පොලියක් සහිත ණයකි. එලෙස ණය දීමට 'ඇපවීම' (bailout) ය' යි කියනු ලැබේ. බේලවුට් ක්‍රමයේ ආධාර සැපයීම් ගැන ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙන්ම අමෙරිකා එක්සත් ජනපදය ද කරුණු අධ්‍යයනය කරමින්, සාකච්ඡා පවත්වමින් සිටිනු දැන් සුලබ පුවතකි. පසුගිය 31 දා ජර්මනියේ ධනකුවේරයන්ගේ සංචාරක නිකේතනයක් වන සිල්ට් දූපතේ දී එක්සත් ජනපදයේ භාණ්ඩාගාර ලේකම් තිමොති ගෙයිට්නර් සහ ජර්මන් මුදල් අමාත්‍ය වුල්ෆ්‍රෑං ෂෝබල් අතර සාකච්ඡාවක් පැවැත්විණි. ඉන් අනතුරුව ඔවුන් දෙදෙනා විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනයක දැක්වෙන්නේ මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නට නම් ලොවම සාමූහික ව කටයුතු කළ යුතු බවයි. එහෙත් එසේ සාමූහිකව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව එහි කිසිදු අදහසක් ඉදිරිපත් කොට නොමැත.

රටරටවල වෙළෙඳ අසමතුලිතබව ආර්ථික අවපාතයට බලපාන තවත් එක් මූලික හේතුවක් ලෙස හඳුනා ගැනේ. මේ නිසා කම්හල් වසා දමන්නට සිදු විය. මෙය යුරෝපාකරයේ මතු නොව අමෙරිකා එක්සත් ජනපදයේ ද තත්ත්වයයි. එහි ප්‍රතිඵලයක් ලෙස රැකියා අහිමි වූ අතර කාය ශක්තිය හීන විය. උද්ධමනය ඉහළ යාම යනු මිලදී ගන්නා භාණ්ඩවලට වැඩි මිලක් ගෙවන්නට සිදු වීමයි. මේ කරුනු දෙක සාමාන්‍ය ජනතාව පීඩාවට පත් කරන බව වටහා ගන්නට අමුතු ආර්ථික විද්‍යා දැනුමක් අවශ්‍ය නොවේ.

2008 පමණ සිට යුරෝපා ආර්ථිකයේ 'බුබුළු දැමීම්' සිදු වි ය. ආර්ථික බුබුළු දැමීමක් යනු ආරක්ෂන බැඳුම්කර නිසග අගය පදනම් කැර ගනිමින් ඉදිරියේ විය හැකි උද්ධමනයන්ට අනුරූපි ලෙසින් මිල පුම්බා දැක්වීමයි. මේ බුබුළු පුපුරා යාමෙන් ආර්ථිකයකට හානි සිදුවිය හැකි ය. දේපල ඉඩකඩම්වල වටිනාකම් පසුගිය සමයේ මෙලෙස එක්වර ඉහළ ගිය අතර එහි ප්‍රතිඵලය ආර්ථිකයට දැනුණු බව ඇතැම් ආර්ථික විශේෂඥයකුගේ මතයයි. 1990 ජපානයේ මුලින් ම මෙය දැක ගත හැකි වූ අතර 2007 න් පසු ලොව පුරාම පැතිරිණි.

යුරෝපයේ සහ අමෙරිකා එක්සත් ජනපදයේ ජනතාවගේ ක්‍රය ශක්තිය හීන වීම මුළු ලොවට ම බලපායි. උදාහරණයක් ලෙස සංචාරක කර්මාන්තයෙන් ඉහළ ආදායම් බලාපොරොත්තු වන ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ 'සංචාරක ස්වර්ග' වලට එහි බලපෑම දරුණු ලෙසින් දැනෙනවා නිසැකය.


මෙහි දී යුරෝපා මහ බැංකුවට මෙන්ම එහි ප්‍රධානී මාරියෝ ඩ්රාගීට ද පොදුවේ චෝදනා එල්ල වෙයි. මහ බැංකුව දත්ත හා සංඛ්‍යාලේඛන ද බරපතළ ආර්ථික න්‍යාය ද ගෙනහැර පාමින් පවත්නා තත්ත්වයේ විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කරයි. ඒවා හරිද වැරදි ද කියා සාමාන්‍ය ජනයා දන්නේ නැත. එහෙත් ඔවුන්ගේ සර්වශුභ අනාවැකි නම් කිසි දා යථාවත් වනු නොපෙනේ. මේ රටවල ආර්ථික කටයුතු පාලනය වන්නේ මූලික වශයෙන් ම පෞද්ගලික ව්‍යාපාරිකයන් අතින් නිසා ඔවුන් නියාමනය කිරීමේ කිසියම් ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීමේ වගකීම යුරෝපා මහ බැංකුවට ඇතැයි පැවසේ.

17 වන සියවසේ විසූ දාර්ශනිකයකු වූ තෝමස් බ්‍රව්න් වරෙක පැවසූ පරිදි සමාජයේ යහපැවැත්මට එරෙහි වන ප්‍රධානතම සතුරා වනු ඇත්තේ වික්ෂිප්තයට පත් වූ මහජනතාවයි. වික්ෂිප්තයට පත් මහජනයා මෘග වෙස් ගනු ඇතැ'යි ඔහු වැඩිදුරටත් පෙන්වා දී තිබේ.

> ජර්මනියේ සේවා යෝජකයෝ මේ දිනවල අලුත් සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් වැළැකී සිටිතියි පැවසේ. කම්හල්වල වැඩ පැය ගණන සීමා කොට ඇති අතර ඒ අනුව සේවකයන්ට ලැබෙන වැඩ ප්‍රමාණයත් ඊට සාපේක්ෂ වශයෙන් දීමනාත් අඩු වන්නට පටන් ගෙන තිබේ. පසුගිය ජූනි මාසයේ පැවැති හමුවක දී මීට අදාළව ඵලදායී පියවර ගන්නා ලෙස ඉතාලි, ප්‍රංශ සහ ස්පාඤ්ඤ නායකයෝ ජර්මානු බලධාරීන්ගෙන් ඉල්ලා සිටියෝ ය. ජර්මානු විපක්ෂයේ අදහස වනුයේ යුරෝපා මහ බැංකුවේ මැදිහත් වීම මෙයට වඩා බලවත් විය යුතු බවය.
>
> යුරෝපා මහ බැංකුව අපේක්ෂා කළේ (තෙල් මිල ඉහළ යමින් පැවැතියත්) වර්ෂාවසානය වනවිට උද්ධමන අනුපාතය 2.0% අඩු මට්ටමක පවත්වාගෙන යන්නටය. එනමුත් එය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතිතැයි එහි ප්‍රධානී මාරියෝ ඩ්රාගී මීට සති කිහිපයකට පෙර මාධ්‍යයට පවසා තිබිණි.

**එස්. නන්දලාල්**

## මාසික ආර්ථික විමසුම



ඉදිරිපත් කිරීම
ප්‍රවීන ආර්ථික විශ්ලේෂක
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

ශුද්ධ බයිබලයේ උත්පත්ති කථාවේ දැක්වෙන ආකාරයට 'ආදම් සහ ඒව' යන දෙදෙනාගෙන් ලෝකයේ මිනිස් ජීවිතයේ උපත ආරම්භ විය. ඒ අනුව ලෝක ජනගහනය එවිට දෙදෙනෙකි. එම කථාවේම දැක්වෙන හැටියට 'තහනම් ගහේ ගෙඩි කෑමේ' ප්‍රතිඵලයක් වශයෙන් ලොව ජනගහනය එතැන් පටන් වැඩිවෙන්නට විය. ඒ අනුව අද වන විට ලෝකයේ මිනිස් සංඛ්‍යාව 2012 ලෝක සංවර්ධන වාර්තාවට අනුව බිලියන 7 කි (මිලියන 7000 කි) මෙයින් මිලියන 1591 ක් වෙසෙන්නේ ශ්‍රී ලංකාව ද ඇතුළත් වන දකුණු ආසියාවේය. ශ්‍රී ලංකාවේ ජනගහනය පමණක් 2012 අලුත්ම සංගණනයට අනුව මිලියන 20.2 කි. ලෝකයේ වැඩිම ජනතාවක් වෙසෙන රටවල දෙකෙන් එකක් වන ඉන්දියාව (මිලියන 1121 ක්) අයත් වනුයේ මේ කලාපයටය.

එහෙත් ලෝකයේ වැඩි ම ජනතාවක් වෙසෙන්නේ චීනයේය. එම සංඛ්‍යාව මිලියන 1338 කි. අප්‍රිකානු කලාපයේ වෙසෙන ජන සංඛ්‍යාව මිලියන 882 ක් වන අතර, මැදපෙරදිග මිලියන 337 ක් වාසය කරති. ලතින් ඇමරිකානු කලාපයේ මිලියන 578 ක් වාසය කරන අතර යුරෝපයේ මිලියන 408 ක් වෙසෙයි. චීනය හැර නැගෙනහිර ආසියාව හා පැසිපික් කලාපයේ වෙසෙන ජනගහනය මිලියන 620 කි.

මෙම ගණන් හිලව් අනුව එදා දෙදෙනකුගෙන් ඇරැඹි මේ ලෝක තලයේ ජනයා විවිධ කලාපවලට බෙදී, විවිධ භාෂා කථාකරමින්, විවිධ සංස්කෘතින් අනුගමනය කරමින්, විවිධ ආගම් අදහමින් ජීවත් වෙති. ඇතැම් අයගේ ආදායම් ඉහළය. ඇතැම් අයගේ ආදායම් පහළය. ඇතැම් අය මධ්‍යස්ථ ආදායම් ලබයි. මේ ආදායම් ලැබීම අනුව ලෝකයේ රටවල් කාණ්ඩ තුනකට බෙදා දක්වයි.

### (1) අඩුම (පහළම) ආදායම් ලබන රටවල්

වර්ෂයකට ඒක පුද්ගල ආදායම (රටේ මුළු ආදායම ÷ මධ්‍ය වාර්ෂික ජනගහනය) ඩොලර් 1005 කට අඩුනම් එම රටවල් දිළිඳු රටවල්ය. ලෝක ජනතාවගේ මිලියන 817 ක් දිළිඳු ජනතාව අතරට ගැනේ. ශ්‍රී ලංකාව 1948 සිට 1994 දක්වා පසුවූයේ මෙම තත්ත්වයේය. 1948 ඩොලර් 121 ක් වූ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දෙනවිට වසර 30 ක කාලයක් තුළ වැඩිවූයේ ඩොලර් 171 දක්වා ඩොලර් 50 කින් පමණි. එහෙත් 1978 විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමඟ ජනයාගේ ආදායම් මට්ටම් විශාල වශයෙන් වැඩි විය. ඒ අනුව අද වන විට ශ්‍රී ලාංකිකයකුගේ ආදායම ඩොලර් 2836 ක් දක්වා ඉහළ ගොස් තිබේ. එහෙත් ඒ තරමට ජනයාගේ මිනිස්කම, සහෝදර ප්‍රේමය, කරුණාව, වැයවීමක් පෙනෙන්නට නැත. ඒ වෙනුවට අමනුෂ්‍යකම්. නොපනත්කම්, බාලාපචාර, බාල වැඩ වැඩි වීමට පටන්ගෙන තිබේ. ඒ අනුව දියුණුව තියන්නේ ආදායම් වැඩි වීම පමණක්ම නොවන බව සඳහන් කළ යුතුය.

### (2) මධ්‍යම ආදායම් ලබන රටවල්

ලෝක මධ්‍යම ආදායම් ලබන රටවල් ලෙස සලකනු ලබන්නේ ඩොලර් 1006-12,275 අතර ආදායම් ලබන රටවල්ය. එම රටවල් තවත් කාණ්ඩ දෙකකට බෙදා දක්වයි.

(i) ඩොලර් 1006-3,975 අතර අඩු මැදි ආදායම් ලබන රටවල්

මෙම රටවල ජීවත්වන ජනයා මිලියන 2467 ක් සිටි. ශ්‍රී ලංකාව දැන් අයත් වනුයේ මේ කාණ්ඩයටය.

(ii) ඩොලර් 3976 සිට 12,275 දක්වා රටවල්

මෙම කාණ්ඩයෙහි පසුවන ලෝක ජනගහනය මිලියන 2449 කි. මේ රටවල ජනයා 1997 දි උග්‍ර ආර්ථික අර්බුදයකට ලක්විය. එය 'නැගෙනහිර ආසියාවේ අර්බුදය' ලෙස ප්‍රචලිත විය.

(iii) ඩොලර් 12276 ට වඩා ආදායම් ලබන ලෝකයේ පොහොසත්ම රටවල්

මේ කාණ්ඩයේ වෙසෙන ජනයා මිලියන 1123 කි. එහෙත් එම ජනයාද 2008 දී හා 2011 දී බරපතළ ආර්ථික අර්බුදවලට මුහුණ පා සිටි.

ආදම් සහ ඒවගෙන් පටන්ගත් ලෝක ජනගහනය අද වන විට බිලියන 7 ක් වීම සහ ඒ ජනයා විවිධ කලාපවල ජීවත්වන ප්‍රමාණයත්, ලබන ආදායම් ප්‍රමානයත් අද ආර්ථික විග්‍රහයෙන් විග්‍රහ කෙරිණි. මෙම ජනයා පිළිබඳ තවත් රසවත් තොරතුරු රැසක් ඊළඟ ආර්ථික විග්‍රහයෙන් බලාපොරොත්තු වන්න.

දැල්වෙන පහන්

**හෙළ කිතු සසුන් කෙතේ පූජකවරය ලද ගරු පියතුමන් පස් නමක් සිය පූජක දිවි මගේ ස්වර්ණ ජයන්තිය සැමරීමේ විරල අවස්ථාවක් උදාවේ. කොළඹ අගරදගුරු වසමේ ගරු බර්ට්‍රම් දබරේරා, ජෝශප් බෙනඩික් ප්‍රනාන්දු, සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමන්ද, හලාවත රදගුරු වසමේ ගරු ජෝ පෝල් ප්‍රනාන්දු හා මයිකල් ලුසේනා පියතුමන්ද මේ සුවිශේෂි අවස්ථාව සැමැරීමට සූදානම්ව සිටී.**

# සමිඳු කෙතේ රන් අස්වනු නෙළන පූජක පුතුන් පස් නමක්


ගරු බර්ට්‍රම් දබරේරා පියනම


ගරු ජෝශප් බෙනඩික්ට් ප්‍රනාන්දු පියනම


ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියනම


ගරු ජෝ පෝල් ප්‍රනාන්දු පියනම


ගරු හේවාවීරගේ ජෝශප් සිරිල් මයිකල් ලුසේනා පියනම

## ගරු බර්ට්‍රම් දබරේරා පියනම

1962 වසරේදි පූජක වරම් ලද මේ පියවරුන් අතරින් පළමුවැන්නා වන ගරු බර්ට්‍රම් දබරේරා පියතුමාගේ උපන්ගම බෝලවත්තයි. කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ පදවියට පත්ව එහි ප්‍රතිසංවිධාන කටයුතු වලට උරදුන් එතුමා නව සමතල මුද්‍රණ රටාව (ඕප්සෙට්) එහි හඳුනා දීමේ පුරෝග ාමියාද විය. 1978 වසරේදි බොරැල්ලේ සියලු සාන්තුවර දෙව් මැඳුරේ මීසම් සේවක හැටියටත්, 1982 වසරේදී කොළඹ අගරදගුරු පදවි භාණ්ඩාගාරික නිලයටක් පත් කෙරුණු එතුමා තම නියමිත සේවා කාලය නිම කොට සමුගෙන කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ පියනම ලෙස පූර්ණ කාලීනව සේවය කළේය. පූජක මඬුල්ලේ ද සාමාජිකයකුව සිටි මෙතුමා සිය සේවා කාලය තුළ මීගමු මහා වීදියේ හා බොරැල්ලේ සහාය මීසම් සේවක වශයෙන්ද, පල්ලන්සේනේ මීසම් සේවක වශයෙන්ද කටයුතු කරන. එතුමා සිය මුලික අධ්‍යාපනය ලැබුවේ වෙන්නප්පුව ජෝශප් වාස්, කෝට්ටේ සා. තෝමස් හා ගාල්ලේ සා ඇලෝසියස් යන විදුහල් වලිනි. දැන් විශ්‍රමිකව කල්ගෙවයි.

## ගරු ජෝශප් බෙනඩික්ට් ප්‍රනාන්දු පියනම

මොරටුවේ උපත ලද ගරු ජෝශප් බෙනඩික්ට් ප්‍රනාන්දු පියනම තම මුලික අධ්‍යාපනය ලැබුවේ කලුතර සිරි කුරුස විදුහලෙන් හා කොළඹ සා. ජෝශප් විදුහලෙනි. 1955 වසරේදි දෙව්සත්හලට පිවිසි එතුමා පූජකවරය ලැබ ඉන් පිටව ගියේ 1963 දීය. එම වසරේ අප්‍රේල් මස බොරැල්ලේ සා. ඇලෝසියස් දෙව්සත්හෙල් කාර්ය මණ්ඩලයට සම්බන්ධ වූ ගරු ජෝශප් බෙනඩික්ට් පියනම ඉන් අනතුරුව 1972 දී කොළඹ සා. පීතර විදුහලේ සහයක පියනම වශයෙන් පත්විය. 1976 සිට එතුමා කොළඹ සා. ජෝශප් විදුහලේ සහය අධිපති පියනම ලෙස කටයුතු කළේය. විවිධ තනතුරු ඉසිලු එතුමා දැන් බොරැල්ල කනිටු දෙව්සත්හලේ සේවය කරයි.

## ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියනම

ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියනමගේ උපන් ග්‍රාමය මීගමු මුන්නක්කරයයි. මුන්නක්කරය දෙමළ විදුහලින් හා මීගමු සා. මරියා විදුහලින් ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ එතුමා ප්‍රථමයෙන්ම පත් කෙරුණේ කොටහේනේ සා. ලුසියා ආසන දෙව්මැඳුරේ සහායක පියනම වශයෙනි. ඉන් අනතුරුව වැල්ලපල්ලිය, කොම්පඤ්ඤවීදිය, මතුගම යන මීසම් වලින් සේවය කරන. මීට අමතරව දෙමටගොඩ වැඩ බලන මීසම් සේවක වශයෙන්ද කටයුතු කළේය. වැඩිදුර අධ්‍යාපනය සඳහා එතුමා 1976 දී හා 1986 දී රෝමයට ගියේය. මෙරට කිතුනු උරුමය පිළිබඳව ඇඩි උනන්දුවක් දක්වන කුරුකුලසූරිය පියනම එහිදි පුරාවිද්‍යාව පිළිබඳව පාඨමාලාවක් හැදෑරිය. අගරදගුරු පදවි ලේඛනාරක්ෂක ලෙස එතුමා සේවය කරයි.

## ගරු ජෝ පෝල් ප්‍රනාන්දු පියනම

ගරු ජෝ පෝල් ප්‍රනාන්දු පියතුමා වෙන්නප්පුව ශුද්ධවු ජුසේ මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී අති උතුම් එඩ්මන් පීරිස් රදගුරු හිමිපාණන් අතින් 1962 සැප්තැම්බර් 01 දින පූජකවරය ලැබීය. 1937 මාර්තු 22 දා කටුනේරිය ග්‍රාමයේ උපත ලබා වෙන්නප්පුව ජෝශප් වාස් විදුහලේ ප්‍රාථමික අධ්‍යාපනය හදාරා, පසුව මාරවිල සාන්ත පාවුළු දෙව්සත්හලේ වසර කිහිපයක් අධ්‍යාපනය හා පුහුණුව ලබා අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලු විය.

හලාවත පදවි පූජකවරයකු ලෙස එතුමා බෝලවත්ත මාවතගම පුත්තලම නාලවලාන මීසම් සේවක ලෙස සේවය කොට 1976 මැද භාගයේ දී ඇමරිකාවේ ලොස් ඇන්ජලීස් අගරදගුරු පදවියේ සේවය කිරීමට තම දේශයෙන් පිටත් විය. එහිදී මීසම් කිහිපයක හා ආරෝග්‍ය ශාලාවල රෝගීන්ගේ අධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමේ සේවයෙහි නිරත වූයේය. 2002 වසරේ දී ඇමරිකාවේ නිව්යෝර්ක් ප්‍රදේශයේ මීසමක රැඳි එහි අවට ආරෝග්‍යශාලාවල් කිහිපයක රෝගීන්ගේ අධ්‍යාත්මය ගොඩනැගීමට තම සේවය කැපකළ ගරු ජෝ පෝල් පියතුමා තම විශ්‍රාම කාලය ගත කිරීමට නැවත මව්බිමට පැමිණියේය.

## ගරු ජෝශප් සිරිල් මයිකල් ලුසේනා පියනම

තඹරවිල ග්‍රාමයේ එච්. ඇන්ටනි ලුසේනා හා බී. ජේන් පෙරේරා යුවළගේ බාල පුතු ලෙස 1936 පෙබරවාරි 09 වන දින උපත ලැබූ ගරු හේවාවීරගේ ජෝශප් සිරිල් මයිකල් ලුසේනා පියතුමා තඹරවිල රජයේ විදුහල, මීගමුවෙ මාරිස්ටෙලා විදුහල් වලින් අධ්‍යාපනය ලබා 1949 මාරවිල කනිටු දෙව්සත්හලට ඇතුලුවිය. 1962 සැප්. 01 දින ගරු ජෝ පෝල්, පීටර් සුවාරිස් හා ප්‍රැන්සිස් තිසේරා පියතුමා සමඟ වෙන්නප්පුව ශු. ජුසේ මුනි දෙව්මැඳුරේදි අතිඋතුම් එඩ්මන් පීරිස් රදගුරු හිමිපාණන් අතින් පූජකවරය ලැබීය. හලාවත ආසන දෙව්මැඳුරේ වසර 3 ක් සහයක ලෙස සේවය කිරීමෙන් අනතුරුව ඉරබඩගම, බණ්ඩාරවත්ත, කට්ටිමහන, කටුනේරිය මීසම් සේවක ලෙස කටයුතු කළේය. සභා නීතිය හැදෑරීම සඳහා 1982 සිට වසර 2 ක් රෝමයේ ගත කළ එතුමා මව්බිමට පැමිණ කුලියාපිටිය මාදම්පේ මීසම් සේවක ලෙස සේවය කළේය. ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා විදෙස්ගත වූ ගරු පියතුමා වසර 2 ක කාලයක් ඇමරිකාවේ ගත කර ආචාර්ය උපාධිය ලබා මව්බිමට පැමිණ හලාවත පදවි විවාහ අධිකරණ පියතුමා ලෙස වසර 15 ක් සේවය කළේය. පසුව බොරලැස්ස මීසම් සේවක විය. මේ වන විට ලංසිගම විශ්‍රාම සුවයෙන් පසුවේ.

පසුගිය සතියේ 3 වැනි පිටුවේ පළවූ ලිපියේ ඉතිරිය...

# ගෘහස්ථ හිංසනයෙන් වළකින්න

මෙහිදී අප සමාජය තුළ පවත්නා නොයෙකුත් සාවද්‍ය හෙවත් වැරදි සහගත මති මතාන්තර දෙස අපි අවධානයෙන් බැලිය යුතු වෙමු. සමහර පුරුෂයින් තමන්ගේ භාර්යාවට පහර දීමට 'තඩිබෑමට' තමාට අයිතියක් ඇතැයි සිතති. එවන් අය අප අතර විරල නොවෙති. ඇය තමාගේ භාර්යාව නිසා ඇයට පහර දිය හැකි බවත්, ඇය ඒවා විඳ දරා ගත යුතු යැයි සිතන පුරුෂයෝ ද අප අතර එමට සිටිති. මෙය සම්පූර්ණයෙන්ම වැරදි සහගතය කුමන ආගමක් ඇදහුවද එවැනි අයිතියක් අප ස්වාමිපුරුෂයනට පවරා දී නැති බව සහතිකය. අප සමාජයේ පවතින පුරුෂාධිපත්‍යය ද මෙම හැසිරීම් වලට බලපාන බව පැහැදිලිය. තමන්ට පෙරලා පහර දෙමින් (එසේ ගුටි හුවමාරු කර ගැනීම යුක්ති සහගත හා සාධාරණ නොවුවත්) තම ආත්මාරක්ෂාව සලසා ගත නොහැකි අසරණ, කායික ලෙස තමන්ට වඩා දුර්වල කෙනෙකුට පහර දීම එක්තරා නිවටකමකි. තමන්ගේ පුරුෂ ශක්තිය විදහා දැක්වීමට මෙන් එසේ පහර දීම වැරදිය. එය අනෙක් පුද්ගලයා කෙළෙසීමකි. එවැනි පහරදීම් වලින් විවාහ ජීවිතයේ ගැටුම් නිරාකරණයක් කොහෙත්ම සිදු නොවේ.

විවාහ ජීවිතයේ ආරම්භයේදීම දෙවිඳුන් හා කිතුනු සංඝය ඉදිරියේ ප්‍රකාශ කරන පොරොන්දු වෙත මොහොතකට අවධානය යොමු කරමු. "………වන මම …… වන ඔබ මාගේ ස්වාමි පුරුෂයා/ භාර්යාව ලෙස භාර ගනිමි. වාසනාවත් කල්හිද, අවාසනාවත් කල්හිද ලෙඩ දුකේදී හා සුව සැපේදී ද ඔබට විශ්වාසවන්ත වන්නට මම පොරොන්දු වෙමි. මාගේ මුළු ජීවිත කාලය තුළදීම මම ඔබට ප්‍රේම කරමි, මම ඔබට ගෞරව කරමි."

### යහපත් ආදර්ශයෙන් පන්නරය ලබමු

දෙවිඳුන් ඉදිරියේ තමන් ප්‍රකාශ කළ මෙම පොරොන්දු වලට, ජීවිතයේ නොයෙකුත් ගැහැට දුක් අමාරුකම්, ආර්ථික හා වෙනත් විවිධ තාඩන පීඩන මැද වුවද ඉතාමත් ගෞරවාන්විත ලෙස විශ්වාසවන්තවූ, අප සමාජයේ අනේක විධ ස්වාමි පුරුෂයන් සහ භාර්යාවන්, අප මව්වරුන් හා පියවරුන් ඉතාමත් බැතිබර ලෙස හා ගෞරවයෙන් අපි සිහි කරමු. ඔවුන් තම පවුල් ජීවිතය හා දූ දරුවන් වෙනුවෙන් විඳ දරාගත් දුක් ගැහැට වෙනුවෙන් ද ආරක්ෂා කරගත් විශ්වාසනීයත්වය වෙනුවෙන් ද ස්තූතිවන්ත වෙමු, එයින් පන්නරය ලබමු.

ඔවුන් ජීවිත අර්බුද වලට මුහුණ දුන් ආකාරයෙන් පාඩම් උගෙන, ක්‍රිස්තියානි වගකීම් හා වටිනාකම් සිත්හි දරාගෙන ජීවත්වන්නට අප විවාහක ස්වාමිපුරුෂයනට හා භාර්යාවනට ආරාධනා කරමු. විවාහ ජීවිතයේ අර්බුද තෝරා බේරා ගැනීමට හිංසාකාරී වීමෙන් වළකින්නට තවදුරටත් එසේ නොකරන්නට අධිෂ්ඨාන කර ගන්න. මෙහිදී බේබදුකමද අමතක කළ නොහැකි ගැටලුවකි. ගෘහස්ථ හිංසනයට බොහෝ දුරට බලපාන සාධකයකි ඒ. මත්පැනට ඇබ්බැහිව එයින් තමන්ගේ ශක්තියෙන් පමණක් ගොඩ ඒමට උත්සහ කිරීම සාර්ථක නොවන උත්සාහයකි. මූලිකවම අපට අවශ්‍ය දේවාධාරය හා සංරක්ෂණය වෙත අපි බැහැපත්කමින් හැරී යා යුතු වෙමු. ඇබ්බැහිවීම (ාසපජඑසදබ) වෛද්‍ය මත අනුව රෝගයක් ලෙස සැලකෙන හෙයින් ඒ සඳහා අවශ්‍ය ඖෂධ ගෙන අමද්‍යප නැතිනම් පුනරුත්ථාපනය (රුය්ඉසකසඑ්එසදබ) සඳහා වූ වැඩපිළිවෙළක් වෙත යොමු විය යුතු වේ. එසේ කිරීමෙන් පළමුව දේවාධාරයෙන්ද ඊළඟට තම පවුලේ භාර්යාව හා දරුවන්ගේද සහයෝග යෙන් නැවත තම පවුල් ජිවිත සාර්ථක හා සාමකාමී කරගත් අයද අප අතර සිටිති. එවන් සහනයක් හා ආධාර ලබා දෙන ස්ථාන කිහිපයක්ම ශ්‍රී ලංකාව තුළ, කතෝලික සභාව මගින් ද පවත්වා ගෙන යන හෙයින් තම මීසම් භාර පියතුමන්ලා මගින් එවන් ස්ථාන කරා යොමු වීම කළ හැකිය.

### අතිශයින් පීඩාවට පත්වන අසරණ දරුවන්

ගෘහස්ථ හිංසනය යන ප්‍රශ්නය ඉදිරියේ කිසිසේත් අමතක කළ නොහැකි තවත් වැදගත් පිරිසක් සිටිති. එනම් අප දූ දරුවන්ය. තම දෙමාපියන්ගේ හිංසාකාරී හැසිරීම් ඉදිරියේ ඉතාමත් අසරණ තත්ත්වයට පත් වන්නේ ඔවුන්ය. තමන්ට කිසිත් කර කියාගත නොහැකිව ත්‍රස්තවන, බිරාන්තවන අපගේ දරුවන්ය. විශේෂයෙන් තම ආදරණීය මෑණියන් පහර කෑමට ලක්වෙන අයුරු දැක අප දරුවන් ඉතාමත් කණගාටුවට පත්වෙති. ඔවුන් ඉතාමත්ම අසරණව ගේ දොර අහුමුළුවල සැඟවෙති, හඬා වැළපෙති. දරුවන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍යයට හා වර්ධනයට මෙම තත්ත්වයන් ඉතාමත් අහිතකර ලෙස බලපාන බව අප කාහටත් තේරුම් ගත හැකිය. විවාහ ජීවිතය තුළ දෙවිඳුන්ගේ උතුම්ම සම්පත වන අප දරුවන්ගේ අභිවෘද්ධිය පතා එම වර්ධනය ඇණහිටවීමට පවා කාරණා විය හැකි හිංසාකාරී හැසිරීම්වලින් මව සහ පියා වැළකී සිටින්නට දරුවන්ගේ නාමයෙන් අධිෂ්ඨාන කර ගන්න. විවාහක ජීවිතය තුළ තමන්ගේත්, දරුවන්ගේත් අභිවෘද්ධිය සඳහා සාමකාමී වාතාවරණයක් ගෙදර නිර්මානය කර ගැනීම දෙමාපිය දෙදෙනාගේද, වැඩිහිටි දරුවන් ඇත්නම් ඔවුන්ගේ ද වගකීමකි. විශේෂයෙන් බාල දරුවන් සඳහා හිංසාවෙන් තොර පරිසරයක් ඇති කර ගැනීමට දෙමාපිය දෙදෙනාම උත්සහ ගත යුතුවේ. එය ඔබගේ බලවත් වගකීමකි. විවාහ වූ දවසේ කළ පොරොන්දු සිත්හි දරාගෙන දේව සමානකමට සහ ස්වරූපයට මවා ඇති තම භාර්යාවට, තම ස්වාමිපුරුෂයාට ප්‍රේම කරන්න, ගෞරව කරන්න, දේව ආධාරයෙන් අධිෂ්ඨාන කරගන්න. හිංසාකාරී ලෙස තම අත පය භාවිත කරමින් ප්‍රශ්න විසඳා ගත නොහැකි බව සිත්හි ධාරණය කරගෙන, දේව ආදරය තුළ පවුල් ජීවිතයේ ගැහැට අර්බුද විසඳා ගැනීමට අධිෂ්ඨාන කරගන්න. එසේ පැවතීමට 'එකට යදින පවුල එකට ජීවත් වේ' යන ක්‍රිස්තියානි ඇදහිල්ලේ අත්දැකීම තේරුම් ගෙන දිනපතා දේව ආධාරය පතන්න, සොයන්න. ඔබගේ පවුල ශුද්ධ වු පවුලේ ආදර්ශය ලෙස ගෘහස්ථ සභාවක් කරගන්න. ඔබ එසේ පැවතීම දේව කැමැත්ත වේ.

**නෝබට් එම්. අන්ද්‍රාදි නි.ම.නි**
අනුරාධපුර රදගුරු හිමි

# පමුණුගම අඩදූවෙන් බිහිවු පළමු කිතුනු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී

# ප්‍රියන්ත ජයකොඩි

**පමුණුගම අඹදූවෙන් බිහිවූ පළමු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තුමා (S. S. P) ලෙස පමුණුගම කැපුන්ගොඩ ජන්ම ලාභය ලද ප්‍රියන්ත ජයකොඩි මහතා පත්ව සිටී.**

ශ්‍රී ලංකා පොලිස් සේවයේ එඩිතර කීර්තිමත් නීති ගරුක පොලිස් නිලධාරියෙක්වූ පරලෝ සැපත් පොලිස් අධිකාරී ජෝශප් වින්සන් ජයකොඩි මහතාගේ හා ප්‍රදේශයේ ජනප්‍රිය පාසල් ආචාර්ය තුමියක හා ප්‍රදේශයේ දරු දැරියන් යහමඟ යැවීමට ඇප කැපවූ ශ්‍රේෂ්ඨ දහම් පාසල් ගුරුතුමියක් වූ රොස්ලින් පාරිස් මහත්මියගේ එකම පුතණුවන් වූ ප්‍රියන්ත ජයකොඩි මහතා පොලිස් දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකාවේ අති ජනප්‍රිය කීර්තිමත්, එඩිතර පොලිස් නිලධාරියෙකි.

ස්ථාන භාර පොලිස් පරීක්ෂක වරයෙකු ලෙස රාගම, ත්‍රිකුණාමලය, කලවාන, කොලොන්න, මාරවිල, කඳාන, රත්නපුරය, වෙන්නප්පුව, වව්නියාව හා පෑලියගොඩ විශේෂ විමර්ශන ඒකකයේද රාජකාරි කළ ඔහු, සහකාර පොලිස් අධිකාරීවරයකු ලෙස අනුරාධපුරය හා ත්‍රස්තවාදි විමර්ශන ඒකකයේද, බස්නාහිර පළාත් අපරාධ විමර්ශන කොට්ඨාශයේද රාජකාරියේ නියුක්ත වී ඇත. පොලිස් අධිකාරීවරයකු ලෙස පොලිස් ක්‍රීඩා කොට්ඨාශය භාරව මේ මොහොතේ රාජකාරියේ නියුක්ත වන්නේය.

ඔහු අපරාධ විද්‍යාව පිළිබඳව ශ්‍රී ජයවර්ධන පුර විශ්ව විද්‍යාලයේ ඩිප්ලොමා උපාධියද. අර්බුද නිරාකරණය පිළිබඳව උසස් ඩිප්ලොමා උපාධිය, ශ්‍රී ලංකා බහු ජාතික අධ්‍යාපන ආයතනයෙන්ද මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධිය කොළඹ විශ්ව



විද්‍යාලයෙන්ද මාස්ටර්වේදී ඩිප්ලොමා උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන්ද දිනා ගෙන ඇති අතර නීතිය පිළිබඳ උපාධියටද මේ දිනවල සූදානම් වෙමින් සිටින්නේය. මීට අමතරව ඔහු මීගොමුව කටානේ පිහිටි පොලිස් විද්‍යාපීඨයේ හා කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ බාහිර කතිකාචාර්ය වරයකු ලෙසද කටයුතු කරන්නේය. රාජ්‍ය මූල්‍ය ආයතනයේ සංචාරක කතිකාචාර්ය වරයකු ලෙසද, ජාතික රූපවාහිනි අභ්‍යාස ආයතනයේ අපරාධ පිළිබඳ කතිකාචාර්ය වරයකු ලෙසද වැලිසර පිහිටි ජාතික ස්වසන කටයුතු පිළිබඳ මහ රෝහලේ රෝහල් කමිටුවේ සභාපති ලෙසද කටයුතු කරන්නේය.

සමාජ සේවය හා කිතුනු ආගමික කටයුතු සඳහා ආරක්ෂක හා නීතිමය කටයුතු වලදී සහයෝගය දක්වන ඔහු අභිරහස් අපරාධ සොයාගැනීම පිළිබඳව පොලිස් සේවයේ නමක් දරා සිටින්නෙකි. දිවි පරදුවට තබා අපරාධ කරුවන් හා පාතාල ත්‍රස්තයන් මර්දනය කිරීමට හා නමගිය අපරාධකරුවන් ඇල්ලීමට දක්ෂයකු ලෙසද පොලිස් සේවයේ නමක් දරන්නේය.

ශ්‍රී ලංකාවේ නමගිය අපරාධකරුවකු වන 'වනෂොට්' අල්ලාගැනීම. ලක්ෂ 200 කප්පම් සිද්ධියේ අපරාධකරුවන් අල්ලා ගැනීම. ශ්‍රී ලංකාවේ ලොකුම හෙරොයින් තොගය වූ හෙරොයින් කිලෝග්‍රෑම් 35 ක් ඇල්ලීම ආදී විශාල අපරාධ හා අපරාධ කරුවන් කොටුකර ගැනීම ඔහුගේ දස්කම් හා විස්කම් පොතේ සටහන් වී ඇත්තේය.

ක්‍රීඩා කටයුතු පිළිබඳ හසල දක්ෂයකු හා සංවිධායකයකු වන ඔහු ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයේ නියෝජ්‍ය භාණ්ඩාගාරික වන අතර ඔහු මෙරට හා ජාත්‍යන්තර වෙරළ වොලිබෝල් (බීච් බෝල්) තරග ප්‍රධානියා ලෙසද කටයුතු කරන්නේය.

දරුවන් තිදෙනෙකුගේ දයාබර පියෙකු වන ඔහුගේ ආදරණීය භාර්යාව රාගම ජාතික මහරෝහලේ දන්ත ශෛල්‍ය වෛද්‍ය වරියකවන නිරෝෂනි ජයකොඩි මහත්මියය.

පසුගියදා ශ්‍රී ලංකාවේ ප්‍රදර්ශනය කරන ලද පාදුවාහි ශු. අන්තෝනි මුනිඳුන්ගේ ශුද්ධවූ ධාතු ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකාව පුරාම ආරක්ෂක කටයුතු භාර ප්‍රධානියා ලෙස කටයුතු කළේ ඔහුය. කැපුන්ගොඩ ශාන්ත අන්තෝනි කණිෂ්ඨ විද්‍යාලය, මීගොමුවේ මාරිස්ටෙලා විද්‍යාලය හා කඳානේ දි මැසනොද් විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන ඔහු කිතුනු ආගමික නායකයන් හා සමීප සබඳතාවයකින් පසුවන බැතිබර කිතුනුවෙකි.

**ජෝ. සංගපාලආරච්චි**

## දිව්‍ය සත්ප්‍රසාද රැළිය සහ ප්‍රදර්ශනය 2012 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 02 දක්වා කොළඹ 10 සාන්ත ජෝශප් විද්‍යාලයේ දී

**ප්‍රදර්ශනය -** (1) දේව කැඳවීම් ප්‍රදර්ශනය (සා. ජෝශප් විද්‍යාලයීය ශ්‍රවණාගාරය)

★ පැවදි නිකායන් සහ අගරදගුරු පදවි දෙව්සත්හල් ★ අගරදගුරු පදවියේ අපෝස්තලික සේවා

(2) දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයන්

**දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව :-** විදුහල් දෙව්මැඳුරේ දී - යැදුම් සහ ප්‍රතිචාර සමඟින්

**ගීතිකා ඉදිරිපත් කිරීම –** සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා (1000 කට හඬ උලෙළ)

### අගෝස්තු 31 සිකුරාදා සහ සැප්තැම්බර් 01 සෙනසුරාදා වැඩසටහන

**අගෝස්තු 31 සිකුරාද -** පෙ.ව. 8.00 දිව්‍ය සත්ප්‍රසාද උලෙළ ආරම්භ වේ. දිව්‍ය පූජාව අගරදගුරු පදවි සහයක රදගුරු හිමිපාණෝ (අගරදගුරු පදවි ගීතිකා කණ්ඩායම), පසුව ප්‍රදර්ශනය විවෘත කිරීමේ මහෝත්සවය පැවැත්වේ. පෙ.ව. 9.30 - දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව ඇක්වයිනස් හි පැවදි පුහුණු කංඩායම හා පැවදි නිකායන්හි පුහුණුවන සොයුරියන් විසිනි. පෙ.ව. 10.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව අගරදගුරු වසමේ උත්ථානයේ සමිඳු සංඝයය. පෙ.ව. 11.30 ට දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සමඟ මධ්‍යහ්න යැදුම් ආරම්භ වේ. එය මැද කොළඹ දිසාවේ සැදැහැවතුන් විසින් කැරේ. ප.ව. 12.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව මොරටුව දිසාවේ සැදැහැවතුන් විසිනි. ප.ව. 1.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව අගරදගුරු පදවි ගායනා කණ්ඩායම විසිනි., ප.ව 2.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව උතුරු කොළඹ දිසාවේ සැදැහැවතුන් විසිනි., ප.ව. 3.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව දකුණු කොළඹ දිසාවේ සැදැහැවතුන් විසිනි., ප.ව. 4.30 ට දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව කෝට්ටේ දිසාවේ සැදැහැවතුන් විසිනි. ප.ව. 5.30 සැඳෑ යැදුම් සමඟ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පැවැත්වේ. ප.ව. 6.00 ට ගීතිකා ගායනා විදුහල් දෙව්මැඳුරේ දී අගරදගුරු පදවි ගීතිකා කණ්ඩායම විසිනි.

**සැප්තැම්බර් 01 සෙනසුරාද -** පෙ.ව. 8.00 දිව්‍ය පූජාව ස්වර්ණ ජයන්ති සමරන පියතුමන් විසිනි (පියුරේ කැන්ටොරියේ ඒකාබද්ධ ගායනා කණ්ඩායම), ප්‍රදර්ශනය විවෘත කිරීම, දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පෙ.ව. 9.30 පියුරේ කැන්ටෝරියේ ඒකාබද්ධ ගීතිකා කණ්ඩායම විසිනි., පෙ.ව. 10.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව ගම්පහ සහ ගුරුබැවිල දිසාවන්හි සැදැහැවතුන් විසිනි. පෙ.ව. 11.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සමඟ මධ්‍යහ්න යැදුම් - අගරදගුරු වසමේ ත.ක්‍රි.ශි. ව්‍යාපාරය සහ තරුණ පරපුර විසිනි. ප.ව. 12.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව කළුතර දිසාවේ සැදැහැවතුන් විසිනි. ප.ව. 1.30 - අගරදගුරු වසමේ පවුල් අපෝස්තලික සේවාව මඟිනි., ප.ව. 2.30 මීගමුව දිසාවේ සැදැහැවතුන් විසිනි. ප.ව. 3.30 කටාන දිසාවේ සැදැහැවතුන් විසිනි., ප.ව. 4.30 බෝලවලාන දිසාවේ සැදැහැවතුන් විසිනි. ප.ව. 5.30 සැඳෑ යැදුම් සමඟ දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය පැවැත්වේ. ප.ව. 6.00 ට රෝම ප්‍රසංගය යළි ඉදිරිපත් කිරීම - පියුරි කැන්ටෝරිස්.

**පොදු ප්‍රවාහන සේවා -** දුම්රිය හා බස් සේවා - මීගමුව, මොරටුව, හංවැල්ල හා ගම්පහ දක්වා

### සැප්තැම්බර් 02 ඉරිදා වැඩසටහන

පෙ.ව. 8.00 දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩම කිරීම, උදා යැදුම් - ප්‍රතිචාර, පෙ.ව. 8.30 දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව අගරදගුරු පදවි මරිය හමුදාව විසිනි., පෙ.ව. 9.30 දි.ස.ව. අගරදගුරු පදවි දිව්‍ය හෘදයේ සමිතිය, පෙ.ව. 10.30 දි.ස.ව. රාගම දිසාවේ සැදැහැවතුන් විසිනි., පෙ.ව. 11.30 දි.ස.ව. කඳාන දිසාවේ සැදැහැවතුන් මධ්‍යහ්න යැදුම් ද සමඟ, ප.ව. 12.30 දි.ස.ව. තුඩැල්ල දිසාවේ සැදැහැවතුන්, ප.ව. 1.30 දි.ස.ව. වත්තල දිසාවේ සැදැහැවතුන්, ප.ව. 2.30 දි.ස.ව. නිශ්ශබ්ද වන්දනාව (දිව්‍ය පූජාවට සූදානම් වීම), ප.ව. 3.00 - සා. ජෝශප් විදුහල් චතුරස්‍රයේ දී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් දිව්‍ය පූජාව සිදුකැරේ. ප.ව. 4.15 - දිව්‍ය සත්ප්‍රසාද පෙරහර, ප.ව. 6.15 දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය බේරේ පිටියේ දී, ප.ව. 6.30 - ප.ව. 7.00 1000 කටහඬ ගීතිකා කණ්ඩායම ශුද්ධවූ ගීතිකා ගායනා කරති. ස්තූතියි.

### නවෝදයක්.... 1 පිටුවෙන්

කතිකාවත පිළිබඳව ප්‍රදීපයට අදහස් දක්වමින් "දෙවියන් වහන්සේගේ ආශිර්වාදය තුළ පදවි ජනතාව ආධ්‍යාත්මිකව පුබුදුවා දහම් නවෝදයක් කරා ඔවුන් යොමු කිරීම මෙම ප්‍රයත්නයෙහි අරමුණය"යි හලාවත රදගුරු හිමිපාණෝ සඳහන් කළහ. කතිකාවතට පදවියේ ගරු පියවරුන්, පැවදි සොයුරු සොයුරියන්, මීසම් හා අපෝස්තලික සේවා නියෝජිතයින් ඇතුළු 300 ක පමණ පිරිසක් සහභාගි වෙති. අපේක්ෂිත නවෝදය උදා කරගැනීමට තුඩු දෙන තීරණ රාශියක් මෙහිදී ගැනීමට නියමිතව තිබිණ.

### ඇති හැකි...... 1 පිටුවෙන්

ධර්මදූත සේවා කලාපයේ විවිධ දිසාවන්වල දෙව්මැඳුරු දැනට ප්‍රකාශයට පත් කර ඇති අතර මීසම් සේවක පියතුමන්ට එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා සහකාර ආයකත්වයක් - සබඳතාවක් සඳහා ඇරියුම් කර සිටී. මේ පිළිබඳව අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන්ගෙන් වැඩි විස්තර ලබාගත හැකි බැව් කාදිනල් හිමිපාණෝ පැවසූහ.

දැනට තෝරාගෙන ඇති ස්ථාන මෙසේය. බණ්ඩියාවැල්ල සා. පිලිප්නේරි දෙව්මැඳුර (ගම්පහ), ඉඹුල්ගොඩ ජේසු බිළිඳු දෙව්මැඳුර (මොරගොඩ), වේයන්ගොඩ සා. මිඛායෙල් දෙව්මැඳුර (නිට්ටඹුව), නාකඳපොල සා. තෙරේසා දෙව්මැඳුර (වැලිවේරිය), මීරිගම ජපමාල දෙව්මැඳුර (මීරිගම), පෙතියාගොඩ ශුද්ධවූ පවුලේ දෙව්මැඳුර (කමරාගොඩ), බෝගමුව ලූර්දු මාතා දෙව්මැඳුර (මිරිස්වත්ත), නිල්පනාගොඩ සිරිහඳ දෙව්මැඳුර (බුරුල්ලපිටිය), යන දෙව්මැඳුරු ගම්පහ දිසාවේ පිහිටා ඇත.

වෙල්ගම සා. මරියා දෙව්මැඳුර (හංවැල්ල), කහහේන සා. ජෝශප් දෙව්මැඳුර (වග), කිඹුල්වල වත්ත සා. සෙබස්තියන් දෙව්මැඳුර (තරාල), එල්ස්ටන් වත්තේ ජේසු බිළිඳු දෙව්මැඳුර (අවිස්සාවේල්ල), අංගොඩ සා. සෙබස්තියන් දෙව්මැඳුර (වැලිවිට), යන ඒවා ගුරුබැවිල දිසාවේ පිහිටා ඇත.

කළුතර දිසාවේ හොරණ මාටින් ද පෝරස් දෙව්මැඳුර, මෝපිටිය වත්ත සා. සෙබස්තියන් දෙව්මැඳුර (හොරණ), නෑ බඩ සා. අන්තෝනි දෙව්මැඳුර හා බදුරලිය සිරිහඳ දෙව්මැඳුර (මතුගම), සපුගහවත්ත සා. ජෙරාඩ් මජෙල්ලා දෙව්මැඳුර හා කෙත්හේන සා. ආනා දෙව්මැඳුර (නාගොඩ) යන දෙව්මැඳුරු පිහිටා ඇත.

### අන්තිමට නොරොච්චෝලේ...... 3 පිටුවෙන්

මේ වහින ඇසිඩ් වැස්ස පොළොවට වැටුණාම මොකද වෙන්නේ? පොළොවට උරාගන්නවා. පොළොව දිගේ ගලාගෙන යනවා.

ඒ ඇරෙන්න වෙන වැටෙන්න තැනක් නැනේ. මේ ඇසිඩ් වැස්ස පොළොවට විතරක් නෙවෙයි. කළපුවටත් වැටෙනවා. මුහුදටත් වැටෙනවා. වගාබිමටත් වැටෙනවා. එතකොට අපි කන්නෙ ඇසිඩ් වගාවද? එතකොට අපි බොන්නෙ ඇසිඩ් වතුරද? එතකොට අපි කන්නේ ඇසිඩ් මාළුද? එතකොට අපි නාන්නෙ ඇසිඩ් වතුරද? අපිට මේ වගේ දේවල් ගැන හොඳ අත්දැකීම් තියෙනවා පුත්තලම් දිස්ත්‍රික්කයේ. ඒ තමයි සිමෙන්ති කම්හල. ඒකෙ සිමෙන්ති ඩස්ට් එක, දූමාරය. මේ දූමාරය ගැන පරීක්ෂා කළාම හෙළිවුණා මේ වගේ දෙයක්. ඒ තමයි ගර්භණී අයට, මවුවරුන්ට, පුංචි දරුවන්ට පෙණහලු ආශ්‍රිත, ශ්වසන රෝග ඇතිවෙනවා කියලා. මේ ගැන කරපු පරීක්ෂණවලදී සිමෙන්ති කම්හල් ආශ්‍රිතව ජීවත්වන්නන්ට අනික් ප්‍රදේශවල ජීවත් වන අයට වඩා රෝග වැඩියි කියලා ඔප්පු වෙලා තියෙනවා. ඒ හින්දා අපි මේකට විරුද්ධයි. කරුණාකරලා මේකට සංවර්ධනයේ නාමයෙන් කියන සීල් එක ගහන්න එපා.

මේ ගල්අඟුරු බලාගාරය ගැන කියන ශක්‍යතා වාර්තාව නරක හීනයක්. මේක ජනතාවට කරන සාපයක්.

අනිත් කාරණය තමයි බිම ඉතුරුවෙන අපද්‍රව්‍යය. ඒවා කොහාටද දාන්නේ? මුහුදටද? කළපුවටද? නැත්නම් ආරක්ෂිතව වළදානවද? ඒ දවස් කීයකටද? සතියකටද? මාසයකටද? අවුරුද්දකටද? ඒ කොහේද? මේ වළදාපුවා උඩට වහින්නෙ නැද්ද? ඒ වැස්ස වැටිලා මේවා තෙමුණම ඒ විස පොළොවට උරාගන්නෙ නැද්ද?

මේ මනුෂ්‍යයන්ට මූලික අයිතිවාසිකම් දෙකක් තියෙනවා. ඒ තමයි. වාතය සහ ජලය. කාටවත් බෑ මේවා විනාශ කරන්න. සංවර්ධනයේ නාමයෙන් මේ කතාවල් රජයකට විරුද්ධව කරන කතා නොවෙයි. මේ ජනතාවගේ හඬ. පරිසරයේ හඬ. වාතයේ හඬ. සුළඟේ හඬ.

අපිට පුළුවන් නිවාස ප්‍රශ්න, ඉඩම් ප්‍රශ්න විසඳන්න. නමුත් අපිට පුළුවන්ද සොබාධර්මයේ ප්‍රශ්න විසඳන්න බෑ. ඒක ලොකු බලවේග යක්. අපිට අත තියන්නටවත්, හිතන්නවත් බැරි තරම්.

'අනික් වැදගත් කාරණය මේකයි. මේ ගල්අඟුරු බලාගාරය පූජනීය ස්ථානවලට බලවත් හානියක්.'

මේ පුත්තලමේ තියෙන අම්මතෝට්ටම් කියන පූජනීය ස්ථානයට, තලවිල සාන්ත ආනා දෙව්මැඳුරට, අනුරාධපුරේ ශ්‍රීමහා බෝධියට, මහමෙව්නාවේ සමාධි පිළිමයට.

ඒක වෙන්නේ මෙහෙමයි. වාරකන් කාලෙට වැඩිපුරම දරුණු වෙන්නෙ පුත්තලම් ප්‍රදේශය. ඒ කාලෙට වාරකන් සැරයි. වාරකන් සුළඟ හරි වේගවත්. මේ සුළඟ කෙළින්ම යන්නෙ රජරටට. හැතැප්ම එකසිය විස්සක් විතර දුරට යනවා.

මේ ගල්අඟුරු ඩස්ට් එක ශ්‍රීමහා බෝධීන් වහන්සේට වැදුණාම මොකද වෙන්නේ. උන්වහන්සේ අපවත් වෙන තැනට කටයුතු යෙදේවි. සමාධි බුදු පිළිමයට වැදුණාම මොකද වෙන්නේ? උන්වහන්සේගේ ශරීරය පුරා කළු තිත් ඒවි. මේවා හොඳ වැඩද? මේකද සංවර්ධනය.

ඊළඟ කාරණය වෙන්නේ ජැටිය.

මේ මුහුද වාරකන් කාලෙට රැල්ල නගිනවා උඩට. හුඟාක් උඩට. ඒ අය කිව්වෙ මුහුදෙන් - නැවෙන් ගල් අඟුරු ගේනව කියලා. නමුත් ඒකත් ප්‍රශ්නයක්. නැවෙන් ගෙනාවට ගොඩබිම කිට්ටුවටම නැවට එන්න බැහැ ගල්පර තියෙන හින්දා.

එතකොට ඈත මුහුදේ නවත්වන්න ඕන. ඒ වගේම තමයි මෙතන තියෙනවා කන්දක් වගේ එකක්. හැබැයි ඒක යටින් හැරිලා. මේකෙ නැව් හැප්පිලා තියෙනවා ඒ කාලේ. ගිලාබැස්සොත් බැස්සාමයි. පතුලටම යනවා. හරියට පාතාලයක් වගේ.

මේ හින්ද ජැටියක් හදන්න කියලා ශක්‍යතා වාර්තාවේ නිර්දේශ කරලා තියෙනවා. නිර්දේශය විදියට ගොඩබිම් ඉඳලා කිලෝ මීටර් හතරයි. දශම දෙකක් දුරට ජැටිය හදන්න ඕනා. එතකොට මේ හදන ජැටියෙ කණු මූදු පතුලට බස්සන්න ඕන. සමහර තැන්වල ගල් ඇතුළට විදින්න ඕන. සමහර තැන්වල ගල අහුවෙනකම් පතුල හාරන්න ඕන. මේ කණු ඉතා ශක්තිමත් වෙන්න ඕන. මේක ටොන් ගානක් ගල්අඟුරු එක දිගට ජැටිය හරහා යන හින්දා.

එතෙන්දි තවත් ප්‍රශ්නයක් ආවා. ඒ ජැටියට ගල්අඟුරු බාන විදිය. ඒකට යෙදුව පිළියම තමයි නැවෙන් බාජ් එකට බාලා ඒකෙන් ජැටියට ගේනවා එතැනදී ජැටියෙන් ගල්අඟුරු ප්‍රවාහනය කරන්න හදලා තිබුණෙ විශාල ශක්තිමත් බෙල්ට් එකක් දිගේ යවන්න. ඒ කියන්නෙ කිලෝ මීටර් හතරයි දශම දෙකක් දුරට ගල්අඟුරු බෙල්ට් එක දිගේ යනවා කර්මාන්ත ශාලාවට. නමුත් මේක ප්‍රායෝගික වුණේ නෑ.

නැවෙන් මේ ගල්අඟුරු ගේන්නේ කිරිපිටි පැකට් වගේ තොගේ පැක් කරලා. සීල් කරලා නොවෙයි. එහෙම ගේන ඒවා බෙල්ට් එකට දාන්නෙත් ඒ විදියට එතකොට කිලෝ මීටර් හතරයි දශම දෙකක් දුරට මේ ගල්අඟුරු බෙල්ට් එක දිගේ යන්නෙ විවෘතව මේ යන ගණන ටොන් ගාණක්. මේක හුළඟට විවෘත වෙන්නෙ නැද්ද? පරිසරයට ඩස්ට් එක වදින්නෙ නැද්ද? වැටෙන ගල්අඟුරු මුහුදට යන්නෙ නැද්ද? අනිත් එක බෙල්ට් එකට ගල්අඟුරු පටවන්නෙ කොහොමද? බාජ්වලින්. මේ බාජ්වලට මේ සැර මූදෙදී ගල්අඟුරු පටවන්න පුළුවන්ද? මේවා තාක්ෂණික ප්‍රශ්න.

එතකොට මෙතෙන්දී මේගොල්ල තීරණයක් ගත්තා මෙහෙම. ජැටිය වෙනුවට වරායක් හදන්න. ඒක නිර්දේශ කළා. ඒ වරායට බාජ්වලින් ගෙනත් ගල්අඟුරු බාන්න.

මේ නිර්දේශය වුණේ පුංචි වරායක්. ඊට පස්සෙ ප්‍රශ්නය වුණේ වරාය හදන තැන ගැනයි. මේ කල්පිටිය අර්ධද්වීපය හරියට ඉස්සෙක් වගේ දිගයි. පටුයි. එතකොට එතන වරායක් හදනවා නම් මුහුදට වෙන්න හදන්න ඕන. නමුත් මේ ගල්පර්වත අස්සෙ ඒක කරන්න බැහැ. ඊට පස්සේ නිර්දේශ වුණේ අර්ධද්වීපයෙ ඇතුළෙ හදන්න. එතකොට ගොඩබිම තවත් පටු වෙනවා. ඒ හින්දා ඒකත් හරි ගියේ නෑ. අන්තිමට ඉතුරු වුණේ අර්ධද්වීපය මැදින් හදන එක. එතකොට අර්ධද්වීපය කෑලි දෙකකට කැඩෙනවා. වෙන් වෙනවා. ඒකත් ප්‍රශ්නයක්.

මේ ගැන සාකච්ඡා කරන්න කොමිසමක් පත්කළ යුතුයි. ඒ කොමිසම කොළඹට නෙවෙයි. වයඹට. පුත්තලමට. ඒකයි හරි ක්‍රමය. ඒ කොමිසමේ මේක සාකච්ඡා කරන්න ඕන ඒකට. මෙහාට එන්න. හැබැයි දේශපාලන මල්මාලා පෙරහරවලින් නෙවෙයි.

මෙතන තාක්ෂණයයි වැරැදි. තාක්ෂණය කරන අය නෙවෙයි. දැන් මේ මැෂින් ගේනවා. ගේන්නෙ චීනෙන්. කලින් කිව්වා ජපානෙන් කියලා. හරි කමක් නෑ. මේ චීනෙන් ගෙන්වන මැෂින්වල තියෙන වගකීම මොකක්ද? තත්ත්වයෙන් ඉහළ බවට. මේ ලැබෙන මැෂින් මේ වගේ ශුෂ්ක, ලවණ ප්‍රදේශවලට සුදුසු ඒවාද? ඒවායේ ප්‍රමිතිය ඉහළ ද? කව්ද මේකෙ නඩත්තු කටයුතු කරන්නේ. චීන්නුද? ලංකාවේ අයද? නැත්නම් මේ කොන්ත්‍රාත්තු බාරගත්තු අයද? ඒ අයට තියෙන සුදුසුකම් මොනවාද? ඒ අය ලංකාවේ තාක්ෂණ ශිල්පීන් පුහුණු කරනවාද? චීන සමාගම මේක නඩත්තු කරන්නෙ දිගටමද? නැත්නම් එක්තරා කාලයකටද? ඒ කාලය කුමක්ද? අමතර කොටස් මොනවාද? ඒවා තියෙනවාද? පටන්ගන්නකොටම යම් යම් අමතර කොටස් ගබඩා කරනවාද?

මේ ප්‍රශ්න අපි ඇහුවා. නමුත් ඒකට උත්තර ලැබුණෙ නෑ.

මේ තත්ත්වයන් යටතේ එක් දෙයක් පැහැදිලියි. මේක මේ දෙන තාක්ෂණය ක්‍රියාත්මක කරන්න කරන වැඩක් කියන එකයි. ඒ ඇරෙන්න වෙන දෙයක් නෑ. ඒ නිසා පවත්වාගෙන යන්න බෑ. පවත්වාගෙන ගියත් වැඩක් නෑ. මේ මෙහෙම යනකොට කැඩේවි. ඊළඟට හදාවි. ආයිත් කැඩේවි. අන්තිමට ගිනි ගනීවි.

මේ බලාගාරයට සහයෝගය දක්වන විශේෂඥයො කියන දෙයක් තමයි. රට තුළ ඉතාමත් අඩු මිල ගණන්වලට වයඹට විදුලිය දෙන්න පුළුවන් කියලා. නමුත් ඒක වෙන්නෙ නෑ. ඒක කරන්නෙ කොහොමද? දුවන්නෙ නැති තාප බලාගාරයකින්. දුන්නත් වෙන්නේ මෙච්චරයි. වයඹ විදුලිය වෙන පළාත්වලට යාවි. ඒක තමයි ඇත්ත. ඒ එක්කම තවත් ඇත්තක් තියෙනවා. අපේ දරුවන්ට බඩේ අමාරු හැදේවි, කහපාට දත් ඒවි, ගැනුන්ට දරු උපත් අඩු වේවි. මෙතෙන්දී තව දෙයක් තියනවා. චීනෙන් ගල්අඟුරු ලාබෙට ලැබෙනවලු. නමුත් ඒක බොරුවක් ඒකෙ ඇත්ත මේකයි.

මේ ගල්අඟුරු බලාගාර දැන් ප්‍රතික්ෂේප වේගෙන යනවා. ඒ හින්දා ඒවා ඉවත් කරනවා. විශේෂයෙන්ම චීනයේ ගෙන්දගම් වැඩිපුර තියෙනවා. ඒත් ඒවා කවුරුවත් ගන්නෙ නෑ. ඉතින් ඒවා ඉතුරුයි. දැන් ඒවා ඉවත් කරන්න ඕන. ඒ කියන්නෙ විකුණග න්න ඕන. ඉතින් මේ හින්දා තමයි මේ කරුණාව. ගන්න අයට අඩුවෙන් දෙනවා. ඒ මදිවට තව ණයත් දෙනවා යන්ත්‍රසූත්‍රත් දෙනවා. ඉදිකිරීම් කරලත් දෙනවා. පරිපාලනය කරලත් දෙනවා. කාර්මිකයන් පුහුණුත් කරනවා.

ඉතින් ලංකාව මෙහෙම හිතනවා.

මේක කොච්චර හොඳ දෙයක්ද. හැම දෙයක්ම අපිට ලැබෙනවා. දැන් තියෙන්නෙ විදුලිය නිපදවන එක විතරයි.

නමුත් අපිට අහන්න දෙයක් තියෙනවා.

ආණ්ඩුව මේ ගල්අඟුරු අරන් වැඩිපුර ගෙන්දගම් ගන්නවද? ඇයි මේ ලෝකේ ප්‍රතික්ෂේපකරන දේවල් අපි බදාගන්නේ. මේවා ගැන හෙව්වා බැලුවද? අධ්‍යයනය කළාද? පරීක්ෂණ කළාද?

මොකක්ද මේ අස්සන් කළ ගිවිසුම?

මේ ගිවිසුමේ තියෙනවා මෙහෙම දෙයක්.

චීනෙන් යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය, සල්ලි, ඉඩම්, දූෂණය, බිඳවැටීම, අවම මිනිස් ශ්‍රමය අපෙන්. චීන ජාතිකයන් තමයි ගල්අඟුරු බලාගාරය හදන්නේ. ඒකට චීන ඉන්ජිනේරුවෝ, කම්කරුවෝ එනවා. චිනෙන් අපිට සල්ලි දෙනවා. ඒ සල්ලිවලින් අපි චීන ඉන්ජිනේරුවන්ට පඩි ගෙවනවා. චීන කම්කරුවන්ට පඩි ගෙවනවා. චීන බඩුවලට සල්ලි ගෙවනවා. යන්ත්‍ර සූත්‍ර උපකරණවලට සල්ලි ගෙවනවා. සුබසාධනයට වියදම් කරනවා. ඒ ඔක්කොම කරලා අන්තිමට චීනෙන් ගත්තු ණයට පොලියත් ගෙවනවා. ඒ සල්ලිත් ආපසු දෙනවා. එතකොට දැන් මොකක්ද අපිට තියෙන ලාබෙ. අඩුගානෙ විදුලියවත් ලැබෙනවා නම්. ඒකත් නැහැ. ගලවලා අලුත්වැඩියා කරලා ගෙනල්ලා හයිකරන යන්ත්‍ර සූත්‍රවලින් කොහොමද විදුලිය නිපදවන්නේ. එහෙම වෙනකොට අපිට ඉතුරු වෙන්නෙ මොනවද?

ඇසිඩ් වැස්සක්. ගෙන්දගම්, විසවායු, හැම තිස්සෙම කැඩෙන බිඳෙන යන්ත්‍ර සූත්‍ර. ගිනිගන්නා මැෂින්.

මේ ගල්අඟුරු බලාගාරය චීන්නු ලංකාවට ගෙනාවෙ ඇලඩින්ගේ පුදුම පහන වගේ කියලයි.

### අපට රජෙක් ..... 5 පිටුවෙන්

ජනතාවගේ ඡන්ද අපේක්ෂාවෙන් බලවත්හු මේ රටේ භාරකරුවා වීමට සහන මලු උඩු ගුවනේ විසි කරති. ඒවා පොළොවට වැටෙන විට භාරකරුවා රජ වී ඇත. මලු ටික රාජ සන්තක කර බලය තර කර ගනී. රජතුමා සිංහාසනයේ සිට ඊළඟ පරම්පරාවට සිය උරුමය භාර දීමට පිඹුරුපත් සකසයි. මෙවැනි ක්‍රියාවන් සිදු නොවන එකම රාජ්‍ය දේව රාජ්‍යයි. ක්‍රිස්තුන් වහන්සේ පොළොව මතට යළි පැමිණීමෙන් පසු මෙම රාජ්‍ය ස්ථාපිත වනු ඇත. අපගේ දෙඅත් ඔසවා ඔබගේ රාජ්‍යය පැමිණේවා යනුවෙන් සිදු කරන යාච්ඤා වලට පිළිතුරු ලැබෙන කාලය වැඩි ඈතක නොවේ. ඒ සඳහා ගැඹුරින් යාච්ඤා කළ යුතුව ඇත.